VERITÉ RESEARCH
Strategic Analysis for Asia

# ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ
# අයවැයකරණය
## ප්‍රධාන කාර්ය සාධන දර්ශක ඇගයීම

2022 ජුනි



# ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය: ප්‍රධාන කාර්ය සාධන දර්ශක ඇගයීම

2022 ජුනි

මෙම අධ්‍යයනය වෙරිටේ රිසර්ච් ආයතනයේ යැස්මින් රාජී සහ ධරිනි සමරසිංහ ඇතුළත් වන ආර්ථික විද්‍යා කණ්ඩායම විසින් සම්පාදනය කරන ලද්දකි. සමලි ජිනදාස සහ අවන්ති සෙනෙවිරත්න පර්යේෂණ සහය ලබා දුන්හ. පර්යේෂණය සඳහා සමස්ත මග පෙන්වීම, අනතර්ගතය සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය නිශාන් ද මෙල්, දෙශාල් ද මෙල් සහ නිලංගිකා ප්‍රනාන්දු විසින් සිදු කරන ලදි. භාෂා සංසකරණය මදාරා රන්මුතුගල විසින් ද සැකසුම වීඩ්‍රියන් මාකස් විසින් ද සිදු කරන ලදි.

රාජී, යැස්මින්
ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූලවූ අයවැයකරණය: ප්‍රධාන කාර්ය සාධන දර්ශක ඇගයීම / යැස්මින් රාජී සහ ධරිනි සමරසිංහ; සංස්කරණය දෙශාල් ද මෙල් සහ නිලංගිකා ප්‍රනාන්දු විසිනි. - කොළඹ: වෙරිටේ රිසර්ච්. 2022.
පි. 67; සෙමී. 26.

ISBN 978-624-5514-26-7

| | |
|---|---|
| i. 339.523 ඩීවී 23 | ii. රාජී, යැස්මින් |
| iii. සමරසිංහ, ධරිනි (සම කර්තෘ) | iv. ද මෙල්, දෙශාල් (සංස්.) |
| v. ප්‍රනාන්දු, නිලංගිකා (සංස්.) | vi. ග්‍රන්ථ නාමය |

1. අයවැය- ශ්‍රී ලංකාව
2. රාජ්‍ය මූල්‍ය

නිර්දේශිත උපුටා දැක්වීම: Verité Research (2022). ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය: ප්‍රධාන කාර්ය සාධන දර්ශක ඇගයීම. කොළඹ. වෙරිටේ රිසර්ච්

මූල පද: ස්ත්‍රී පුරුෂ සමාජභාවී අයවැයකරණය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත් බව, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආර්ථික විද්‍යාව

අනෙකුත් පර්යේෂණ වාර්තා පහත සබැඳිය ඔස්සේ බාගත කළ හැක: https://www.veriteresearch.org/publication_type/research-reports/

ඔබගේ අදහස් විද්‍යුත් තැපෑලෙන් යොමු කරන්න: publications@veriteresearch.org

ප්‍රකාශන හිමිකම © 2022 Verité Research Pvt Ltd. සියලුම හිමිකම් ඇවිරිණි.

# පටුන


**හැඳින්වීම** **4**

**ඇගයීම් ක්‍රමවේදය** **7**

දත්ත එක් රැස් කිරීම 7

ප්‍රගති සාරාංශය 8

**ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය ඇගයීමේදී මතු වූ අභියෝග** **16**

පැහැදිලි ක්‍රියාත්මක කිරීමේ රාමුවක් නොමැති වීම 16

රජයේ අමාත්‍යාංශවල හීන වූ වගවීම 16

අධීක්ෂණය සිදු කරන අමාත්‍යාංශ වෙතින් නව තොරතුරු නොලැබීම 17

දුර්වල අනාවරණය 17

තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ ගොනු කරන ලද ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීමේ ප්‍රමාදයන් සහ ප්‍රතික්ෂේප කිරීම් 17

අමාත්‍ය මණ්ඩල වෙනස් කිරීම හේතුවෙන් ඇතිවන අකාර්යක්ෂමතාව 18

**ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය: ඉදිරි ගමන් මග** **19**

**නිගමනය** **22**

**ඇමුණුම්** **23**

ඇමුණුම 1: තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත යටතේ ගොනු කරන ලද තොරතුරු ඉල්ලීම් පිළිබඳ විස්තර 23

ඇමුණුම 2: ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල විස්තරාත්මක විශ්ලේෂණය

ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 1: ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්ව ප්‍රතිශතයේ වැඩිවීම 32

ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 2: මූල්‍යාධාර වැඩසටහන් මගින් නිවාස ඉදිකර ඇති ස්ත්‍රී මූලික කුටුම්භයන් සංඛ්‍යාවේ වැඩි වීම 35

ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 3: ස්ත්‍රී පුරුෂභාවය මත පදනම්ව වෙන වෙන් දත්ත ලබාගත හැකි දත්ත පද්ධති පවත්වාගෙන යනු ලබන රාජ්‍ය ආයතන සංඛ්‍යාව 37

ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 4: ජාතික වෘත්තීය පුහුණු සහතිකය (NVQ) ලබාගෙන කාර්මික සහ වෘත්තිමය ක්ෂේත්‍රයන්හි රැකියා සඳහා අවතීර්ණ වන කාන්තාවන්ගේ ප්‍රතිශතය ඉහළ යාම 38

ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 5: සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය/ සහනාධාර භාවිතා කරමින් තිරසර ව්‍යාපාරයන්හි නිරත වන කාන්තා ව්‍යවසායකයින් සංඛ්‍යාව 41

ප්‍රධාන කාර්ය සාධන දර්ශක 6: ආපසු පැමිණි හා විදෙස්ගත වීමට නියමිත කාන්තාවන් ඉලක්ක කරගත් ජාතික ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති සංඛ්‍යාව 43

ප්‍රධාන කාර්ය සාධන දර්ශක 7: ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හරහා ලබාගත්ල තීරණ ගැනීමේ තනතුරු හොබවන කාන්තාවන්ගේ සංඛ්‍යාව ඉහළ යාම 45

ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 8: ස්ත්‍රී පුරුෂභාවය අනුව හිතකර රැකියා පරිසරයක් සහ දිවා සුරැකුම් පහසුකම් ආදිය වැඩිදියුණු කිරීම සඳහා පියවර ගෙන ඇති ආයතන සංඛ්‍යාව 48

ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 9: ආපදා අවස්ථාවල දී මුදවා ගැනීම, සහන සැලසීම, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණය යන පියවරයන්හිදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අවධානය යොමු කිරීම සහතික වීම සඳහා ස්ථාපනය කර ඇති සහ ඵලදායි ලෙස ක්‍රියාවට නංවා ඇති ප්‍රතිපත්තීන් සහ මාර්ගෝපදේශ සංඛ්‍යාව 50

ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 10: කාන්තාවන් හා ළමුන් සම්බන්ධයෙන් වන ගැටළු සංවේදී සහ ඵලදායි අයුරින් හැසිරවීම සඳහා පුහුණු කර ඇති, පොලිස් ස්ථාන තුළ පිහිටි කාන්තා හා ළමා කාර්යාංශ සංඛ්‍යාව 51

ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 11: සංශෝධනය කර ඇති, පනවා ඇති සහ/හෝ ක්‍රියාවට නංවා ඇති□ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බනධයෙන් සිදු වන වෙනස් කොට සැලකීම් සඳහා අදාළ වන නීති, ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි සංඛ්‍යාව 53

ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 12: ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට විසඳුම් ලබා දීම සඳහා වූ බහු ආංශික ජාතික ක්‍රියාකාරී සලැස්ම අනුපූරණය කිරීම සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය 55

ඇමුණුම 3 58

ඇමුණුම 4 62

ඇමුණුම 5 63

ඇමුණුම 6 64

**පරිච්ඡේදාන්ත සටහන් 65**

# හැඳින්වීම

රජයක ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේලා අයවැය ප්‍රධාන උපකරණයක් ලෙස සැලකිය හැකි අතර එය රජයක දේශපාලනික සහ සමාජ ප්‍රතිපත්ති ප්‍රමුඛතා පිළිඹිබු කරන්නක් ද වෙයි. එහි ප්‍රතිඵලයක් ලෙස, අයවැය දේශපාලනිකව 'මධ්‍යස්ථ' නොවන අතරම ස්ත්‍රී පුරුෂ සමාජභාවය ආශ්‍රිතව ද මධ්‍යස්ථභාවයකින් යුක්ත නොවේ. වියදම් රටාවන් සහ මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම් ස්ත්‍රී පුරුෂ පාර්ශ්වයන් මත ඇති කරන්නා වූ බලපෑම එකිනෙකට වෙනස් වන බව ආනුභාවික සාක්ෂි මගින් අනාවරණය වී ඇත.[1] ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය (GRB) යනු අයවැය වර්ෂයක් තුළ පසු කරන සෑම අදියරයකදීම ස්ත්‍රී පුරුෂ සමාජභාවය ආශ්‍රිත අංග සම්බන්ධ කිරීමට සැලසුම් කරන ක්‍රියාවලියකි. පුරුෂයින්ට සහ කාන්තාවන්ට සමප්‍රතිලාභ සහතික කරන නීති සම්පාදනය, ප්‍රතිපත්ති සහ වැඩසටහන් ද ඇතුළුව සැලසුම් කර ඇති යම් වියදම් හෝ ක්‍රියාමාර්ග කාන්තා පුරුෂ දෙපාර්ශවයටම බලපාන අයුරු තක්සේරු කිරීම සඳහා අනුගමනය කරන ක්‍රියාවලිය මින් අදහස් කරනු ලබයි.[2]

ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය මීට වසර 30 ට ආසන්න කාලයකට පෙර මුල් වරට හඳුන්වා දෙනු ලැබූ අතර එතැන් සිට රටවල් ගණනාවක් ඒ ආශ්‍රිත ක්‍රියාපටිපාටීන් භාවිතයට ගෙන ඇත. රජයේ වියපැහැදම් මගින් කාන්තාවන්ට අත්වන ප්‍රතිලාභය ඇගයීමටත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාවයට දායක වන අයුරින් අයවැය සැකසීමටත් 1995 දී 'බීජිං ප්ලැට්ෆෝර්ම් ෆොර් ඇක්ෂන්' හිදී (Beijing Platform for Action, බීජිං ක්‍රියාකාරී වේදිකාව) එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සියලු රජයන් වෙතින් ඉල්ලීමක් කරන ලද අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය හා සබැඳි ක්‍රියාවලීන් වෙත යොමු විය යුතු බවට වූ මතය ඉන් පසු කෙමෙන් වර්ධනය වන්නට විය.[3] ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය අනුගමනය කිරීම තුළින් මූලික ක්ෂේත්‍රයන්හි (එනම්, පාසල්වලට සිසුන් ඇතුළත් කිරීම සහ සෞඛ්‍ය සේවය) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති වෙනස් කිරීමට හැකි වීම සහ ආර්ථික හා දේශපාලන ක්ෂේත්‍රයන් තුළ කාන්තා සහභාගිත්වය ඉහළ නැංවීමට හැකි වීම ආදි වූ සාර්ථක ප්‍රතිඵල අත්කරගත් සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා නිදසුන් දෙකක් ලෙස රුවන්ඩාව සහ ඉතියෝපියාව දැක්විය හැක.[3] ප්‍රමාණවත් පරිදි අරමුදල් ලැබීම, ක්‍රියාවට නැංවීමේ පියවර සාර්ථකව ඉටු කිරීම, පසු විපරම සහ සියලුම ප්‍රතිඵල මනාව අධීක්ෂණය කිරීම යන සාධක හතර රුවන්ඩාවට ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය ක්‍රියාත්මක කිරීමෙහිලා උපකාරී වූ වැදගත්ම සාධකයන් විය.[4]

ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය ප්‍රධාන ධාරාවේ ක්‍රියාවලියක් ලෙස ඉදිරියට ගෙන ඒම සඳහා ශ්‍රී ලංකාව විසින් ගෙන ඇති උත්සාහයන් තවමත් ආරම්භක අදියරේ පවතී. ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය ශ්‍රී ලංකාව තුළ ප්‍රවර්ධනය කිරීමට මෑතකාලීනව ගන්නා ලද ප්‍රයත්නයක් ලෙස 2018 දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රධාන කාර්ය සාධන දර්ශක හඳුන්වා දීම සහ සැකසීම සැලකිය හැක. 2018 වර්ෂය සඳහා අයවැය කැඳවීමේදී මුදල් අමාත්‍යාංශයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් 2017 - 2019 දක්වා වූ මධ්‍ය කාලීන අයවැය රාමුව යටතේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය ක්‍රියාවට නැංවීම උදෙසා මූලික පියවර කිහිපයක් හඳුන්වා දෙන ලදි. ඒ අනුව, අයවැය ඇස්තමේන්තු සැකසීමේදී සියලුම කැබිනට් අමාත්‍යාංශ, රාජ්‍ය අමාත්‍යාංශය සහ පළාත් සභා විසින් සැලකිල්ලට ගත යුතු ප්‍රධාන කාර්ය සාධන දර්ශක 12 ක් කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය[5] විසින් සකසන ලදි (අංක 1 ප්‍රදර්ශිතය බලන්න). මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශක, එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) අතුරින් පස්වන ඉලක්කය[6] වන කාන්තාවන් සහ ගැහැණු දරුවන් සවිබල ගැන්වීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව යන ඉලක්කයට අනුරූපීව සැලසුම් කරන ලදි. එමෙන්ම, 2019 සිට 2021 දක්වා වූ මධ්‍ය කාලීන රාජ්‍ය මූලය රාමුව යටතේ කාර්ය සාධන දර්ශක 12 පිළිබඳ තම ප්‍රගතිය

ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලෙසට 2019/2 දරන අයවැය චක්‍රලේඛය (මුදල් අමාත්‍යාංශයෙන් නිකුත් කරන ලද) මගින් සියලු අමාත්‍යාංශයන් හට නියම කෙරේ. එබැවින්, 2020 සහ 2021 අයවැය සකස් කිරීමේදී ද ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය පිළිබඳ ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන යාමට සැලසුම් කර තිබූ බව මින් පැහැදිලි වේ.

සියලුම අමාත්‍යාංශ සහ පළාත් සභා මෙම ප්‍රධාන කාර්ය සාධක දර්ශකවල ප්‍රගතිය ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු විය. මීට අමතරව, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ කේන්ද්‍රීය ඒකක ස්ථාපිත කරන ලෙස ද ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන් වෙන්ව තබන ලද දත්ත සමුදායන් සහ තොරතුරු පද්ධති කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලෙස ද මෙම රාජ්‍ය ආයතන වෙතින් ඉල්ලා සිටින ලදි.

අයවැය කැඳවීම තුළ දක්වා තිබූ අයුරින් ප්‍රධාන කාර්ය සාධන දර්ශක සාක්ෂාත් කරගැනීම සැලකීමේදී ශ්‍රී ලංකාව දුර්වල මට්ටමක සිටී. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රධාන කාර්ය සාධන දර්ශක ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඇගයීමේදී, අමාත්‍යාංශවලින් සියයට 83 ක් මේ සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් නොපෙන්වූ බවත් අමාත්‍යාංශවලින් සියයට 17 ක් ඒ සම්බන්ධයෙන් දුර්වල ප්‍රගතියක් පෙන්වූ බවත් ඒ පිළිබඳව වෙරිටේ ආයතනය විසින් 2021 දී පළ කරන ලද වාර්තාව මගින් පෙන්වා දෙයි. මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශක අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය තුළ පැවති යම් සීමාවන් හේතුවෙන් ඒ සම්බන්ධයෙන් අර්ථාන්විත ප්‍රගතියක් ලබා ගැනීමට නොහැකි වූ අතර එකී සීමාවන් පිළිබඳ විස්තර එම වාර්තාව මගින් ඉස්මතු කරන ලදි.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන විසින් සපයන ලද තොරතුරු මත පදනම්ව මෙම එක් එක් ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ලබා ඇති ප්‍රගතිය වෙරිටේ ආයතනය විසින් අඛණ්ඩව ඇගයීමට ලක් කරන ලදි. 2019 සහ 2020 වර්ෂයන් තුළ මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශක ලැබූ ප්‍රගතිය පිළිබඳ සිදු කරන ලද ඇගයීම් සංසන්දනය කිරීම මෙම වාර්තාවේ ප්‍රධාන අරමුණ වේ. එමෙන්ම, රජය විසින් මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශක පිළිබඳ තොරතුරු ලේඛනගත කිරීමේදීත් අධීක්ෂණය කිරීමේදීත් අනුගමනය කරන ක්‍රියාවලීන් තුළ පවතින ප්‍රධාන ගැටළු සහ පරතරයන් ද මෙම වාර්තාව මගින් අවධාරණය කර ඇත (එමෙන්ම, ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීමට ද මෙම වාර්තාව උත්සාහ දරනු ඇත).

**ප්‍රදර්ශිතය 1: කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය විසින් සකසන ලද ප්‍රධාන කාර්ය සාධන දර්ශක**

| ප්‍රධාන කාර්ය සාධන දර්ශක | මාතෘකාව |
|---|---|
| 1 | ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්ව ප්‍රතිශතයේ වැඩිවීම |
| 2 | මූල්‍යාධාර වැඩසටහන් මගින් නිවාස ඉදිකර ඇති ස්ත්‍රී මූලික කුටුම්භයන් සංඛ්‍යාවේ වැඩි වීම |
| 3 | ස්ත්‍රී පුරුෂභාවය මත පදනම්ව වෙන වෙන් දත්ත ලබාගත හැකි දත්ත පද්ධති පවත්වාගෙන යනු ලබන රාජ්‍ය ආයතන සංඛ්‍යාව |
| 4 | ජාතික වෘත්තීය පුහුණු සහතිකය (NVQ) ලබාගෙන කාර්මික සහ වෘත්තිමය ක්ෂේත්‍රයන්හි රැකියා සඳහා අවතීර්ණ වන කාන්තාවන්ගේ ප්‍රතිශතය ඉහළ යාම |
| 5 | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය/ සහනාධාර භාවිතා කරමින් තිරසර ව්‍යාපාරයන්හි නිරත වන කාන්තා ව්‍යවසායකයින් සංඛ්‍යාව |
| 6 | ආපසු පැමිණි හා විදෙස්ගත වීමට නියමිත කාන්තාවන් ඉලක්ක කරගත් ජාතික ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති සංඛ්‍යාව |
| 7 | ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හරහා ලබාගත්, තීරණ ගැනීමේ තනතුරු හොබවන කාන්තාවන්ගේ සංඛ්‍යාව ඉහළ යාම |
| 8 | ස්ත්‍රී පුරුෂභාවය අනුව හිතකර රැකියා පරිසරයක් සහ දිවා සුරැකුම් පහසුකම් ආදිය වැඩිදියුණු කිරීම සඳහා පියවර ගෙන ඇති ආයතන සංඛ්‍යාව |
| 9 | ආපදා අවස්ථාවල දී මුදවා ගැනීම, සහන සැලසීම, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණය යන පියවරයන්හිදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අවධානය යොමු කිරීම සහතික වීම සඳහා ස්ථාපනය කර ඇති සහ ඵලදායි ලෙස ක්‍රියාවට නංවා ඇති ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සංඛ්‍යාව |
| 10 | කාන්තාවන් හා ළමුන් සම්බන්ධයෙන් වන ගැටළු සංවේදී සහ ඵලදායි අයුරින් හැසිරවීම සඳහා පුහුණු කර ඇති, පොලිස් ස්ථාන තුළි පිහිටි කාන්තා හා ළමා කාර්යාංශ සංඛ්‍යාව |
| 11 | සංශෝධනය කර ඇති, පනවා ඇති සහ/හෝ ක්‍රියාවට නංවා ඇති, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බනධයෙන් සිදු වන වෙනස් කොට සැලකීම් සඳහා අදාළ වන නීති, ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි සංඛ්‍යාව |
| 12 | ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට විසඳුම් ලබා දීම සඳහා වූ බහු ආංශික ජාතික ක්‍රියාකාරී සලැස්ම අනුපූරණය කිරීම සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය |

# ඇගයීම් ක්‍රමවේදය

## දත්ත එක් රැස් කිරීම

ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු එක් රැස් කිරීම සඳහා වෙරිටේ ආයතනය විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ලබාගැනීම සඳහා අදාළ රජයේ ආයතන වෙත තොරතුරු ලබාගැනීම සඳහා ඉල්ලීම් ගණනාවක් ඉදිරිපත් කරන ලදි. මෙම ආයතනවල සවිස්තරාත්මක ලැයිස්තුවක් සහ එම ඉල්ලීම්වලට අදාළ තොරතුරු වර්ගය දැනගැනීම සඳහා ඇමුණුම 1 බලන්න.

තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ ගොනු කරන ලද ඉල්ලීම්වලට අමතරව ප්‍රධාන කාර්ය සාධන දර්ශක ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාක්ෂි ලබා ගැනීම සඳහා වෙරිටේ රිසර්ච් ආයතනය විසින් අන්තර්ජාල සෙවුම් ද සිදු කරන ලදි. මෙම වාර්තාව මගින් 2019 සිට 2020 දක්වා කාලය තුළ ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය ඇගයීමට ලක් කෙරේ. දෙවන වර්ෂය සඳහා වන ඇගයීමට අදාළ දත්ත එක් රැස් කිරීම 2021 ඔක්තෝබර් මස සිට ඇරඹි බැවින් 2021 වසර සඳහා වන ප්‍රගතිය මෙම ඇගයීමට ඇතුළත් කර නොමැත.

### A. ඇගයීම් ක්‍රමය

ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය ඇගයීමේදී එක් එක් දර්ශකය අයත් වර්ගය ඒ සඳහා පදනම් කර ගන්නා ලදි.

ව්‍යවස්ථාදායකමය, නියාමනික හෝ ප්‍රතිපත්ති ආශ්‍රිත ප්‍රධාන කාර්ය සාධන දර්ශක (එනම්, ප්‍රධාන කාර්ය සාධන දර්ශක 6,9, සහ 11) පහත ප්‍රවර්ගයන් හතර මත පදනම්ව ඇගයීමට ලක් කරන ලදි:

- තොරතුරු අනාවරණය කර නොමැත: අන්තර්ජාල සෙවීම් තුළින් ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු කිසිවක් හමු නොවූ අතර ඇගයීම් කණ්ඩායම නිරන්තරව අමාත්‍යාංශයීය තොරතුරු නිලධාරීන් සමඟ පසුවිපරම් කළ ද තොරතුරු ලබා ගැනීම සඳහා ගොනු කරන ලද ඉල්ලීම් හරහා ද ඒ පිළිබඳව ප්‍රයෝජනයට ගත හැකි තොරතුරු කිසිවක් ලැබී නොමැත.

- ප්‍රගතියක් නැත: ඇගයීම් කාල සීමාව ආරම්භයේ සිට ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතියේ වෙනසක් දක්නට නොතිබීම; එසේ නැතහොත් ඇගයීම් කාලය තුළ ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල කිසිදු ප්‍රගතියක් සිදු නොවූ බව ඒ පිළිබඳ ලබා ගත හැකි වූ තොරතුරුවල නිශ්චිතව සඳහන් වී තිබීම.

- දුර්වල ප්‍රගතිය: ඇගයීම් කාලය තුළ ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතියට දායක වූයේ එක් ප්‍රතිපත්තිමය/ව්‍යවස්ථාදායකමය/නියාමනික වෙනසක් පමණි.

- විශාල ප්‍රගතිය: ඇගයීම් කාලය තුළ ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතියට ප්‍රතිපත්තිමය/ ව්‍යවස්ථාදායකමය/ නියාමනික වෙනස්කම් එකකට වඩා වැඩි සංඛ්‍යාවක් දායක විය.

සංඛ්‍යාත්මකව මැනීමේ හැකියාවක් ඇති/ප්‍රමාණනය කළ හැකි ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල (1,2,3,4,5,7,8,10 සහ 12 කාර්ය සාධන දර්ශක) ප්‍රගතිය පහත ප්‍රවර්ග පහ මත පදනම්ව ඇගයීමට ලක් කරන ලදි:

- තොරතුරු අනාවරණය කර නොමැත: අන්තර්ජාල සෙවීම් තුළින් ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු කිසිවක් හමු නොවූ අතර ඇගයීම් කණ්ඩායම නිරන්තරව අමාත්‍යාංශයීය තොරතුරු නිලධාරීන් සමඟ පසුවිපරම් කළ ද ගොනු කරන ලද තොරතුරු දැනගැනීමේ ඉල්ලීම් හරහා ද ඒ පිළිබඳව ප්‍රයෝජනයට ගත හැකි තොරතුරු කිසිවක් ලැබී නොමැත.

- පිරිහී යන ප්‍රගතිය: ඇගයීම් කාලය තුළ ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය අඩු වී ඇත/අයහපත් අතට හැරී ඇත (එනම්, ප්‍රගතිය මැන බලන දර්ශකය ඇගයීම් කාලය තුළ ඍන වර්ධනයක් වාර්තා කර තිබීම)

- ප්‍රගතියක් නැත: ඇගයීම් කාල සීමාව ආරම්භයේ සිට ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතියේ වෙනසක් දක්නට නොලැබිණ; එසේ නැතහොත් ඇගයීම් කාලය තුළ ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල කිසිදු ප්‍රගතියක් සිදු නොවූ බව ඒ පිළිබඳව ලබා ගත හැකි වූ තොරතුරුවල නිශ්චිතව සඳහන් වී තිබීම.

- දුර්වල ප්‍රගතිය: ඇගයීම් කාල සීමාව තුළ ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය සියයට 0 සිට සියයට 10 දක්වා වැඩි වීමක් වාර්තා කරයි.


- විශාල ප්‍රගතිය: ඇගයීම් කාල සීමාව තුළ ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය සියයට 10 ඉක්මවා ගිය වර්ධනයක් වාර්තා කරයි.

2022 වසරේ ප්‍රගතිය දැක්වීම සඳහා ප්‍රවර්ග හඳුනා ගැනීමේදී ඊට පෙර වසරේ ඒ සඳහා යොදාගත් ප්‍රවර්ගයන්ට යම් වෙනසක් සිදු කරන ලදි. 2021 (පළමු ඇගයීම් වර්ෂය) වසර සඳහා තොරතුරු සහ ප්‍රගතිය නොමැති ප්‍රධාන කාර්ය සාධන දර්ශක ඇතුළත් වූ 'ප්‍රගතියක් නැත. යන ප්‍රවර්ගය, 2022 ඇගයීම යටතේදී 'ප්‍රගතියක් නැත. සහ 'තොරතුරු අනාවරණය කර නොමැත. යනුවෙන් බෙදා දක්වන ලදි. දර්ශක සපුරාලීම වෙනුවෙන් වගකීම් දරන ආයතන විසින් ස්වේච්ඡාවෙන් හෝ ඉල්ලීම මත හෝ මහජනයා වෙත දත්ත සහ තොරතුරු ලබා දීම එකී ආයාතනවලින් අවශ්‍ය කෙරෙන බැවින් කෙතරම් දුරට එලෙස තොරතුරු අනාවරණය කරන ලද්දේ ද යන්න ඉස්මතු කිරීමට මෙම බෙදා දැක්වීම සිදු කරන ලදි. ඒ අනුව, පෙර වසරේ ප්‍රතිඵල සංසන්දනය කළ හැකි වන පරිදි එම ප්‍රතිඵල මෙම වාර්තාව තුළ දැක්වීමේදී නව ක්‍රමයට ගැලපෙන පරිදි වෙනස් කර ඇත.


## ප්‍රගති සාරාංශය

2019 සිට 2020 දක්වා කාලය තුළ ප්‍රධාන කාර්ය සාධන දර්ශකවලින් කිසිවක් තම ඉලක්ක සාක්ෂාත් කර නොතිබිණි. ප්‍රධාන කාර්ය සාධන දර්ශකවලින් බහුතරයක් ( ප්‍රධාන කාර්ය සාධන දර්ශක 9 ක්, සියයට 75) සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් අනාවරණය වී නොපැවති බවත්, එක් ප්‍රධාන කාර්ය සාධන දර්ශකයක් (සියයට 8) කිසිදු ප්‍රගතියක් නොපෙන්වූ බවත්, ප්‍රධාන කාර්ය සාධන දර්ශක දෙකක් (සියයට 17) පිරිහී යන ප්‍රගතියක් පෙන්වූ බවත් දෙවන වසර සඳහා සිදු කරන ලද ඇගයීමේදී දක්නට ලැබිණ. මීට සාපෙක්ෂව (ප්‍රදර්ශිතය 4 බලන්න), ප්‍රධාන කාර්ය සාධන දර්ශක දෙකක්, එනම් ප්‍රධාන කාර්ය සාධන දර්ශක1 (පළමු වසරේදී දුර්වල ප්‍රගතියක් පෙන්වී ය) සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක 5 (පළමු වසරේදී ඒ පිළිබඳ කිසිදු තොරතුරක් අනාවරණය නොවීය), දෙවන වසර තුළදී පිරිහී යන ප්‍රගතියක් වාර්තා කිරීම දක්නට තිබිණ. වසර දෙක තුළදීම සිදු කරන ලද ඇගයීම්වලදී නිරීක්ෂණය වූ සැලකිය යුතු කරුණක් වන්නේ තොරතුරුවලින් බහුතරයක් මහජනයාට අනාවරණය නොකර පවතින බවයි. එනිසා, ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය ආශ්‍රිත දෘශ්‍යමානබව සහ විනිවිදබව යන කරුණුවල කිසිදු වෙනසක් සිදු වී නොමැත.

ප්‍රදර්ශිතය 2: 2019 සහ 2020 කාල සීමාව තුළ (2 වන වසර) ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය




ප්‍රදර්ශිතය 3: 2018 සහ 2019 කාල සීමාව තුළ (1 වන වසර) ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය



ප්‍රදර්ශිතය 4- 1(2018/2019)[7] සහ 2(2019/2020)[8] වර්ෂ සඳහා සමස්ත ප්‍ර.කා.සා.ද 12ට කර ඇති මුදල් වෙන් කිරීම් සහ ඒවායේ ප්‍රගතිය

## KPI 1 ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්ව ප්‍රතිශතයේ වැඩිවීම

| | 2018/19 | 2019/20 |
|---|---|---|
| ප්‍රගතියේ වර්ගීකරණය | දුර්වල ප්‍රගතිය | පිරිහී යන ප්‍රගතිය |
| වියදම | රු. මිලියන 28 | රු. මිලියන 2.1 |

ඇමුණුම බැලීමට මෙතැන ක්ලික් කරන්න

## KPI 2 මූලයාධාර වැඩසටහන් මගින් නිවාස ඉදිකර ඇති ස්ත්‍රී මූලික කුටුම්භයන් සංඛ්‍යාවේ වැඩි වීම

| | 2018/19 | 2019/20 |
|---|---|---|
| ප්‍රගතියේ වර්ගීකරණය | තොරතුරු අනාවරණය කර නොමැත | තොරතුරු අනාවරණය කර නොමැත |
| වියදම | තොරතුරු නැත | රු. මිලියන 7 |

ඇමුණුම බැලීමට මෙතැන ක්ලික් කරන්න

**KPI 3**

## ස්ත්‍රී පුරුෂභාවය මත පදනම්ව වෙන වෙන් දත්ත ලබාගත හැකි දත්ත පද්ධති පවත්වාගෙන යනු ලබන රාජ්‍ය ආයතන සංඛ්‍යාව

| | 2018/19 | 2019/20 |
|---|---|---|
| ප්‍රගතියේ වර්ගීකරණය | තොරතුරු අනාවරණය කර නොමැත | තොරතුරු අනාවරණය කර නොමැත |
| වියදම | තොරතුරු නැත | තොරතුරු නැත |

ඇමුණුම බැලීමට මෙතැන ක්ලික් කරන්න

**KPI 4**

## ජාතික වෘත්තීය පුහුණු සහතිකය (NVQ) ලබාගෙන කාර්මික සහ වෘත්තිමය ක්ෂේත්‍රයන්හි රැකියා සඳහා අවතීර්ණ වන කාන්තාවන්ගේ ප්‍රතිශතය ඉහළ යාම දුර්වල ප්‍රගතිය

| | 2018/19 | 2019/20 |
|---|---|---|
| ප්‍රගතියේ වර්ගීකරණය | දුර්වල ප්‍රගතිය | තොරතුරු අනාවරණය කර නොමැත |
| වියදම | තොරතුරු නැත | තොරතුරු නැත |

ඇමුණුම බැලීමට මෙතැන ක්ලික් කරන්න

KPI 5

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය/ සහනාධාර භාවිතා කරමින් තිරසර ව්‍යාපාරයන්හි නිරත වන කාන්තා ව්‍යවසායකයින් සංඛ්‍යාව

| | 2018/19 | 2019/20 |
|---|---|---|
| ප්‍රගතියේ වර්ගීකරණය | තොරතුරු අනාවරණය කර නොමැත | පිරිහී යන ප්‍රගතිය |
| වියදම | රු. මිලියන 70 | රු. මිලියන 7 |

ඇමුණුම බැලීමට මෙතැන ක්ලික් කරන්න

KPI 6

## ආපසු පැමිණි හා විදෙස්ගත වීමට නියමිත කාන්තාවන් ඉලක්ක කරගත් ජාතික ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති සංඛ්‍යාව

| | 2018/19 | 2019/20 |
|---|---|---|
| ප්‍රගතියේ වර්ගීකරණය | තොරතුරු අනාවරණය කර නොමැත | ප්‍රගතියක් නැත |
| වියදම | රු. මිලියන 3 | අ/නො |

ඇමුණුම බැලීමට මෙතැන ක්ලික් කරන්න

## KPI 7

### ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හරහා ලබාගත්, තීරණ ගැනීමේ තනතුරු හොබවන කාන්තාවන්ගේ සංඛ්‍යාව ඉහළ යාම

| | 2018/19 | 2019/20 |
|---|---|---|
| ප්‍රගතියේ වර්ගීකරණය | තොරතුරු අනාවරණය කර නොමැත | තොරතුරු අනාවරණය කර නොමැත |
| වියදම | රු. මිලියන 4 | තොරතුරු නැත |

ඇමුණුම බැලීමට මෙතැන ක්ලික් කරන්න

## KPI 8

### ස්ත්‍රී පුරුෂභාවය අනුව හිතකර රැකියා පරිසරයක් සහ දිවා සුරැකුම් පහසුකම් ආදිය වැඩිදියුණු කිරීම සඳහා පියවර ගෙන ඇති ආයතන සංඛ්‍යාව

| | 2018/19 | 2019/20 |
|---|---|---|
| ප්‍රගතියේ වර්ගීකරණය | තොරතුරු අනාවරණය කර නොමැත | තොරතුරු අනාවරණය කර නොමැත |
| වියදම | රු. මිලියන 93 | රු. මිලියන 2.6 |

ඇමුණුම බැලීමට මෙතැන ක්ලික් කරන්න

KPI 9

**ආපදා අවස්ථාවල දී මුදවා ගැනීම, සහන සැලසීම, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණය යන පියවරයන්හිදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අවධානය යොමු කිරීම සහතික වීම සඳහා ස්ථාපනය කර ඇති සහ ඵලදායි ලෙස ක්‍රියාවට නංවා ඇති ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සංඛ්‍යාව**

| | 2018/19 | 2019/20 |
|---|---|---|
| ප්‍රගතියේ වර්ගීකරණය | තොරතුරු අනාවරණය කර නොමැත | තොරතුරු අනාවරණය කර නොමැත |
| වියදම | තොරතුරු නැත | තොරතුරු නැත |

ඇමුණුම බැලීමට මෙතැන ක්ලික් කරන්න

KPI 10

**කාන්තාවන් හා ළමුන් සම්බන්ධයෙන් වන ගැටළු සංවේදී සහ ඵලදායි අයුරින් හැසිරවීම සඳහා පුහුණු කර ඇති, පොලිස් ස්ථාන තුළි පිහිටි කාන්තා හා ළමා කාර්යාංශ සංඛ්‍යාව**

| | 2018/19 | 2019/20 |
|---|---|---|
| ප්‍රගතියේ වර්ගීකරණය | තොරතුරු අනාවරණය කර නොමැත | තොරතුරු අනාවරණය කර නොමැත |
| වියදම | රු. මිලියන 38 | රු. මිලියන 26 |

ඇමුණුම බැලීමට මෙතැන ක්ලික් කරන්න

KPI 11

## සංශෝධනය කර ඇති, පනවා ඇති සහ/හෝ ක්‍රියාවට නංවා ඇති, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බනධයෙන් සිදු වන වෙනස් කොට සැලකීම් සඳහා අදාළ වන නීති, ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි සංඛ්‍යාව

| | 2018/19 | 2019/20 |
|---|---|---|
| ප්‍රගතියේ වර්ගීකරණය | ප්‍රගතියක් නැත | තොරතුරු අනාවරණය කර නොමැත |
| වියදම | රු. මිලියන 12 | තොරතුරු නැත |

ඇමුණුම බැලීමට මෙතැන ක්ලික් කරන්න

KPI 12

## ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට විසඳුම් ලබා දීම සඳහා වූ බහු ආංශික ජාතික ක්‍රියාකාරී සලැස්ම අනුපූරණය කිරීම සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය

| | 2018/19 | 2019/20 |
|---|---|---|
| ප්‍රගතියේ වර්ගීකරණය | තොරතුරු අනාවරණය කර නොමැත | තොරතුරු අනාවරණය කර නොමැත |
| වියදම | රු. මිලියන 62 | රු. මිලියන 10 |

ඇමුණුම බැලීමට මෙතැන ක්ලික් කරන්න

# ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය ඇගයීමේදී මතු වූ අභියෝග

වඩා වැඩි විෂය මූලිකත්වයක් සඳහා සහ පෙර වසරේදී හඳුනාගන්නා ලද දුර්වලතා සහ සීමාවන් මග හරවා ගැනීම සඳහා මෙම ඇගයීමේ දෙවන වසර තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රධාන කාර්ය සාධන දර්ශක සාක්ෂාත් කරගැනීමේලා රජය දක්වා ඇති ප්‍රගතිය ඇගයීම සඳහා භාවිතා කළ රාමුව සහ ක්‍රමවේදය වෙනස් කරන ලදි. මෙම ප්‍රයත්නයන් ගනු ලැබුව ද, දෙවන වසර සඳහා ඇගයීම සිදු කිරීමේදී ද ඒ හා සමාන අභියෝග මතු වූ අතර ඒ හේතුවෙන් යම් සීමාවන්ට යටත්ව ඇගයීම සම්පූර්ණ කිරීමට සිදු විය.

## පැහැදිලි ක්‍රියාත්මක කිරීමේ රාමුවක් නොමැති වීම

ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණයේ ගමන්මග ඇගයීමේ ලා පවතින අභියෝග අතුරින් එකක් වන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රධාන කාර්ය සාධන දර්ශක ක්‍රියාත්මක කිරීමේ රාමුව අපැහැදිලි වීමයි. පළමු වසරේ සිදු කළ ඇගයීම තුළින් පැහැදිලි වූ පරිදි ප්‍රධාන කාර්ය සාධන දර්ශක 12 ට අයත් වන විෂය පථය සහ ඊට වගකියනු ලබන පාර්ශ්ව සම්බන්ධ විස්තර ඇත්තේ ඉතා අවම වශයෙනි. මේ හේතුවෙන් ප්‍රධාන කාර්ය සාධන දර්ශක සාක්ෂාත් කිරීම සඳහා වග කියනු ලබන්නේ කිනම් අමාත්‍යාංශය ද යන කරුණත්, ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය ඇගයීමේ ලා අමාත්‍යාංශවලින් ලබා ගත යුත්තේ කිනම් තොරතුරු ද යන්නත් නිශ්චය කර ගැනීම අභියෝගාත්මක විය. මීට අමතරව, ක්‍රියාත්මක කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලියට ඉවහල් වන පරිදි ප්‍රධාන කාර්ය සාධන දර්ශක යටතේ ලැයිස්තුගත කළ ඉලක්ක, කාල රාමු හෝ ක්‍රියාකාරකම් කිසිවක් නොවීය. මේ හේතුවෙන් ප්‍රධාන කාර්ය සාධන දර්ශකවලට අදාළව ප්‍රගතිය ලෙස සැලකිය හැක්කේ කුමක් ද යන්න නිශ්චය කර ගැනීම ද අභියෝගාත්මක විය.

එනිසා, යම් නිශ්චිත අමාත්‍යාංශ හඳුනාගෙන ඒ වෙත තොරතුරු ලබා ගැනීමේ ඉල්ලීම් ගොනු කිරීමට ඇගයීම් කණ්ඩායම පියවර ගත් අතර, ඒ ඔස්සේ එකී අමාත්‍යාංශ යටතේ ඇති විෂයන් සහ ක්ෂේත්‍රයන්ට අදාළ වන සහ සෘජුව සම්බන්ධ වන ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු ඉල්ලා සිටින ලදි. මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය ඇගයීමේදී යොදා ගත හැකි ප්‍රායෝගික කඩයිම් ද කණ්ඩායම විසින් සකසන ලදි.[9] මීට අමතරව, පළමු වසරට සාපේක්ෂව දෙවන වසර තුළදී ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා වඩා වැඩි අමාත්‍යාංශ සංඛ්‍යාවක් වෙත තොරතුරු ලබා ගැනීමේ ඉල්ලීම් ගොනු කරන ලදි. වඩා පුළුල් පරාසයක ප්‍රතිචාරයන් සඳහා ඉඩ සැලසීම මගින් දර්ශකවල ප්‍රගතිය පිළිබඳ වඩා වැඩි තොරතුරු ප්‍රමාණයක් එක් රැස් කර ගැනීම මෙහි අරමුණ විය.[10]

## රජයේ අමාත්‍යාංශවල හීන වූ වගවීම

ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය සාක්ෂාත් කරගැනීම උදෙසා යොදා ගත හැකි පැහැදිලි ක්‍රියාත්මක කිරීමේ රාමුවක් හෝ සැලසුමක් නොපවතින අතර ඒ හේතුවෙන් එම දර්ශකවල ප්‍රගතිය නිසි ලෙස නිරීක්ෂණය කිරීමට මෙන්ම ඒ සම්බන්ධයෙන් වග වීමට අමාත්‍යාංශ නොපෙළඹේ. උදාහරණයක් ලෙස, අමාත්‍යාංශ ලවා ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන් කරන ලද දත්ත (ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 3) ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතටත් කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය[11] වෙතටත් යොමු කරවීමේදී මුහුණ දීමට සිදු වූ දුෂ්කරතා සහ ප්‍රමාදයන් පිළිබඳව තොරතුරු ලබා ගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර

දැක්වීමේදී කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය විසින් විස්තර කරන්නට යෙදිණි. මීට අමතරව, අමාත්‍යාංශය තුළ කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු එක් රැස් කරගැනීමට වැඩි කාලයක් ගත වීම නිසා පෙර වසරේදී (පළමු වසර) කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය පිළිබඳව තොරතුරු ලබා දුන් අමාත්‍යාංශ දෙවන වසරේ ගොනු කරන ලද ඉල්ලීම්වලට නිසි වේලාවට පිළිතුරු ලබා දීමට අපොහොසත් විය (උදා: නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය විසින් ජාතික වෘත්තීය පුහුණු (NVQ) සහතිකය ලබා තාක්ෂණික සහ වෘත්තීය ක්ෂේත්‍රවල රැකියාවලට අවතීර්ණ වන කාන්තාවන්ගේ ප්‍රතිශතය පිළිබඳ දත්ත ලබා දීමේදී).[12]

## අධීක්ෂණය සිදු කරන අමාත්‍යාංශ වෙතින් නව තොරතුරු නොලැබීම

ජාතික අයවැය චක්‍රලේඛ 2/2019 හි දක්වා ඇති පරිදි, ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන කාර්ය සාධන දර්ශක 12 ප්‍රගතිය අධීක්ෂණය කිරීමේ වගකීම මුදල් අමාත්‍යාංශයටත් කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයටත් පැවරේ. මේ හේතුවෙන්, ප්‍රධාන කාර්ය සාධන දර්ශක 12 සම්බන්ධයෙන් මෙම වසර (දෙවන වසර) තුළ ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ වෙන් වෙන් වශයෙන් ඉල්ලීම් 2 ක් මෙම අමාත්‍යාංශ දෙක වෙත ගොනු කරන ලදි.

මෙම අමාත්‍යාංශවලින් ලැබුණු ප්‍රතිචාර පෙර වසරේදී (පළමු වසර) ඉන් ලැබුණු ප්‍රතිචාරවලට එලෙසින්ම සමාන වූ අතර ප්‍රධාන කාර්ය සාධන දර්ශක 12 ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය කෙතරම් දුර්වල මට්ටමක පවතී ද යන්න පෙර වසරටත් වඩා හොඳින් එමගින් විද්‍යාමාන විය. එමෙන්ම, අධීක්ෂණය සිදු කරන අමාත්‍යාංශ නිසි වේලාවට ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය සටහන් කර නොමැති බව ද එමගින් පැහැදිලි විය.

තව ද, අධීක්ෂණ ආයතන ලෙස මුදල් අමාත්‍යාංශය සහ කාන්තා සහ ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ප්‍රධාන කාර්ය සාධන දර්ශක 12 ප්‍රගතිය පිළිබඳව තොරතුරු රැස් කිරීමත්, අමාත්‍යාංශ තුළ ඒවා ක්‍රියාත්මක වන ආකාරය අධීක්ෂණය කිරීමත් සිදු කළ යුතුව තිබුණ ද, ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය ඇගයීමෙහිලා එම ආයතනවලින් ලැබුණු ප්‍රතිචාරවලින් ලද ප්‍රයෝජනය ඉතාමත් අල්ප මට්ටමක හෝ නොගිනිය හැකි මට්ටමක හෝ පැවතිණ. එසේ වුවත්, යම් නිශ්චිත ප්‍රධාන කාර්ය සාධන දර්ශක සම්බන්ධයෙන් තොරතුරු රැස් කිරීමේදී වෙනත් අමාත්‍යාංශ වෙත ගොනු කරන ලද තොරතුරු ලබා ගැනීමේ ඉල්ලීම්වලට ලැබුණු ප්‍රතිචාර මගින් එම අමාත්‍යාංශ තුළ මෙම දර්ශක කෙතරම් දුරට ක්‍රියාත්මක කර ඇත් ද යන්න පිළිබඳව වඩා පැහැදිලි අදහසක් ලබා ගැනීමට හැකි විය(උදා. කර්මාන්ත අමාත්‍යාංශය විසින් 2018, 2019 සහ 2020 වසරවල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය/සහනාධාර භාවිතා කරමින් තිරසර ව්‍යවසායන්ගේ නියැලෙන කාන්තා ව්‍යවසායිකාවන්ගේ සංඛ්‍යාව සපයනු ලැබීය (ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 5)). එනමුත්, මුදල් අමාත්‍යාංශය හෝ කාන්තා සහ ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය හෝ වෙතින් මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් නොලැබිණ.

සත්‍ය වශයෙන්ම, තම ප්‍රතිචාරය ඔස්සේ මුදල් අමාත්‍යාංශය විසින් සිදු කරන ලද්දේ ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය පිළිබඳ යාවත්කාලීන කළ තොරතුරු සැපයීමේ වගකීම කාන්තා සහ ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත පැවරීමයි.[13] ප්‍රධාන කාර්ය සාධන දර්ශක ක්‍රියාත්මක කිරීමේදී කිසිදු ප්‍රගතියක් අත් කර ගෙන නොමැති බව කාන්තා සහ ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රකාශ කරන ලදි.

## දුර්වල අනාවරණය

මීට අමතරව, ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය හෝ තොරතුරු මඳකම සඳහා හේතු වූ කාරණා දක්වන ලෙසට අමාත්‍යාංශ වෙතින් ඉල්ලා සිටිය ද ඒ පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීමට ද අමාත්‍යාංශ අපොහොසත් විය. රජයේ ක්‍රියාකාරකම් සහ අයවැයකරණ කටයුතුවලට කොවිඩ් -19 හේතුවෙන් බාධා එල්ල වූ බවත් එමගින් ප්‍රධාන කාර්ය සාධන දර්ශක 12 ප්‍රගතියට ද බලපෑමක් වූ බවත් සිතිය හැකි වුව ද, තොරතුරු අනාවරණය කිරීමේ දී අමාත්‍යාංශ තුළ පැවති දුර්වල ස්වභාවය හේතුවෙන් එය 2020 ප්‍රධාන කාර්ය සාධන දර්ශක සාක්ෂාත් කිරීම කෙරෙහි බලපෑ සාධකයක් වූ බවට නිශ්චිතව පැවසීමට ඇගයීම් කණ්ඩායමට අසීරු විය.

## තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ ගොනු කරන ලද ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීමේ ප්‍රමාදයන් සහ ප්‍රතික්ෂේප කිරීම්

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත මගින් නියම කරන පරිදි, එම අයිතිය යටතේ ගොනු කරනු ලබන ඉල්ලීමක් සපුරාලිය හැකි ද එසේත් නැතිනම් පනතේ 5 වන වගන්තියේ දක්වා ඇති හේතු මත ප්‍රතික්ෂේප කෙරෙන්නේ ද යන වග පිළිබඳ තීරණය දින දාහතරක් ඇතුළත දැනුම් දිය යුතු ය. එමෙන්ම, එම ඉල්ලීමට අදාළ තොරතුරු ලබා දීමට තීරණය කර ඇත්නම්, එම තීරණය ගත් දින සිට දින දාහතරක් ඇතුළත එකී තොරතුරු වෙත ප්‍රවේශය ලබා දිය යුතු බවත් පනතේ තවදුරටත් සඳහන් වේ.

එසේ වුවත්, දෙවන වසර තුළ තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ ගොනු කරන ලද ඉල්ලීම් වෙත ප්‍රතිචාර දැක්වීම ප්‍රමාද වූ අතර ඊට පැහැදිලි හේතුවක් ද අදාළ අමාත්‍යාංශයෙන් විසින් ඉදිරිපත් කරනු නොලැබිණ. උදාහරණයක් ලෙස, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපනය, පර්යේෂණ සහ නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය වෙත 2021 ඔක්තෝබර් මස 18 වන දින තොරතුරු ලබාගැනීමේ අයිතිය යටතේ ඉල්ලීමක් ගොනු කළ ද, දැඩි ප්‍රමාදයකට ලක්වීමෙන් අනතුරුව එහි ප්‍රතිචාරය ලැබුණේ තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ වන ඉල්ලීම් සඳහා ප්‍රතිචාර භාරගැනීමට යෙදී තිබූ අවසන් දිනය ද (2022 ජනවාරි 31) ඉකුත්ව ගිය පසුව ය. එලෙසම, 2021 ඔක්තෝබර් 18 වන දින අධිකරණ අමාත්‍යාංශය වෙත ගොනු කරන ලද තොරතුරු ලබා ගැනීමේ ඉල්ලීම ලැබුණු බව දන්වා තිබුණ ද එයට කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණි (2022 අප්‍රේල් 1 වන දිනට).

මීට අමතරව, දෙවන වසර සඳහා වූ ඇගයීම සිදු කිරීමේදී එක් අමාත්‍යාංශයක් විසින් තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ වූ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කළ අතර ඉන් නැඟුනු අභියෝගයට මුහුණ දීමට ද සිදු විය. පොලිස් ස්ථානවල සංවේදී සහ ඵලදායී අයුරින් කාන්තාවන්ගේ සහ දරුවන්ගේ ගැටළු සම්බන්ධව කටයුතු කිරීමට හැකියාව සහිත කාන්තා සහ ළමා කාර්යාංශයන් කෙතරම් සංඛ්‍යාවක් ඇති ද (ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 10) යන්න පිළිබඳව තොරතුරු ලබා ගැනීම සම්බන්ධයෙන් මහජන ආරක්ෂක අමාත්‍යාංශය වෙත ගොනු කරන ලද තොරතුරු ඉල්ලීම එලෙස ප්‍රතික්ෂේප විය. එම අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා පොලීසිය වෙත මෙම ඉල්ලීම යොමු කරන ලද අතර එය තොරතුරු දැනගැනීමේ පනතේ (5) (1) (ඉ) (i) වගන්තිය යටතේ ශ්‍රී ලංකා පොලීසිය විසින් ප්‍රතික්ෂේප කරන ලදි.[14] විශේෂයෙන්ම, ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය පිළිබඳව ඇගයීම සම්බන්ධයෙන් ඉල්ලා සිටින ලද තොරතුරුවල ස්වභාවය කිසිසේත්ම රට තුළ වන අපරාධ වැළැක්වීම හෝ හඳුනා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලීසියේ ක්‍රියාකාරකම්වලට හානි කරන්නක් හෝ අගතියක් ඇති කරන්නක් නොවන අතර එය නීතිය කඩකරන්නන්ට විරුද්ධව කටයුතු කිරීමට කිසිදු බාධාවක් ඇති කරන්නක් ද නොවේ. එමෙන්ම, එය රටේ නීතිය බලාත්මක කිරීමට අදාළ තොරතුරු පිළිබඳ රහසිගත මූලාශ්‍රවල අනන්‍යතාව අනාවරණයක් කරන්නක් ද නොවේ. එනමුත්, කිසිදු සාධාරණ හේතුවකින් තොරව එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදි.

## අමාත්‍ය මණ්ඩල වෙනස් කිරීම හේතුවෙන් ඇතිවන අකාර්යක්ෂමතාව

පළමු වසර තුළදී අත්දුටු ලෙසම, නිරන්තරයෙන් (ඇතැම් විට එකම වර්ෂය තුළ පවා) අමාත්‍යාංශ වෙනස් කිරීමටත් තාර්කික පදනමකින් තොරව අමාත්‍යාංශ එක් කිරීමටත් බෙදා වෙන් කිරීමටත් රජය දැක්වූ ප්‍රවණතාව, ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබා ගැනීම කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කළේ ය. 2020 වසරේදී වෙරිටේ ආයතනය විසින් රජයේ මෙම ප්‍රවණතාව හේතුවෙන් මහජන මුදල් සම්බන්ධයෙන් රජය වගවීමට ලක් කිරීම අපහසු වන අයුරුත්, අමාත්‍යාංශයන් විසින් ක්‍රියාවට නැංවෙන ව්‍යාපෘතිවල සම්බන්ධීකරණය දුර්වල වන අයුරුත් පෙන්වා දෙමින් ධවල පත්‍රිකාවක් පළ කරන ලදි.[15]

මෙම තත්ත්වය දෙවන වසරේ ඇගයීම තුළදී ද එලෙසම අත්දකින්නට ලැබිණි. උදාහරණයක් ලෙස, මූලයාධාර වැඩසටහන් තුළින් නිවාස ඉදි කරන ලද කාන්තා මූලික කුටුම්භ සංඛ්‍යාව (ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 2) පිළිබඳව තොරතුරු ලබා දීමට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය අපොහොසත් විය. මෙම අමාත්‍යාංශය 2020 අගෝස්තු මස 9 වන දින ස්ථාපනය කරන ලද බවත්, ඒ හේතුවෙන් මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය සකස් කරන ලද 2017 වර්ෂයේදී නිවාස ව්‍යාපෘතිවල ප්‍රතිලාභීන් තේරීමට සම්බන්ධ නොවූ බැවින් ඊට අදාළ තොරතුරු ලබා දීමේ හැකියාවක් ඊට නොමැති බවත් තම තීරණය දැනුම් දීමේ ලිපිය ඔස්සේ මෙම අමාත්‍යාංශය විසින් දන්වා සිටින ලදි.

ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය ඇගයීමේදී මෙම අභියෝග මගින් පළමු වන වසරේදී එල්ල කරන ලද බාධාවන් දෙවන වසර වන විටත් කිසිදු ආකාරයකින් වෙනස් වී නොතිබිණි. මෙම අභියෝග බොහෝ දුරට ආයතනික මට්ටමින් පවතින බැවින් වසරක් ඇතුළත ඒවා ජය ගැනීම අපහසු වීම ඊට හේතුවයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය සාක්ෂාත් කර ගැනීම සඳහා අමාත්‍යාංශ වගවීමට ලක් කිරීම සහ එමගින් ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය ක්‍රියාවට නැංවීම, ඉටු කිරීමට නොහැකි වන තරම් අපහසු කාර්යයක් සේ පෙනෙන්නට තිබේ.

# ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය: ඉදිරි ගමන් මග

ශ්‍රී ලංකාව ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය සඳහා දක්වන කැපවීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රධාන කාර්ය සාධන දර්ශක 12 ඔස්සේ ඇගයීමට ලක් කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව දෙවන වසරටත් සිදු කිරීම මෙම වාර්තාව මගින් සනිටුහන් කෙරේ. රජය දිගින් දිගටම තමන් විසින්ම සකසන ලද ප්‍රතිපත්ති සහ සැලසුම් වෙත දක්වන නොසැලකිල්ල මෙම ඇගයීමේ සොයාගැනීම් තුළින් පෙනෙන්නට තිබෙන අතර ඒ වෙනුවෙන් කැපවීමක් ද නොදක්වන බව එම සොයාගැනීම් තුළින් අනාවරණය වී තිබේ.

ඉහත මතු කළ පරිදි ප්‍රධාන කාර්ය සාධන දර්ශක 12 රේඛීය අමාත්‍යාංශ මට්ටමින් ක්‍රියාත්මක කර තිබීම ඉතා දුර්වල මට්ටමක පැවතිණි. අධීක්ෂණ අමාත්‍යාංශ විසින් දක්වන ලද සහභෝගය ඊටත් වඩා අඩු මට්ටමක පැවති අතර ප්‍රධාන කාර්ය සාධන දර්ශක 12 හි ප්‍රගතිය පිළිබඳ යාවත්කාලීන සාක්ෂි සැපයීමට ඔවුනට නොහැකි විය. අධීක්ෂණ අමාත්‍යාංශ අයවැය කැඳවීමේ දී නියම කර ඇති කරුණුවලට අනුකූලව ක්‍රියා කර නොමැති බවත්, ඒ හේතුවෙන් උපදෙස් පිළිපැද ප්‍රධාන කාර්ය සාධන දර්ශක ක්‍රියාවට නැංවීම සඳහා රේඛීය අමාත්‍යාංශ කිසිදු අනුබලයක් නොලද බවත් එකී අධීක්ෂණ අමාත්‍යාංශ විසින් ලබා දෙන ලද ප්‍රතිචාරවල පැවති අඩුලුහුඩුකම් සැලකීමේදී පෙනී යයි. සැලසුම් සහ ප්‍රතිපත්ති සඳහා යෙදවෙන රාජ්‍ය අරමුදල් සහ රාජ්‍ය සම්පත් අකාර්යක්ෂම ලෙස භාවිතා කිරීමට එවැනි ක්‍රියාවන් ඉඩ සලසයි.

තොරතුරු අනාවරණයෙහිදී දක්වන දුර්වලතා, පරිපාලනය තුළ පවතින ගැටළුවල තවත් එක් අංගයක් ද වේ. අමාත්‍යාංශ අතර පවතින සහයෝගය මෙන්ම විනිවිදභාවය ද මඳ බව ඉන් හඟවන අතර මේ හේතුවෙන් මහජන මුදල් භාවිතය සම්බන්ධයෙන් අමාත්‍යාංශ වගවීමට ලක් කිරීමේදී දුෂ්කරතා මතු වේ. මෙය, වසර ගණනාවක සිට දක්නට ලැබෙන සුලබ සිද්ධියක් බව වෙරිටේ ආයතනයේ මාර්ගගත වේදිකාවක් වන *budgetpromises.org* වාර්තා කරයි. මෙම පරිපාලනමය ගැටළු විසඳීමටත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රධාන කාර්ය සාධන දර්ශක 12 සම්බන්ධයෙන් මෙහිදී ඉස්මතු කරන ලද අසාර්ථකත්වයන් මගහරවා ගැනීමටත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය සම්බන්ධයෙන් ඉදිරියේදී අනුගමනය කරනු ලබන උපාය මාර්ග තුළින් උත්සාහ දැරිය යුතු වේ. මහජන මුදල් සහ රාජ්‍ය සම්පත් භාවිතය කාර්යක්ෂමව සිදු වන බව සහතික කිරීමටත්, එමගින් අයවැයකරණයේ සමස්ත ප්‍රතිඵල සමාජය වෙත ලබා දීමටත් ඒ තුළින් හැකි වනු ඇත.

1. **ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැකරණයට අදාළව ඉදිරියේදී සිදු කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා විස්තරාත්මක රාමුවක් ක්‍රියාවට නැංවීම**

   a. වගකිව යුතු පාර්ශ්වයන් සහ ක්‍රියාත්මක කිරීමේ කාල රාමු දැක්වීම

දෙවන වසර තුළ ප්‍රධාන කාර්ය සාධන දර්ශක 12 ප්‍රගතිය අධීක්ෂණය කිරීමේදී දෙවන වරටත් ඔප්පු වී ඇත්තේ එක් එක් කාර්ය සාධන දර්ශකය සඳහා පැහැදිලිව දක්වා ඇති වගකිව යුතු පාර්ශ්වයක් නොමැති වීමෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණයේ නමින් රාජ්‍ය අරමුදල් භාවිතා කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ වගවීමට ලක් කිරීම අභියෝගාත්මක වන බවයි. එනිසා, ඉදිරියේදී රජය විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය ආශ්‍රිත ක්‍රියාකාරකම් යෝජනා කර

ක්‍රියාත්මක කිරීමේදී එකී ක්‍රියාකාරකම්වලට අයත් වන කාර්යයන්/උපාය මාර්ගයන් සඳහා වග කියනු ලබන රාජ්‍ය ආයතන නිශ්චිතව සඳහන් කළ යුතු ය. මීට අමතරව, ප්‍රගති ඉලක්ක සඳහා නියමිත කාලසීමාවන් සහ කාල රාමු සඳහන් කර තිබීම, පවරා ඇති උපාය මාර්ගවල ඉලක්ක යථාර්ථවාදීව සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රමාණවත් සම්පත් සහ අරමුදල් රැස් කිරීමේදී අමාත්‍යාංශවලට උපකාරයක් වනු ඇත. උදාහරණයක් ලෙස, 2022 අයවැය කැඳවීමෙන් පසු 2021 දී අනාගත අයවැය සැලසුම් සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය ඇතුළත් කිරීම සඳහා, කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් රටේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඉහළ නැංවීම සඳහා නිශ්චිත උපාය මාර්ග ඇතුළත් ලේඛනයක් ප්‍රකාශයට පත් කර ඇත. එකී එක් එක් උපාය මාර්ගය සඳහා වගකිව යුතු රජයේ ආයතනත්, එවැනි උපාය මාර්ගවල ප්‍රගතිය මැන බැලීම සඳහා උපයෝගී කර ගත හැකි ප්‍රධාන කාර්ය සාධන දර්ශකත් එම ලේඛනය තුළම ගෙනහැර දක්වයි.[16] මෙය ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය ආශ්‍රිත ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම සඳහා (2017 දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රධාන කාර්ය සාධන දර්ශක 12 පිහිටුවීමෙන් අනතුරුව සිදු කරන ලද) වන ප්‍රශංසනීය සහ බෙහෙවින් වැඩිදියුණු කළ ප්‍රවේශයකි.

### b. ක්‍රියාත්මක කිරීමේ රාමුවට මූල්‍ය සැලසුමක් ඇතුළත් කිරීම

ව්‍යාපෘතිය සඳහා ප්‍රමාණවත් අරමුදල් නොතිබීම නිසා ව්‍යාපෘති කිහිපයක්ම අතරමග නවතා දැමීට සිදුවූ බවත්, වසර ගණනාවක සිට රජයේ අයවැය යෝජනා සහ ඉන් අරඹන ක්‍රියාකාරකම් මූල්‍ය සැලසුම්කරණය අතින් දුර්වල මට්ටමක තිබූ අයුරු එමගින් පෙන්නුම් කරන බවත් වෙරිටේ ආයතනයේ මාර්ගගත වේදිකාවක් වන *budgetpromises.org*[17] පෙන්වා දී ඇත. රජය විසින් ක්‍රියාත්මක කෙරෙන සහ යෝජනා කෙරෙන බොහෝ ප්‍රතිපත්ති සමස්තයක් ලෙස නිසි ලෙස සැලසුම් කර නොතිබීමටත් එම ප්‍රතිපත්ති නිසි ලෙස විශ්ලේෂණය කර නොතබීමටත් මෙවැනි අවස්ථා හේතු වන අතර එමගින් රටේ ඉදිරි ගමනට බාධා පමුණුවයි.

මෙම කරුණ දෙවන වසර තුළ ද එලෙසම නිරීක්ෂණය විය. ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 9 (ආපදා අවස්ථාවල දී මුදවා ගැනීම, සහන සැලසීම, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණය යන පියවරයන්හිදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අවධානය යොමු කිරීම සහතික වීම සඳහා ස්ථාපනය කර ඇති සහ එලදායි ලෙස ක්‍රියාවට නංවා ඇති ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සංඛ්‍යාව) වෙනුවෙන් ක්‍රියාකාරකම් සහ ව්‍යාපෘති ගණනාවක් සැලසුම් කර සහ යෝජනා කර තිබුණ ද එම කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා රජය විසින් ප්‍රමාණවත් පරිදි අරමුදල් වෙන් නොකිරීම හේතුවෙන් එම වැඩසටහන් ආරම්භ කිරීමට නොහැකි වූ බව තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමකට ප්‍රතිචාර ලෙස රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය ප්‍රකාශ කළේය. එබැවින්, අනාගතයේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණ උපාය මාර්ග සැකසීමේදී, ඒ සඳහා ආසන්න වශයෙන් වැය වන පිරිවැය, එහි ප්‍රතිලාභ සහ එවැනි උපාය මාර්ග සඳහා අරමුදල් ලැබෙන ආකාර විස්තර කෙරෙන සැලැස්මක් ද ඊට ඇතුළත් කර තිබිය යුතුය.

## 2. ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා වන අධීක්ෂණ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම

### a. වාර්තාකරණ ආකෘතියක් සැපයීම

තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ ඉල්ලීම් යොමු කරන ලද අමාත්‍යාංශවලින් බහුතරයකට එලෙස ඉල්ලා සිටි තොරතුරු මොනවා ද යන්න පිළිබඳවත්, මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද යන්න පිළිබඳවත් පවතිනුයේ ඉතා සීමිත අවබෝධයක් බව පසුගිය වසර දෙක තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රධාන කාර්ය සාධන දර්ශක ඇගයීමේදී පෙනී ගොස් ඇති කරුණකි. පෙර සඳහන් කළ පරිදි, එම ප්‍රතිචාරවලින් බොහොමයක් ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය ඇගයීමේදී ප්‍රයෝජනවත් වී නොමැත. ඊට අමතරව, මෙම අමාත්‍යාංශ වෙතින් තොරතුරු සහ ප්‍රතිචාර ලබාගැනීමේදී මුහුණ දීමට සිදු වූ ප්‍රමාදයන් මගින් ද පෙන්නුම් කරන ලද්දේ එකී අමාත්‍යාංශ ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය අධීක්ෂණ අමාත්‍යාංශ වෙත නිසි ලෙස වාර්තා කර නොමැති බවයි. අමාත්‍යාංශ විසින් එම තොරතුරු ලබාගැනීමේ ඉල්ලීම් වෙත ප්‍රතිචාර ලබා දෙන ලද්දේ ද විවිධ ආකෘති උපයෝගී කර ගනිමිනි.

මෙම අකාර්යක්ෂමතාවන් මග හරවා ගැනීම සඳහා, අනාගතයේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය ආශ්‍රිත උපාය මාර්ග සැකසීමේදී අමාත්‍යාංශ උදෙසා පැහැදිලි සහ සංගත වාර්තාකරණ ක්‍රමයක් ද හඳුන්වා දිය යුතු ය. ඒ තුළින් රාජ්‍ය ආයතන තුළ වාර්තාකරණය සඳහා විධිමත් මාධ්‍යයක් නිර්මාණය වන අතර එවැනි ප්‍රයත්නයන්ගේ ප්‍රගතිය සංගතව හා කාලෝචිතව මැනීමට එමගින් හැකි වනු ඇත. උදාහරණයක් වශයෙන්, අධීක්ෂණ අමාත්‍යාංශ වෙත මාසිකව හෝ ද්වි-වාර්ෂිකව (සෑම මාස හයකට වරක්) ප්‍රගතිය ඉදිරිපත් කිරීම අනිවාර්ය කිරීම, සිදු කරනු ලබන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය වාර්තා කරන ආකාරය පිළිබඳ උපදෙස් ලබා දීමට භාවිතා කළ හැකි ආකෘතියක්/සැකිල්ලක් රජයේ ආයතනවලට ලබා දීම යනාදිය දැක්විය හැකි ය.

b. අධීක්ෂණ ආයතන තුළ කාර්යක්ෂම යාන්ත්‍රණයන් පිහිටුවීම

ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල අයවැයකරණය ආශ්‍රිතව අරඹන ක්‍රියාකාරම්වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු රජයේ අමාත්‍යාංශ මොනවාද යන්න අයවැය චක්‍රලේඛයක් (උදා: අයවැය චක්‍රලේඛය 2/2019) මගින් ප්‍රකාශ කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. පසුගිය වසර දෙක තුළ ප්‍රධාන කාර්ය සාධන දර්ශක පිළිබඳ වෙරිටේ ආයතනය විසින් සිදු කරන ලද ඇගයීම් තුළින් පෙනී ගොස් ඇත්තේ අධීක්ෂණ ක්‍රියාවලිය දුර්වලව පවතින බවයි. ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය පිළිබඳ යාවත්කාලීන තොරතුරු සැපයිය හැකි එක් තනි සම්බන්ධතා ස්ථානයක් (point of contact) අධීක්ෂණ අමාත්‍යාංශ දෙක තුළම නොතිබිණි. එනිසා, අධීක්ෂණ අමාත්‍යාංශ තුළ වාර්තාකරණය, අධීක්ෂණය කිරීම සහ ඇගයීම් සිදු කිරීම සඳහා ශක්තිමත් යාන්ත්‍රණයන් ආයතනගත කිරීම තුළින් ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය ආශ්‍රිත ඉදිරි උපාය මාර්ග කාර්යක්ෂමව ක්‍රියාත්මක කෙරෙන බව සහතික කළ හැකි වනු ඇත.

උදාහරණයක් ලෙස, සිදු කරන ලබන ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීමට හා කළමනාකරණය කිරීමටත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල ප්‍රගතිය වෙනත් අමාත්‍යාංශවලින් එක් රැස් කිරීමටත්, එවැනි ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු ලබා දීම සඳහා ප්‍රධාන සම්බන්ධතාව ලෙස ක්‍රියාකරන වගකිවයුතු ඒකකයක්/නිලධාරියෙකු අමාත්‍යාංශය තුළ පත් කිරීමට අධීක්ෂණ අමාත්‍යාංශවලට හැක. අධීක්ෂණ කටයුතු භාර නිලධාරියකු ඉල්ලා අස්වූ විටකදී හෝ අමාත්‍යාංශය තුළම වෙනත් දෙපාර්තමේන්තුවකට මාරු වූ විටකදී පවා මෙම කාර්යභාරය භාර ගැනීමට වෙනත් නිලධාරියකු දැනුවත් කර පත් කෙරෙන බව එමගින් සහතික කෙරේ.

c. අධීක්ෂණයේ විධායක නොවන ආකාර ක්‍රියාත්මක කිරීම

අයවැය චක්‍රලේඛවල ඔවුන්ගේ භූමිකාවන් ගෙනහැර දැක්වීමට පියවර ගෙන ඇතත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණ උපාය මාර්ග සඳහා විධායක ආකාරයේ අධීක්ෂණ (රජයේ අමාත්‍යාංශ) දුර්වල මට්ටමක පැවත ඇත. ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල ප්‍රගතිය අධීක්ෂණය කිරීමේ කාර්යය, එවැනි ක්‍රියාකාරකම් පිළිබඳව උනන්දුවක් දක්වන විධායක නොවන ආයතනයකට (පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය වැනි) පැවරීම හරහා වාර්තාකරණය වෙනුවෙන් අමතර ස්ථරයක් ඇති කිරීමෙන් එවැනි ක්‍රියාකාරකම්වලට අදාළ ක්‍රියාත්මක කිරීමේ පියවර ශක්තිමත් කළ හැකි වනු ඇත.

## 3. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය ආශ්‍රිත උපාය මාර්ගවල විනිවිදභාවය වැඩි දියුණු කිරීම

ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය ආශ්‍රිත උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා මහජන මුදල් භාවිතා කරන බැවින්, මෙම අරමුදල් භාවිතා කරන ලද ආකාරය සහ එවැනි උපාය මාර්ග කෙතරම් දුරට ක්‍රියාත්මක කරන ලද්දේ ද යන්න පිළිබඳව තොරතුරු මහජනතාවට ලබා දිය යුතුය. වගකිවයුතු අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා වෙත භාෂා තුනෙන්ම මාර්ගගතව ප්‍රවේශ වීමට ඉඩ සලසා දීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය ආශ්‍රිත උපාය මාර්ගවල විනිවිදභාවය වැඩි දියුණු කරයි. ජාත්‍යන්තර අයවැය දර්ශකවල ශ්‍රී ලංකාවේ ශ්‍රේණිගත කිරීම ඉහළ නැංවීමට ද එය උපකාරී වනු ඇත (උදා: ජාත්‍යන්තර අයවැය හවුල්කාරිත්වය මගින් සිදු කරනු ලබන විවෘත අයවැය සමීක්ෂණය).

# නිගමනය

2018 අයවැය කැඳවීම හරහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රධාන කාර්ය සාධන දර්ශක හඳුන්වාදීම, ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය ආශ්‍රිත ක්‍රමවේද ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් සිදු කරන ලද ධනාත්මක මුලපිරීමකි. කෙසේ වෙතත්, අයවැය කැඳවීම තුළ දක්වන ලද ප්‍රධාන කාර්ය සාධන දර්ශක සාක්ෂාත් කරගැනීමේ සැලකීමේදී ශ්‍රී ලංකාව දුර්වල මට්ටමක පසුවන බව පෙනෙන්නට තිබේ. ප්‍රධාන කාර්ය සාධන දර්ශක 12 න් 2ක් (එනම් 1 සහ 5) පිරිහී යන ප්‍රගතියක් පෙන්නුම් කළ බවත් එක් ප්‍රධාන කාර්ය සාධන දර්ශකයක් (6 වැනි දර්ශකය) කිසිදු ප්‍රගතියක් නොපෙන්වූ බවත්, අනෙක් සියලු ප්‍රධාන කාර්ය සාධන දර්ශක සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය වී නොතිබූ බවත් මෙම වසරේ සිදු කරන ලද ඇගයීමෙන් අනාවරණය වේ. මෙම ක්‍රියාකාරකම සිදු කිරීමේදී මතු වන අභියෝග සහ අකාර්යක්ෂමතාවන් එමගින් පෙන්නුම් කෙරේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය ශ්‍රී ලංකාවට සාපේක්ෂ වශයෙන් නව සංකල්පයක් වන බැවින්, මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශක ඇගයීමේදී අප මුහුණ දුන් අභියෝග පිළිබඳ දැනුවත් කිරීම සඳහාත් අනාගතයේ දී වඩා හොඳ සහ කාර්යක්ෂම ප්‍රතිපත්ති පිහිටුවීම වෙනුවෙන් හඬ නැඟීම සඳහාත් මෙම අභියෝග ඉස්මතු කළ යුතු වේ.

ප්‍රධාන කාර්ය සාධන දර්ශක ක්‍රියාත්මක කිරීම සඳහා ඉවහල් වන පැහැදිලිව සකස් කරන ලද රාමුවක් නොමැති වීම හේතුවෙන් ඉලක්ක සපුරාලීමට ගන්නා උත්සාහයන් අතහැර දැමීම මෙන්ම අධීක්ෂණ  ක්‍රියාවලිය දුබල සහ සීමිත වීම සිදු වූ බව පසුගිය වසර දෙක තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රධාන කාර්ය සාධන දර්ශක සඳහා සිදු කරන ලද ඇගයීමේ ප්‍රතිඵල මගින් අනාවරණය වේ. එමෙන්ම,  ප්‍රධාන කාර්ය සාධන දර්ශක කිසිවක් සඳහා එම දර්ශකයන්ගේ නිර්වචන, අදාළ ක්‍රියාකාරකම් සහ එම දර්ශකවලට වගකිව යුතු පාර්ශ්ව පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු නොතිබුණු අතර, යම් කාර්ය සාධන දර්ශකයක් සඳහා වගකිව යුතු අමාත්‍යාංශය කුමක්දැයි හඳුනා ගැනීම ඒ හේතුවෙන් අභියෝගාත්මක විය. හිමිකාරිත්වය හෝ වගකීම නොමැතිකම නිසා බොහෝ අමාත්‍යාංශ ප්‍රගතිය පිළිබඳ තොරතුරු සැපයීමට සහ සීමිත ප්‍රගතිය සඳහා වගවීමට අපොහොසත් විය. අමාත්‍යාංශ විසින් සිදු කරන ලද තොරතුරු අනාවරණය කිරීම් දුර්වල ස්වභාවයක් ගත් අතර ප්‍රධාන කාර්ය සාධන දර්ශක කෙරෙහි ඇති වගවීම හීන වී ඇති බව ඉන් පිළිඹිබු විය. එය, මෙම වසරේදී ප්‍රධාන කාර්ය සාධන දර්ශක ඇගයීමේදී මුහුණපෑමට සිදු වූ විශාලතම අභියෝගය ද විය.

ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණයෙහි සාර්ථකත්වය තහවුරු කිරීම සඳහා අවශ්‍ය විය හැකි මෙහෙයුම් ක්‍රියාවලි වෙනුවෙන් නිසි පදනමක් නොයොදා එම අයවැයකරණය හඳුන්වා දීමට රජය හදිසි වීම, ඉහත සඳහන් අභියෝගවලට හේතුව වශයෙන් ඉස්මතු කර ඇත. ඊට අමතරව, ප්‍රධාන කාර්ය සාධන දර්ශක පිළිබඳ තොරතුරු අනාවරණය කිරීමේදී පැවති දුර්වල මට්ටම මගින් පෙන්නුම් කරනුයේ එවැනි ක්‍රියාකාරකම් මත වියදම් කරන මුදල් සම්බන්ධයෙන් රජය වගවීමට ලක් කිරීමේදී පුරවැසියන් හට මුහුණ දීමට සිදු වන අසීරු තත්ත්වයයි. එවැනි දෑ සම්බන්ධයෙන් රජය වගවීමට ලක් කිරීමට හැකි වීම පුරවැසියන් සතු අයිතිවාසිකමකි. එනිසා, අනාගතයේදී ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදු කිරීමේදී වඩා පැහැදිලි වාර්තාකරණ ව්‍යුහයන් සකස් කිරීම සහ මහජන මුදල් වියදම් කිරීම වඩා කාර්යක්ෂමව සිදු කිරීම සඳහා අධීක්ෂණ ආයතන ශක්තිමත් කිරීම යනාදි කාර්යක්ෂම යාන්ත්‍රණයන් භාවිතයට ගැනීම අවශ්‍ය වනු ඇත.

# ඇමුණුම්

## ඇමුණුම 1 තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත යටතේ ගොනු කරන ලද තොරතුරු ඉල්ලීම් පිළිබඳ විස්තර

| | රාජ්‍ය ආයතනය | ආයතනයේ භූමිකාව | ඉල්ලන ලද තොරතුරු |
|---|---|---|---|
| 1. | මුදල් අමාත්‍යාංශය | සියලුම ප්‍රධාන කාර්ය සාධන දර්ශකවලට අදාළ දත්ත සහ තොරතුරු රැස් කිරීමේ අධීක්ෂණ ආයතනය. | ▪ සියලුම ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය සම්බන්ධ තොරතුරු<br>▪ 2018, 2019 සහ 2020 යන වසරවල ප්‍රධාන කාර්ය සාධන දර්ශක 12 ප්‍රගතිය ඉදිරිපත් කළ අමාත්‍යාංශවල ලැයිස්තුව<br>▪ හඳුනාගෙන ඇති ව්‍යාපෘති/වැඩසටහන්වලට සම්බන්ධ ක්‍රියාකාරී සැලසුම් සහ මූල්‍ය ප්‍රගති වාර්තා පිළිබඳ විස්තර<br>▪ අමාත්‍යාංශයේ රාජකාරී අනුව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සහ වැඩසටහන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කරන ලද දත්ත සමුදායන් සහ තොරතුරු පද්ධති<br>▪ අධීක්ෂණ නියෝජිතායතනය ලෙස අමාත්‍යාංශය විසින් භාවිතා කරනු ලබන අභ්‍යන්තර මිනුම්/මිතික<br>▪ කිසිදු තොරතුරක් නොමැති නම් ඒ බව සඳහන් කර, තොරතුරු නොමැති වීමට හේතු ඇතුළත් නිල ලේඛන සපයන්න<br>▪ ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ කේන්ද්‍රීය ඒකකවල ලැයිස්තුව |

| | රාජ්‍ය ආයතනය | ආයතනයේ භූමිකාව | ඉල්ලන ලද තොරතුරු |
|---|---|---|---|
| **2.** | කාන්තා සහ ළමා සංවර්ධන, පෙර පාසල්, ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය | ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කරන ලද තොරතුරු පද්ධති නඩත්තු කිරීම සහ සියලුම ප්‍රධාන කාර්ය සාධන දර්ශකවලට අදාළ දත්ත සහ තොරතුරු රැස් කිරීම සඳහා අධීක්ෂණ ආයතනය | ▪ ප්‍රධාන කාර්ය සාධන දර්ශක 12 ප්‍රගතිය සම්බන්ධ තොරතුරු<br>▪ 2018, 2019 සහ 2020 යන වසරවල ප්‍රධාන කාර්ය සාධන දර්ශක 12 ප්‍රගතිය ඉදිරිපත් කළ අමාත්‍යාංශවල ලැයිස්තුව<br>▪ හඳුනාගෙන ඇති ව්‍යාපෘති/වැඩසටහන්වලට සම්බන්ධ ක්‍රියාකාරී සැලසුම් සහ මූල්‍ය ප්‍රගති වාර්තා පිළිබඳ විස්තර<br>▪ අමාත්‍යාංශයේ රාජකාරි අනුව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සහ වැඩසටහන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කරන ලද දත්ත සමුදායන් සහ තොරතුරු පද්ධති<br>▪ අධීක්ෂණ නියෝජිතායතනය ලෙස අමාත්‍යාංශය විසින් භාවිතා කරනු ලබන අභ්‍යන්තර මිනුම්/මිතික<br>▪ කිසිදු තොරතුරක් නොමැති නම් ඒ බව සඳහන් කර, තොරතුරු නොමැති වීමට හේතු ඇතුළත් නිල ලේඛන සපයන්න<br>▪ ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ කේන්ද්‍රීය ඒකකවල ලැයිස්තුව |
| **3.** | කම්කරු අමාත්‍යාංශය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 1 ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරන ආයතනය ලෙස හඳුනාගෙන ඇති අමාත්‍යාංශය | ▪ 2018, 2019 සහ 2020 වසරවල ශ්‍රම බලකායට සහභාගි වූ කාන්තා ප්‍රතිශතය<br>▪ 2018, 2019, සහ 2020 දී ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 1 හා සම්බන්ධව තිබූ කම්කරු අමාත්‍යාංශයේ ව්‍යාපෘති ලැයිස්තුව<br>▪ හඳුනාගෙන ඇති ව්‍යාපෘති/වැඩසටහන්වලට සම්බන්ධ ක්‍රියාකාරී සැලසුම් සහ මූල්‍ය ප්‍රගතිය/ ප්‍රගති වාර්තා පිළිබඳ විස්තර<br>▪ හඳුනාගත් ව්‍යාපෘති සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් වෙන් වශයෙන් රැස්කරගත් දත්ත<br>▪ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 1 ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම වෙනුවෙන් කම්කරු අමාත්‍යාංශය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ගවල තොරතුරු/ලේඛන<br>▪ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් කේන්ද්‍රීය ඒකකය සඳහා සබඳතා තොරතුරු<br>▪ අමාත්‍යාංශයේ රාජකාරි අනුව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සහ වැඩසටහන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කරන ලද දත්ත සමුදායන් සහ තොරතුරු පද්ධති<br>▪ කිසිදු තොරතුරක් නොමැති නම් ඒ බව සඳහන් කර, තොරතුරු නොමැති වීමට හේතු ඇතුළත් නිල ලේඛන සපයන්න |

| | රාජ්‍ය ආයතනය | ආයතනයේ භූමිකාව | ඉල්ලන ලද තොරතුරු |
|---|---|---|---|
| 4. | විදේශ රැකියා ප්‍රවර්ධන සහ වෙළඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 6 ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරන ආයතනය ලෙස හඳුනාගෙන ඇති අමාත්‍යාංශය | ▪ 2018, 2019 සහ 2020 වසරවලදී ආපසු පැමිණි කාන්තා විදෙස් ශ්‍රමිකයින් සහ ඉදිරියේදී විදෙස්ගත විය හැකි කාන්තා ශ්‍රමිකයින් සේවයේ යෙදවීම අරමුණු කරගත් ජාතික ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති සංඛ්‍යාව<br>▪ 2018, 2019, සහ 2020 දී ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 6 වෙත සම්බන්ධව විදේශ රැකියා ප්‍රවර්ධන සහ වෙළඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ව්‍යාපෘති ලැයිස්තුව<br>▪ හඳුනාගෙන ඇති ව්‍යාපෘති/වැඩසටහන්වලට සම්බන්ධ ක්‍රියාකාරී සැලසුම් සහ මූල්‍ය ප්‍රගතිය/ ප්‍රගති වාර්තා පිළිබඳ විස්තර<br>▪ හඳුනාගත් ව්‍යාපෘති සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් වෙන්ව රැස්කරගත් දත්ත<br>▪ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 6 ක්‍රියාත්මක කිරීම අධීක්ෂණයට විදේශ රැකියා ප්‍රවර්ධන සහ වෙළඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු/ලේඛන<br>▪ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් කේන්ද්‍රීය ඒකකය සඳහා සබඳතා තොරතුරු<br>▪ අමාත්‍යාංශයේ රාජකාරි අනුව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සහ වැඩසටහන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කරන ලද දත්ත සමුදායන් සහ තොරතුරු පද්ධති<br>▪ කිසිදු තොරතුරක් නොමැති නම් ඒ බව සඳහන් කර, තොරතුරු නොමැති වීමට හේතු ඇතුළත් නිල ලේඛන සපයන්න |

| | රාජ්‍ය ආයතනය | ආයතනයේ භූමිකාව | ඉල්ලන ලද තොරතුරු |
|---|---|---|---|
| 5. | රාජ්‍ය ආරක්ෂාක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 9 ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරන ආයතනය ලෙස හඳුනාගෙන ඇති අමාත්‍යාංශය | ▪ 2018, 2019 සහ 2020 වසරවල ගලවාගැනීම, සහන සැලසීම සහ පුනරුත්ථාපනය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ගැටළු ආමන්ත්‍රණය කෙරෙන බව සහතික කිරීමට යොදා ඇති සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ<br>▪ 2018, 2019, සහ 2020 වසරවලිදී ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 9 වෙත සම්බන්ධව තිබූ රාජ්‍ය ආරක්ෂාක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ව්‍යාපෘති ලැයිස්තුව<br>▪ හඳුනාගෙන ඇති ව්‍යාපෘති/වැඩසටහන්වලට සම්බන්ධ ක්‍රියාකාරී සැලසුම් සහ මූල්‍ය ප්‍රගතිය/ ප්‍රගති වාර්තා පිළිබඳ විස්තර<br>▪ හඳුනාගත් ව්‍යාපෘති සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් වෙන්ව රැස්කරගත් දත්ත<br>▪ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 9 ක්‍රියාත්මක කිරීම අධීක්ෂණයට රාජ්‍ය ආරක්ෂාක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු/ලේඛන<br>▪ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් කේන්ද්‍රීය ඒකකය සඳහා සබඳතා තොරතුරු<br>▪ අමාත්‍යාංශයේ රාජකාරී අනුව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සහ වැඩසටහන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කරන ලද දත්ත සමුදායන් සහ තොරතුරු පද්ධති<br>▪ කිසිදු තොරතුරක් නොමැති නම් ඒ බව සඳහන් කර, තොරතුරු නොමැති වීමට හේතු ඇතුළත් නිල ලේඛන සපයන්න |

| | රාජ්‍ය ආයතනය | ආයතනයේ භූමිකාව | ඉල්ලන ලද තොරතුරු |
|---|---|---|---|
| 6. | රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 7 ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරන ආයතනය ලෙස හඳුනාගෙන ඇති අමාත්‍යාංශය | ▪ 2018, 2019 සහ 2020 වසරවල ගලවාගැනීම, සහන සැලසීම සහ පුනරුත්ථාපනය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ගැටළු ආමන්ත්‍රණය කෙරෙන බව සහතික කිරීමට යොදා ඇති සහ ඵලදායි ලෙස ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ<br>▪ 2018, 2019, සහ 2020 දී ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 7 වෙත සම්බන්ධ කර ඇති රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ව්‍යාපෘති ලැයිස්තුව<br>▪ හඳුනාගෙන ඇති ව්‍යාපෘති/වැඩසටහන්වලට සම්බන්ධ ක්‍රියාකාරී සැලසුම් සහ මූල්‍ය ප්‍රගතිය/ ප්‍රගති වාර්තා පිළිබඳ විස්තර<br>▪ හඳුනාගත් ව්‍යාපෘති සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් වෙන්ව රැස්කරගත් දත්ත<br>▪ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 7 ක්‍රියාත්මක කිරීම අධීක්ෂණයට අමාත්‍යාංශය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු/ලේඛන<br>▪ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් කේන්ද්‍රීය ඒකක සඳහා සබඳතා තොරතුරු<br>▪ අමාත්‍යාංශයේ රාජකාරි අනුව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සහ වැඩසටහන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කරන ලද දත්ත සමුදායන් සහ තොරතුරු පද්ධති<br>▪ කිසිදු තොරතුරක් නොමැති නම් ඒ බව සඳහන් කර, තොරතුරු නොමැති වීමට හේතු ඇතුළත් නිල ලේඛන සපයන්න |

| | රාජ්‍ය ආයතනය | ආයතනයේ භූමිකාව | ඉල්ලන ලද තොරතුරු |
|---|---|---|---|
| 7. | අධිකරණ අමාත්‍යාංශය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 11 ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරන ආයතනය ලෙස හඳුනාගෙන ඇති අමාත්‍යාංශය | ▪ 2017, 2018, සහ 2019 දී සංශෝධනය කරන ලද, පනවන ලද, සහ/හෝ ක්‍රියාත්මක කරන ලද වෙනස් කොට සැලකීමේ නීති, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සංඛ්‍යාව<br>▪ ක්‍රියාකාරී සැලසුම් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කරන ලද දත්ත ද ඇතුළුව ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 11 වෙත සම්බන්ධව තිබූ අධිකරණ අමාත්‍යාංශයේ ව්‍යාපෘති ලැයිස්තුව<br>▪ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 11 ක්‍රියාත්මක වී ඇති මට්ටම<br>▪ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 11 අධීක්ෂණය සහ ක්‍රියාත්මක කිරීම සඳහා පවතින ඉදිරි සැලසුම්<br>▪ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 11 ක්‍රියාත්මක නොකිරීම සඳහා අදාළ ලේඛන<br>▪ අමාත්‍යාංශය සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් කේන්ද්‍රීය ඒකකය<br>▪ අමාත්‍යාංශයේ රාජකාරි අනුව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සහ වැඩසටහන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කරන ලද දත්ත සමුදායන් සහ තොරතුරු පද්ධති |

| | රාජ්‍ය ආයතනය | ආයතනයේ භූමිකාව | ඉල්ලන ලද තොරතුරු |
|---|---|---|---|
| 8. | මහජන ආරක්ෂක අමාත්‍යාංශය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 10 ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරන ආයතනය ලෙස හඳුනාගෙන ඇති අමාත්‍යාංශය | ▪ 2018, 2019, සහ 2020 වසරවල පොලිස් ස්ථානවල ස්ථාපනය කරන ලද, කාන්තා සහ ළමා ගැටලු සංවේදී හා එලදායි ලෙස හැසිරවීමට හැකියාව ඇති, කාන්තා හා ළමා කාර්යාංශ ඒකක සංඛ්‍යාව<br>▪ 2018, 2019, සහ 2020 දී ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 10 වෙත සම්බන්ධ කර ඇති මෙම අමාත්‍යාංශයේ ව්‍යාපෘති ලැයිස්තුව<br>▪ හඳුනාගෙන ඇති ව්‍යාපෘති/වැඩසටහන්වලට සම්බන්ධ ක්‍රියාකාරී සැලසුම් සහ මූල්‍ය ප්‍රගතිය/ ප්‍රගති වාර්තා පිළිබඳ විස්තර<br>▪ හඳුනාගත් ව්‍යාපෘති සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් වෙන්ව රැස්කරගත් දත්ත<br>▪ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 10 ක්‍රියාත්මක කිරීම අධීක්ෂණයට අමාත්‍යාංශය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු/ලේඛන<br>▪ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් කේන්ද්‍රීය ඒකකය සඳහා සබඳතා තොරතුරු<br>▪ අමාත්‍යාංශයේ රාජකාරි අනුව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සහ වැඩසටහන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කරන ලද දත්ත සමුදායන් සහ තොරතුරු පද්ධති<br>▪ කිසිදු තොරතුරක් නොමැති නම් ඒ බව සඳහන් කර, තොරතුරු නොමැති වීමට හේතු ඇතුළත් නිල ලේඛන සපයන්න |

| | රාජ්‍ය ආයතනය | ආයතනයේ භූමිකාව | ඉල්ලන ලද තොරතුරු |
|---|---|---|---|
| 9. | නිපුණතා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය<br><br>තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 4 ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරන ආයතනය ලෙස හඳුනාගෙන ඇති අමාත්‍යාංශ | ▪ 2018, 2019, සහ 2020 වසරවල ජාතික වෘත්තීය පුහුණු සහතිකය ලබා ගත් කාන්තාවන්ගේ ප්‍රතිශතය සහ තාක්ෂණික වෘත්තීය ක්ෂේත්‍රවල රැකියාවලට ඇතුළත් වූ කාන්තාවන් සංඛ්‍යාව<br><br>▪ 2018, 2019, සහ 2020 දී ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 4 වෙත සම්බන්ධව තිබූ මෙම අමාත්‍යාංශයේ ව්‍යාපෘති ලැයිස්තුව<br><br>▪ හඳුනාගෙන ඇති ව්‍යාපෘති/වැඩසටහන්වලට සම්බන්ධ ක්‍රියාකාරී සැලසුම්, මූල්‍ය ප්‍රගතිය/ ප්‍රගති වාර්තා පිළිබඳ විස්තර<br><br>▪ හඳුනාගත් ව්‍යාපෘති සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් වෙන්ව රැස්කරගත් දත්ත<br><br>▪ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 1 ක්‍රියාත්මක කිරීම අධීක්ෂණයට මෙම අමාත්‍යාංශය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු/ලේඛන<br><br>▪ ප්‍රධාන කාර්ය සාධන දර්ශක 4 ක්‍රියාත්මක කර ඇති මට්ටම<br><br>▪ ප්‍රධාන කාර්ය සාධන දර්ශක 4 අධීක්ෂණය සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන ඉදිරි සැලසුම්<br><br>▪ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් කේන්ද්‍රීය ඒකකය සඳහා සබඳතා තොරතුරු<br><br>▪ අමාත්‍යාංශයේ රාජකාරි අනුව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සහ වැඩසටහන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කරන ලද දත්ත සමුදායන් සහ තොරතුරු පද්ධති<br><br>▪ කිසිදු තොරතුරක් නොමැති නම් ඒ බව සඳහන් කර, තොරතුරු නොමැති වීමට හේතු ඇතුළත් නිල ලේඛන සපයන්න |

| | රාජ්‍ය ආයතනය | ආයතනයේ භූමිකාව | ඉල්ලන ලද තොරතුරු |
|---|---|---|---|
| 10. | කර්මාන්ත අමාත්‍යාංශය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 5 ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරන ආයතනය ලෙස හඳුනාගෙන ඇති අමාත්‍යාංශය | ▪ 2018, 2019, සහ 2020 වසරවල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය/සහනාධාර භාවිතා කරමින් තිරසර ව්‍යවසායන්ගේ නියැලෙන කාන්තා ව්‍යවසායකයින් සංඛ්‍යාව<br>▪ ක්‍රියාකාරී සැලසුම් සහ ස්ත්‍රී පුරුෂභාවය අනුව වෙන් කරන ලද දත්ත ද ඇතුළුව ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 5 වෙත සම්බන්ධ කර ඇති ව්‍යාපෘති ලැයිස්තුව<br>  ▪ ක්‍රියාකාරී සැලසුම් හෝ මූල්‍ය ප්‍රගතිය සම්බන්ධ විස්තර<br>  ▪ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් වෙන්ව දක්වන දත්ත<br>▪ ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගන්නා ලද අභ්‍යන්තර ක්‍රියාමාර්ග/පියවර<br>▪ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් කේන්ද්‍රීය ඒකක සඳහා සබඳතා තොරතුරු<br>▪ කිසිදු තොරතුරක් සැපයිය නොහැකි නම්, කරුණාකර මෙය තහවුරු කරන නිල ලේඛන ලබා දෙන්න |

## ඇමුණුම 2 ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල විස්තරාත්මක විශ්ලේෂණය

| ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 1: ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්ව ප්‍රතිශතයේ වැඩිවීම | | |
|---|---|---|
| **ප්‍රගතියේ වර්ගීකරණය** | **පිරිහී යන ප්‍රගතිය**[18] | **මූලාශ්‍ර:**<br>කම්කරු අමාත්‍යාංශය<br>ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (DCS)<br>මුදල් අමාත්‍යාංශය<br>කාන්තා සහ ළමා සංවර්ධන, පෙර පාසල්, ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය |

### ලබාගත් තොරතුරුවල සාරාංශය

1.1

තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන්, කම්කරු අමාත්‍යාංශය විසින් 2018, 2019 සහ 2020 සඳහා කාන්තා ශ්‍රම බලකායේ වාර්ෂික සහභාගිත්ව අනුපාතය පිළිබඳ තොරතුරු සපයන ලදී.

මාර්ගගත සෙවීම් හරහා පෙනී යන පරිදි, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2018, 2019, සහ 2020 සඳහා කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්වය පිළිබඳව තොරතුරු ලැයිස්තුගත කර ඇත.

ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්වය

| වර්ෂය | කම්කරු අමාත්‍යාංශය | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව |
|---|---|---|
| 2018 | සියයට 34.9 | සියයට 33.6 |
| 2019 | සියයට 35.4 | සියයට 34.5 |
| 2020 | සියයට 33.9 | සියයට 32.0 |

2018, 2019 සහ 2020 වසර සඳහා රැකියා සුරක්ෂිතභාවය සහ කාන්තා ශ්‍රමිකයින්ගේ යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද වැඩසටහන් ද කම්කරු අමාත්‍යාංශය විසින් ලැයිස්තුගත කර ඇත. එම වැඩසටහන් පිළිබඳ සාරාංශය, වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන සහ ප්‍රතිලාභීන් පහත දැක්වේ.

### ලැබුණු තොරතුරු පිළිබඳ අදහස්

මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ඇගයීමේදී, කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්වය වාර්ෂිකව සියයට 0 සහ සියයට 10 අතර වැඩිවීමක් පෙන්නුම් කරන ලද්දේ නම් එය දුර්වල ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදී. සියයට 10 ට වැඩි වර්ධනයක් ශක්තිමත් ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදී.

1.1

කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්වයේ ප්‍රතිශතය 2019 සිට 2020 දක්වා සියයට 1.5 කින් අඩු වී ඇති බව කම්කරු අමාත්‍යාංශය විසින් සපයනු ලබන තොරතුරු පෙන්වා දෙයි. කෙසේ වෙතත්, කම්කරු අමාත්‍යාංශය විසින් සපයන ලද සංඛ්‍යාවන් සහ ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව වෙතින් ලබාගත් තොරතුරු අතර යම් විෂමතාවක් පවතී. ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව වෙතින් මාර්ගගතව පිවිසිය හැකි තොරතුරුවලට අනුව 2019 සිට 2020 දක්වා කාලය තුළ කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්වය සියයට 2.5 කින් අඩු වී ඇත. ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ තොරතුරු යනු මහ බැංකුව වැනි රාජ්‍ය ආයතන සහ ලෝක බැංකුව වැනි ජාත්‍යන්තර සංවිධාන විසින් භාවිතා කරනු ලබන නිල

| වර්ෂය | වැඩසටහන | මූල්‍ය ප්‍රතිපාදන | ප්‍රතිලාභීන් සංඛ්‍යාව (කාන්තා) |
|---|---|---|---|
| 2018 | කාන්තා දිනය හා සමගාමී වැඩසටහන් | රු. 1,004,492 | |
| | රාත්‍රී සේවය සඳහා කාන්තාවන් යොදා ගැනීම පිළිබඳ විමර්ශනය කිරීම | රු. 246,500 | 5943 |
| | මනෝ විද්‍යා උපදේශන වැඩමුළුව | රු 42,600 | |
| | සේවා ස්ථානවල ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් ප්‍රචණ්ඩත්වය සමාලෝචනය කරන වැඩමුළුව | රු. 31,200 | |
| එකතුව | | රු.1,324,792 | |
| 2019 | කම්කරු නීතිය පිළිබඳව පුද්ගලික අංශයේ මානව සම්පත් නිලධාරීන් දැනුවත් කිරීම | රු 149,073 | |
| | කාන්තාවන්, තරුණයින් සහ ළමුන්ගේ ආරක්ෂාව සඳහා වෙනත් සංවිධාන විසින් සිදු කරනු ලබන කාර්යයන් සඳහා සහය වීම | | |
| | පුද්ගලික අංශයේ සේවා නියුක්තිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම (වැඩසටහන් 4ක්) | රු. 134,600 | 208 |
| | ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳව දැනුවත් කිරීම මගින් කාන්තා සේවා නියුක්තිකයින්ගේ ධාරිතාව ගොඩ නැඟීම | රු 110,800 | 75 |
| | වතුකරයේ සේවා නියුක්තිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් (කාන්තා කම්කරු නීති සහ කාන්තාවන් මුහුණ දෙන ගැටළු පිළිබඳව) (වැඩසටහන් 3ක්) | රු. 100,765 | 106 |
| එකතුව | | රු. 495,238 | |
| 2020 | කාන්තා දිනය හා සමගාමී වැඩසටහන් | රු 114,275 | |
| එකතුව | | රු 1,14,275 | |

සංඛ්‍යාලේඛන වන බැවින් මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ඇගයීමේදී, ඇගයීමේ කණ්ඩායම විසින් එම තොරතුරු භාවිතා කරනු ඇත.

කම්කරු අමාත්‍යාංශය විසින් 2018, 2019 හෝ 2020 දී දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද වැඩසටහන් සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කරන ලද දත්ත ලබා නොදෙන ලදි. එබැවින් පිරිමින්ට සාපේක්ෂව කාන්තාවන් මෙම වැඩසටහන් තුළින් ප්‍රතිලාභ ලබාගත්තේදැයි ඇගයීම අසීරු කරුණකි. මීට අමතරව, ලැයිස්තුගත කර ඇති වැඩසටහන් මුළුමනින්ම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 1 සඳහා අදාළ නොවන බවත්, වක්‍රාකාරව පමණක් ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්වයට දායක වූ බවත් අමාත්‍යාංශය විසින් සඳහන් කරන ලදි. කාන්තා සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම 'කම්කරු දෙපාර්තමේන්තුවේ විෂය පථයට සහ අරමුණුවලට ඔබ්බෙන් පවතින්නක්' බව ද අමාත්‍යාංශය ප්‍රකාශ කළේය.[19]

1.2

මෙම වැඩසටහන් මගින් ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්වයේ ප්‍රතිශතය වැඩි කිරීම කෙරෙහි මෙම වැඩසටහන් සෘජුවම බලපෑවේ ද යනන් පැහැදිලි නොවූ බැවින් මුදල් අමාත්‍යාංශය විසින් සපයන ලද තොරතුරු මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ඇගයීමේදී භාවිතා කළ නොහැක. මීට අමතරව, ලබාදුන් තොරතුරු අදාළ වූයේ 2018 වසරට පමණක් වූ බැවින් ප්‍රධාන කාර්ය සාධන දර්ශකයේ ප්‍රගතිය ඇගයීම ද අසීරු විය.

1.3

2020 වසරේදී ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 1 සඳහා අමාත්‍යාංශය විසින් සිදු කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් දරන

1.2

තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන්, ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 1 ට අදාළව 2018 වසරේදී ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් තම විෂය පථයට අදාළව සිදු කරන ලද වැඩසටහන් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය වෙත ලබා දෙන ලද තොරතුරු ඉදිරිපත් කරන ලදි.

| **ඒකාබද්ධ සේවාවන්** | **නිලධාරිනියන් සංඛ්‍යාව** | **නිලධාරීන් සංඛ්‍යාව** | **නිලධාරිනියන්ගේ ප්‍රතිශතය** |
|---|---|---|---|
| ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය | 1,107 | 648 | 63.07 |
| රජයේ භාෂා පරිවර්තක සේවය | 145 | 136 | 51.06 |
| ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය | 154 | 20 | 88.50 |
| සංවර්ධන නිලධාරී සේවය | 27,142 | 10,905 | 71.54 |
| කළමනාකරණ සේවා නිලධාරී සේවය | 20,180 | 7,408 | 73.15 |
| ඒකාබද්ධ රියදුරු සේවය | | 8,650 | |
| කාර්යාල සේවක සේවය | 6,013 | 9,813 | 38 |

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ අයවැයකරණය සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 1 ආශ්‍රිත තොරතුරු සම්බන්ධයෙන් ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු ද මුදල් අමාත්‍යාංශය විසින් සපයන ලදි. ලබා දුන් තොරතුරුවල සාරාංශය පහත දක්වා ඇත:

| **ප්‍රධාන කාර්ය සාධන දර්ශකය** | **වැඩසටහන** | **භෞතික ප්‍රගතිය** | **මූල්‍යමය ප්‍රගතිය** |
|---|---|---|---|
| ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්වයේ ප්‍රතිශතය වැඩි කිරීම | විවිධ සේවා යටතේ අලුතින් බඳවා ගන්නා කාන්තාවන් සංඛ්‍යාව වැඩි කිරීම | සියයට 40 | දෙපාර්තමේන්තුව වෙත දැනට ලැබී ඇති ප්‍රතිපාදන යොදා ගනිමින් කටයුතු සිදු කර ඇත |

1.3

2018-2020 කාලය තුළ මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකයට අදාළව වැඩසටහන් තුනක් පැවැත්වූ බව තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් කාන්තා සහ ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින්[21] ප්‍රකාශ කරන ලදි. මෙම වැඩසටහන් ආදර්ශ ගම්මාන ව්‍යාපෘති, පරිසර සංචාරක ව්‍යාපෘති සහ ස්වයං රැකියා හා සම්බන්ධ වේ. 2018/2019 සඳහා මුළු මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 28.03 ක් ද 2019 සඳහා රු. මිලියන 2.106 ක් ද වූ අතර 2020 සඳහා එය රු. මිලියන 0.018 ක් විය.

ලද මූල්‍ය වියදම් අඩු වී ඇති බව කාන්තා සහ ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් සපයන ලද තොරතුරුවල සඳහන්ව ඇත. 2020 සඳහා මුළු වියදම රු. මිලියන 0.018 ක් වූ අතර, එය 2019 ට සාපේක්ෂව සියයට 99 ක අඩුවීමකි.

මුදල් අමාත්‍යාංශය සහ කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයෙන් භාවිතා කළ හැකි තොරතුරු කිසිවක් ලබා නොගත හැකි වූ බැවින්, මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ඇගයීම සඳහා ඇගයීම් කණ්ඩායම විසින් හුදෙක් ජනසංඛ්‍යා හ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අන්තර්ජාල අඩවිය හරහා පිවිසිය හැකි තොරතුරු මත පමණක් විශ්වාසය තබා ඇත. 2019 සිට 2020 දක්වා කාලය තුළ ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්වය සියයට 2.5 කින් අඩු වී ඇති බැවින්, මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය පිරිහී යන ප්‍රගතියක් පෙන්වන දර්ශකයක් ලෙස වර්ගීකරණය කර ඇත.

| ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 2: මූලයාධාර වැඩසටහන් මගින් නිවාස ඉදිකර ඇති ස්ත්‍රී මූලික කුටුම්භයන් සංඛ්‍යාවේ වැඩි වීම | | |
|---|---|---|
| **ප්‍රගතියේ වර්ගීකරණය** | **තොරතුරු අනාවරණය කර නොමැත** | **මූලාශ්‍ර:**<br>නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය<br>කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය<br>මුදල් අමාත්‍යාංශය |

## ලබාගත් තොරතුරුවල සාරාංශය

2.1

තොරතුරු දැනගැනීමේ ඉල්ලීම්වලට ප්‍රතිචාර ලෙස නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය විසින් පවසන ලද්දේ තම අමාත්‍යාංශය 2020 අගෝස්තු මස ස්ථාපනය කරන ලද බැවින් එය නිවාස ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභීන් තේරීමට සම්බන්ධ නොවූ බවයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙම තොරතුරු ලබාගැනීමේ ඉල්ලීම ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය වෙත මාරු කර යවන ලද නමුත් මෙතෙක් එම රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඒ සඳහා ප්‍රතිචාරයක් ඉදිරිපත් කර නොමැත.

තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට තවත් ප්‍රතිචාරයක් වශයෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් මෙම ඉල්ලීම වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය වෙත මාරු කර යවන ලදි. ඊට ප්‍රතිචාර වශයෙන් රාජ්‍ය අමාත්‍යාංශය විසින් මූලයාධාර වැඩසටහන් හරහා නිවාස ඉදිකර ඇති කාන්තා මූලික කුටුම්භ සංඛ්‍යාව ඉහළ නැංවීමට ගෙන ඇති පියවර පිළිබඳ විස්තර සපයන ලදි.

| වර්ෂය | නිවාස ව්‍යාපෘති ගණන | කාන්තා මූලික කුටුම්භ සංඛ්‍යාව |
|---|---|---|
| 2018 | 30 | 197 |
| 2019 | (ක්‍රියාත්මක නොවීය) | (ක්‍රියාත්මක නොවීය) |
| 2020 | 7 | 28 |

2.3

කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ අන්තර්ජාල අඩවිය මගින් ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 2 සම්බන්ධයෙන් පවත්වනු ලැබූ වැඩසටහන් පිළිබඳ තොරතුරු සපයන ලදි. 2018, 2019 සහ 2020 වර්ෂවල දී කාන්තා ගෘහ මූලිකයින් වෙනුවෙන් සමාජ සවිබල ගැන්වීම පිළිබඳ එක් වැඩසටහනක් පවත්වන ලදි. මෙම වැඩසටහන සඳහා 2020 වසරේ සිදු කරන ලද මුළු වියදම රු. මිලියන 0.225 කි.

## ලැබුණු තොරතුරු පිළිබඳ අදහස්

මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ඇගයීමේදී, කාන්තා මූලික කුටුම්භ සංඛ්‍යාවේ වාර්ෂික වර්ධනය සියයට 0 සිට සියයට 10 අතර පැවතීම දුර්වල ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදි. සියයට 10 ට වැඩි වර්ධනයක් ශක්තිමත් ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදි.

2.1

වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය වෙතින් ඉල්ලා සිටින ලද තොරතුරු සඳහා 2022 පෙබරවාරි 10 ලෙස දින යොදා තිබූ අතර, එය තොරතුරු දැනගැනීමේ අයිතියි යටතේ වූ ප්‍රතිචාර ලැබීම සඳහා ඇගයීම් කණ්ඩායම විසින් නියම කරන ලද කඩයිම් කාලය (2022 ජනවාරි 31) ඉක්මවන ලදි. එබැවින්, මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය සඳහා ප්‍රගතිය වර්ගීකරණය කිරීමේදී මෙම තොරතුරු භාවිතා නොකෙරේ. කෙසේ වෙතත්, එය භාවිතයට ගනු ලබන්නේ නම්, 2018 සිට 2020 දක්වා කාලය තුළ නිවාස ව්‍යාපෘති හරහා නිවාස ඉදිකර ඇති කාන්තා මූලික කුටුම්භ සංඛ්‍යාව සියයට 85.7 කින් අඩු වී ඇති බැවින් ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 2 'පිරිහෙන ප්‍රගතියක්' ඇති දර්ශකයක් ලෙස වර්ගීකරණය වනු ඇත.

| වර්ෂය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය | වැඩසටහන | භෞතික ප්‍රගතිය | මූල්‍යමය ප්‍රගතිය |
|---|---|---|---|---|
| 2018 | මූලයාධාර වැඩසටහන් මගින් නිවාස ඉදිකර ඇති ස්ත්‍රී මූලික කුටුම්භයන් සංඛ්‍යාවේ වැඩි වීම | කාන්තා ගෘහ මූලිකයින් සඳහා සමාජ සවිබල ගැන්වීමේ වැඩසටහන | | |
| 2019 | | කාන්තා ගෘහ මූලිකයින් සඳහා සමාජ සවිබල ගැන්වීමේ වැඩසටහන | 8 | රු.7,000,000 |
| 2020 | | කාන්තා ගෘහ මූලිකයින් සඳහා සමාජ සවිබල ගැන්වීමේ වැඩසටහන | 1 | රු. 225,000 |

කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයේ අන්තර්ජාල අඩවිය හරහා 2019 වසර සඳහා කාන්තා මූලික කුටුම්භ සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ද ලබා දී ඇත.

| වර්ෂය | කාන්තා මූලික කුටුම්භ සංඛ්‍යාව | කාන්තා මූලික කුටුම්භයන්ගේ ප්‍රතිශතය |
|---|---|---|
| 2019 | 1,436,000 | 25.20 |

2.2

කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ අන්තර්ජාල අඩවිය හරහා ලබාගත් තොරතුරුවල මූලයාධාර වැඩසටහන් හරහා නිවාස ඉදිකර ඇති කාන්තා මූලික කුටුම්භ සංඛ්‍යාව සඳහන් කර නොමැති බැවින් ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 2 හි ප්‍රගතිය තක්සේරු කිරීමට එය භාවිතා කළ නොහැක. මීට අමතරව, එලෙස ලැබුණු තොරතුරු 2019 වසරට පමණක් අදාළ වූ බැවින් මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ඇගයීම අසීරු විය.

කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයෙන් භාවිතයට ගත හැකි තොරතුරු කිසිවක් ලබා ගත නොහැකි වූ බැවින් ද, මුදල් අමාත්‍යාංශය වෙතින් කිසිදු තොරතුරක් නොලැබුණු බැවින් ද, වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයෙන් සපයන ලද තොරතුරු කඩයිම් දිනයට පසුව ලැබීම හේතුවෙන් එය භාවිතයට නොගන්නා නිසාත් මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය තොරතුරු **අනාවරණය කර නොමැති දර්ශකයක්** ලෙස වර්ගීකරණය කර ඇත.

| ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 3: ස්ත්‍රී පුරුෂභාවය මත පදනම්ව වෙන වෙන් දත්ත ලබාගත හැකි දත්ත පද්ධති පවත්වාගෙන යනු ලබන රාජ්‍ය ආයතන සංඛ්‍යාව | | |
|---|---|---|
| **ප්‍රගතියේ වර්ගීකරණය** | **තොරතුරු අනාවරණය කර නොමැත** | **මූලාශ්‍ර:**<br>කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය<br>මුදල් අමාත්‍යාංශය |

## ලබාගත් තොරතුරුවල සාරාංශය

3.1

තොරතුරු ලබාගැනීමේ ඉල්ලීම්වලට ප්‍රතිචාරයක් ලෙස මුදල් අමාත්‍යාංශය වෙතින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් වෙන්ව දක්වන දත්ත පවත්වාගෙන යනු ලබන අමාත්‍යාංශවල ලැයිස්තුවක් නොලැබුණි කෙසේ වෙතත්, මුදල් අමාත්‍යාංශය විසින් ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් ලබා දෙන ලද තොරතුරු ඇතුළත් කර ඇති අතර, ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 3 සම්බන්ධයෙන් 2018 දී එක් වැඩසටහනක් පවත්වන ලද බව එහි සඳහන් විය.

| **ප්‍රධාන කාර්ය සාධන දර්ශකය** | **වැඩසටහන** | **භෞතික ප්‍රගතිය** | **මූල්‍යමය ප්‍රගතිය** |
|---|---|---|---|
| ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කරන දත්ත පද්ධති පවත්වාගනු ලබන රාජ්‍ය ආයතන ගණන | මානව සම්පත් දත්ත ගබඩාවෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය ආශ්‍රිත තොරතුරු වෙන්කර හඳුනා ගැනීමේ හැකියාව පරීක්ෂා කිරීම | සියයට 100 | දෙපාර්තමේන්තුව වෙත දැනට ලැබී ඇති ප්‍රතිපාදන යොදා ගනිමින් කටයුතු සිදු කර ඇත |

3.2

2019 සහ 2020 දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් වෙන්ව සඳහන් දත්ත සමුදායන් ඉදිරිපත් කිරීම සඳහා කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් අනෙකුත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වෙත සිහිකැඳවීම් යොමු කළ ද, ඒ හා සම්බන්ධ වාර්තාකරණය "අපේක්ෂා කළ පරිදි සිදු නොවූ" බව එම අමාත්‍යාංශය විසින් තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් දක්වන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් වෙන්ව දක්වන ලද දත්ත රැස් කිරීම ස්ථාපිත කිරීම සඳහා සියලුම අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සඳහා අදාළ වන ජාතික ප්‍රතිපත්තියක් 2020 දී ක්‍රියාත්මක කරන ලදි. ඊට අදාළ පුහුණු කිරීමේ වැඩසටහන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කිරීමට නියමිතව තිබූ අතර, වැඩසටහන සඳහා ප්‍රවේශයක් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල අයවැයකරණය ඇතුළත් අත්පොතක් ඔවුන් අතර බෙදා හැරීමට නියමිතය.

## ලැබුණු තොරතුරු පිළිබඳ අදහස්

මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ඇගයීමේදී, ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් වෙන්ව දක්වන ලද දත්ත පද්ධති පවත්වාගෙන යනු ලබන රාජ්‍ය ආයතන සංඛ්‍යාවේ වාර්ෂික වර්ධනය සියයට 0 සිට සියයට 10 අතර පැවතීම දුර්වල ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදි. සියයට 10 ට වැඩි වර්ධනයක් ශක්තිමත් ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදී.

3.1

ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 3 සම්බන්ධයෙන් පවත්වන ලද වැඩසටහනෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් වෙන්ව දක්වන ලද දත්ත පද්ධති පවත්වාගෙන යන රාජ්‍ය ආයතන සංඛ්‍යාව සඳහන් නොවන බැවින් මුදල් අමාත්‍යාංශය විසින් සපයන ලද තොරතුරු ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 3 ඇගයීමේදී භාවිතා කළ නොහැක. මීට අමතරව, ලබාදුන් තොරතුරු 2019 වසරට පමණක් අදාළ වූ බැවින් මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ඇගයීම අසීරු විය.

3.2

මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය හා සම්බන්ධ වාර්තාකරණය දුර්වල මට්ටමක පවතින බව කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය දන්නා බැවින් එම අමාත්‍යාංශය විසින් සපයන ලද තොරතුරු මෙහිදී වැදගත් වේ. මෙම වසර තුළ ලැබූ තොරතුරු හිඟ වීම තුළ වාර්තාකරණයේ පවතින මෙම දුර්වලතා දැක ගත හැක.

කෙසේ වෙතත්, කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සහ මුදල් අමාත්‍යාංශය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් වෙන්ව ඇති දත්ත පද්ධති පවත්වාගෙන යනු ලැබූ රාජ්‍ය අධිකාරීන් පිළිබඳ ලැයිස්තුවක් (පිළිවෙලින් ආයතන 12 ක් සහ එක් ආයතනයක්) ලබා දෙන ලදි.

ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 3 සම්බන්ධයෙන් අධීක්ෂණ අමාත්‍යාංශ දෙකෙන් එකක් හෝ භාවිතා කළ හැකි තොරතුරු ඉදිරිපත් කර නොමැති බැවින්, මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය **තොරතුරු අනාවරණය කර නොමැති දර්ශකයක්** ලෙස ලෙස වර්ගීකරණය කර ඇත.

| ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 4: ජාතික වෘත්තීය පුහුණු සහතිකය (NVQ) ලබාගෙන කාර්මික සහ වෘත්තිමය ක්ෂේත්‍රයන්හි රැකියා සඳහා අවතීර්ණ වන කාන්තාවන්ගේ ප්‍රතිශතය ඉහළ යාම | | |
|---|---|---|
| **ප්‍රගතියේ වර්ගීකරණය** | **තොරතුරු අනාවරණය කර නොමැත** | **මූලාශ්‍ර:**<br>තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය<br>මුදල් අමාත්‍යාංශය<br>කාන්තා සහ ළමා සංවර්ධන, පෙර පාසල්, ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය<br>නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය |

## ලබාගත් තොරතුරුවල සාරාංශය

4.1

තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන්, ජාතික තරුණ සේවා සභාව විසින් සපයන ලද තොරතුරු මත පදනම්ව, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ජාතික වෘත්තීය පුහුණු සහතිකය ලබා ගත් කාන්තාවන්ගේ ප්‍රතිශතය සහ 2018, 2019 සහ 2020 වසරවල කාන්තාවන් ලැබූ රැකියා පත්වීම්වල එකතුව පිළිබඳ තොරතුරු ලබා දෙන ලදී.

| | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| ජාතික වෘත්තීය පුහුණු සහතිකය ලබා ගත් කාන්තාවන් සංඛ්‍යාව | 1,263 | 1,185 | 905* |
| ජාතික වෘත්තීය පුහුණු සහතිකය ලබා ගත් කාන්තාවන්ගේ ප්‍රතිශතය | 67.9 | 66.0 | 42.7 |
| රැකියා පත්වීම් ලැබූ කාන්තාවන් සංඛ්‍යාව | 275 | අ/නො | 83* |
| රැකියා පත්වීම් ලැබූ කාන්තාවන්ගේ ප්‍රතිශතය | 88.7 | අ/නො | 30.4* |

* දත්ත එක් රැස් කිරීම තව දුරටත් සිදු වෙමින් පවතී

4.2

තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් මුදල් අමාත්‍යාංශය විසින් ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ තොරතුරු ඇතුළත් කර ඇති අතර, ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 4 සම්බන්ධයෙන් 2018 දී එක් වැඩසටහනක් පැවැත්වූ බව එහි සඳහන් වේ.

## ලැබුණු තොරතුරු පිළිබඳ අදහස්

මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ඇගයීමේදී, ජාතික වෘත්තීය පුහුණු සහතිකය ලබා ගත් කාන්තාවන්ගේ සංඛ්‍යාවේ වාර්ෂික වර්ධනය සියයට 0 සිට සියයට 10 අතර පැවතීම දුර්වල ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදී. සියයට 10 ට වැඩි වර්ධනයක් ශක්තිමත් ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදී.

4.1

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ජාතික වෘත්තීය පුහුණු සහතිකය ලබා ගන්නා කාන්තාවන්ගේ ප්‍රතිශතය සහ රැකියා පත්වීම් පිළිබඳ තොරතුරු ලබාදී ඇත්තේ ජාතික තරුණ සේවා සභාව ආශ්‍රිතව පමණි එහි ප්‍රතිඵලයක් ලෙස, මෙහිදී ප්‍රගතිය ඇගයීම සිදු කළ හැකි වන්නේ මෙම අමාත්‍යාංශය විසින් සපයන ලද තොරතුරු සම්බන්ධයෙන් පමණි

2020 සඳහා දත්ත රැස්කිරීම් තව දුරටත් සිදුවෙමින් පවතින බැවින් ජාතික වෘත්තීය පුහුණු සහතිකය ලබාගන්නා කාන්තාවන්ගේ ප්‍රතිශතය පිළිබඳව තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් සපයන ලද තොරතුරු ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 4 තක්සේරු කිරීම සඳහා භාවිත කළ නොහැක.

| ප්‍රධාන කාර්ය සාධන දර්ශකය | වැඩසටහන | භෞතික ප්‍රගතිය | මූල්‍යමය ප්‍රගතිය |
|---|---|---|---|
| ජාතික වෘත්තීය පුහුණු සහතිකය ලබාගන්නා සහ තාක්ෂණික සහ වෘත්තීය ක්ෂේත්‍රවල රැකියාවලට පිවිසෙන කාන්තාවන්ගේ ප්‍රතිශතය වැඩි වීම | 2016 සහ 2018 ජාතික වෘත්තීය පුහුණු පාඨමාලාව සඳහා බඳවාගත් අය අතුරින් කාන්තාවන් හඳුනා ගැනීම | සියයට 57 | දෙපාර්තමේන්තුව වෙත දැනට ලැබී ඇති ප්‍රතිපාදන යොදා ගනිමින් කටයුතු සිදු කර ඇත |

4.3

තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන්, කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 4 ට අදාළව 2018 දී පවත්වන ලද එක් වැඩසටහනක් පිළිබඳව තොරතුරු ලබා දෙන ලදී.

| ප්‍රධාන කාර්ය සාධන දර්ශකය | වැඩසටහන | භෞතික ප්‍රගතිය | මූල්‍යමය ප්‍රගතිය |
|---|---|---|---|
| ජාතික වෘත්තීය පුහුණු සහතිකය (NVQ) සහ ප්‍රමිතීන් සමඟින් තාක්ෂණ ක්ෂේත්‍රයට පිවිසෙන කාන්තාවන්ගේ ප්‍රතිශතයේ වර්ධනය | දිවා සුරැකුම් මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩල සඳහා පුහුණු කිරීමේ වැඩසටහන | 380 | තොරතුරු නැත |

4.4

තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන්, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන අමාත්‍යාංශය විසින් 2018, 2019, සහ 2020 වසරවල වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම පිළිබඳ තොරතුරු සපයන ලදී.

| 2018 | | 2019 | | 2020 | |
|---|---|---|---|---|---|
| පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී |
| 49,194 | 73,315 | 49,903 | 74,828 | 31,244 | 49,065 |

මීට අමතරව, තාක්ෂණික සහ වෘත්තීය ක්ෂේත්‍රවල රැකියා සඳහා ඇතුළත් වන කාන්තාවන්ගේ සංඛ්‍යාව පිළිබඳව කිසිදු තොරතුරක් තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ලබා දී නොමැත. එනිසා

මෙම දර්ශකයේ ප්‍රගතිය පිළිබඳ නිවැරදි ඇගයීමක් සිදු කළ නොහැක.

4.2

මුදල් අමාත්‍යාංශය විසින් ලබා දෙන ලද තොරතුරුවල දක්වා ඇති වැඩසටහන මගින් ජාතික වෘත්තීය පුහුණු සහතිකය ලබා ගත් කාන්තාවන්ගේ සංඛ්‍යාව පිළිබඳ විස්තරාත්මක තොරතුරු ලබා නොදෙන බැවින් එම තොරතුරු, ප්‍රගතිය ඇගයීමේදී භාවිතා කළ නොහැක. මීට අමතරව, එම තොරතුරු 2018 වසරට පමණක් අදාළ වූ බැවින් මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ඇගයීම අසීරු විය.

4.3

කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් සපයන ලද තොරතුරුවල සඳහන් කර තිබූ වැඩසටහන මගින් ජාතික වෘත්තීය පුහුණු සහතිකය ලබා ගත් කාන්තාවන්ගේ සංඛ්‍යාව පිළිබඳ විස්තරාත්මක තොරතුරු ලබා නොදෙන බැවින් ද මෙම වැඩසටහන ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 3 සමඟ සෘජුව සම්බන්ධ වන්නේ කෙසේ ද යන්න පැහැදිලි නොවන බැවින් ද එම තොරතුරු ප්‍රගතිය ඇගයීමේදී භාවිතා කළ නොහැක. මීට අමතරව, එම තොරතුරු 2018 වසරට පමණක් අදාළ වූ බැවින් මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ඇගයීම අසීරු විය.

වෘත්තීය පුහුණුව අවසන් කළ සිසුන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ද අමාත්‍යාංශය විසින් ලබා දෙන ලදි.

| 2018 | | 2019 | | 2020 | |
|---|---|---|---|---|---|
| **පුරුෂ** | **ස්ත්‍රී** | **පුරුෂ** | **ස්ත්‍රී** | **පුරුෂ** | **ස්ත්‍රී** |
| 39,705 | 54,704 | 41,252 | 58,245 | 25,414 | 35,594 |

පුහුණුව අවසන් කරන සෑම අයෙක්ම ඔවුන්ගේ රැකියා තත්ත්වය පිළිබඳ වැඩිදුර තොරතුරු සම්බන්ධයෙන් ප්‍රතිචාර නොදක්වන / ලබා නොදෙන බැවින් වෘත්තීය පුහුණුව අවසන් කර රැකියා ලබා ගැනීමට හැකි වූ කාන්තාවන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු අපට ලබා දීමට නොහැකි බව එම අමාත්‍යාංශය විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි.

4.4

පෙර වසර සමඟ සංසන්දනය කළ විට, තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය වෙත ගොනු කරන ලද ඉල්ලීම් සඳහා ප්‍රතිචාරය ලැබුණේ ඇගයීම් කණ්ඩායම තොරතුරු ලබාගැනීමේ කඩයිම ලෙස සලකුණු කර සිටි 2022 ජනවාරි 31 දිනට පසුව ය (2021 ඔක්තෝබර් 18 වන දින ඉල්ලීම ගොනු කරන ලදි). එබැවින්, මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකයේ ප්‍රගතිය වර්ගීකරණය කිරීමේදී මෙම තොරතුරු භාවිතා නොකෙරේ. කෙසේ වෙතත්, එය භාවිතා කරනු ලැබුව ද එම සංඛ්‍යාලේඛන මගින් ජාතික වෘත්තීය පුහුණු සහතිකය සඳහා ලියාපදිංචි වූවන් දක්වන්නේ ද යන්න පැහැදිලි කර නොමැති බැවින්, අනෙකුත් ප්‍රතිචාර භාවිතයෙන් සකසන ලද වර්ගීකරණය ඉන් වෙනස් නොවනු ඇත. එමෙන්ම, පුහුණු සහතිකය ලබා රැකියාවන් වෙත අවතීර්ණ වූවන්ගේ සංඛ්‍යාව මෙහිදී දක්වා නැත. එනිසා, මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකයේ ප්‍රගතිය ඇගයීමට හැකි වනුයේ (මෙම සංඛ්‍යාවන් ජාතික වෘත්තීය පුහුණු සහතිකයට අදාළ වේ යැයි යන උපකල්පනය මත) අර්ධ වශයෙන් පමණි

මුදල් අමාත්‍යාංශය, කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සහ තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ප්‍රයෝජනයට ගත හැකි/ප්‍රමාණවත් තොරතුරු ලබා නොදුන් බැවින් මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය, තොරතුරු අනාවරණය කර නොමැති දර්ශකයක් ලෙස වර්ගීකරණය කර ඇත.

| ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 5: සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය/ සහනාධාර භාවිතා කරමින් තිරසර ව්‍යාපාරයන්හි නිරත වන කාන්තා ව්‍යවසායකයින් සංඛ්‍යාව | | |
|---|---|---|
| **ප්‍රගතියේ වර්ගීකරණය** | **පිරිහී යන ප්‍රගතිය**[23] | **මූලාශ්‍ර:**<br>කර්මාන්ත අමාත්‍යාංශය<br>මුදල් අමාත්‍යාංශය<br>කාන්තා සහ ළමා සංවර්ධන, පෙර පාසල්, ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය |

## ලබාගත් තොරතුරුවල සාරාංශය

5.1.

තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ ගොනු කරන ලද ඉල්ලීම් අනුව 2018, 2019, සහ 2020 වසරවල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය/සහනාධාර භාවිතා කරමින් තිරසර ව්‍යවසායන්ගේ නියැලුණු කාන්තා ව්‍යවසායකයින්ගේ සංඛ්‍යාව කර්මාන්ත අමාත්‍යාංශය විසින් ලබා දෙන ලදි.

| 2018 | 2019 | 2020 |
|---|---|---|
| 11 | 77 | 40 |

5.2.

තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර ලෙස, ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 5 ට අදාළව 2018 වසර සඳහා සබරගමුව පළාත් සභාව වෙතින් යොමු කරන ලද තොරතුරු, මුදල් අමාත්‍යාංශය විසින් ලබා දෙන ලදි.

| ප්‍රධාන කාර්ය සාධන දර්ශකය | අංකය. |
|---|---|
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය/සහනාධාර භාවිතා කරමින් තිරසර ව්‍යවසායන්ගේ නියැලුණු කාන්තා ව්‍යවසායකයින් සංඛ්‍යාව | 1,538 |

5.3.

2018-2019 කාලය තුළ මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය සම්බන්ධයෙන් සිදු කරන ලද වැඩසටහන් දෙකක් පිළිබඳ තොරතුරු කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් ලබා දෙන ලදි. කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස් කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය (ඤදබඩැබඑසදබ දබ එයැ ඍකසපසබ්එසදබ දෙ ්කක ඵදරපි දෙ ඬසිජරසපසබ්එසදබ ්ඊසබිඑ උදපැබ - ඣෑ්උ) උතුරු හා නැගෙනහිර පළාත්වල ක්‍රියාවට නැංවීම ආශ්‍රිතව හා ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය යටතේ පවතින ව්‍යාපෘති ආශ්‍රිතව මෙම වැඩසටහන් පවත්වා තිබිණ. මෙම වැඩසටහන් සඳහා වැය වූ මුදල පිළිබඳව ද තොරතුරු සපයන ලද අතර, එම මුදල රු. මිලියන 70.39 කි.

## ලැබුණු තොරතුරු පිළිබඳ අදහස්

මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ඇගයීමේදී, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය/සහනාධාර භාවිතා කරමින් තිරසර ව්‍යවසායන්ගේ නියැලෙන කාන්තා ව්‍යවසායකයින්ගේ සංඛ්‍යාවේ වාර්ෂික වර්ධනය සියයට 0 සිට සියයට 10 අතර පැවතීම දුර්වල ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදි. සියයට 10 ට වැඩි වර්ධනයක් ශක්තිමත් ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදි.

5.1.

2019 සහ 2020 කාලය තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය/සහනාධාර භාවිතා කරමින් තිරසර ව්‍යවසායන්ගේ නියැලෙන කාන්තා ව්‍යවසායකයින්ගේ සංඛ්‍යාව සියයට 48 කින් අඩුවී ඇති බව කර්මාන්ත අමාත්‍යාංශය වෙතින් ලැබුණු තොරතුරු මගින් පෙනී යයි.

5.2.

මුදල් අමාත්‍යාංශය විසින් සපයන ලද තොරතුරු සබරගමුව පළාතට පමණක් අදාළ වූ බැවින් මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකයේ ප්‍රගතිය ඇගයීම සඳහා එය භාවිතා කළ නොහැකි විය. මීට අමතරව, ලබාදුන් තොරතුරු 2018 වසරට පමණක් අදාළ වූ බැවින් මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ඇගයීම අසීරු විය.

කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ අනතර්ජාල අඩවියේ සිදු කරන ලද අන්තර්ජාල සෙවීම් ඔස්සේ 2020 වසර තුළ ඉහත ව්‍යාපෘති විසින් අත්කර ගත් ප්‍රගතියට අදාළ තොරතුරු ලබා ගත හැකි විය. රු. මිලියන 5.3 ක වියදමක් දරන ලද කෘෂි හා ආශ්‍රිත වැඩසටහනක් 2020 වසරේදී ද අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇත.

5.3.

2018, 2019 හෝ 2020 තුළ සිදු කරන ලද වැඩසටහන් සඳහා දරන ලද මුළු වියදම පිළිබඳ විස්තරයක් කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙතින් ලැබුණු තොරතුරුවල ඇතුළත්ව නොතිබිණි කෙසේ වෙතත් අන්තර්ජාල සෙවීම් මගින් සොයාගත් තොරතුරුවලට අනුව ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 5 ට අදාළව 2020 පැවැත්වූ වැඩසටහන් වෙනුවෙන් දරන ලද මුළු වියදම  රු. මිලියන 5.3 ක් වී ඇත.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය/සහනාධාර භාවිතා කරමින් තිරසර ව්‍යවසායන්ගේ නියැලෙන කාන්තා ව්‍යවසායකයින්ගේ සංඛ්‍යාව 2019 සහ 2020 වසරවලදී අඩු වී ඇති බැවින් මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය **පිරිහී යන ප්‍රගතියක්** ඇති දර්ශකයක් ලෙසට වර්ගීකරණය කර ඇත.

| ප්‍රධාන කාර්ය සාධන දර්ශක 6: ආපසු පැමිණි හා විදෙස්ගත වීමට නියමිත කාන්තාවන් ඉලක්ක කරගත් ජාතික ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති සංඛ්‍යාව | | |
|---|---|---|
| **ප්‍රගතියේ වර්ගීකරණය** | **ප්‍රගතියක් නැත** | **මූලාශ්‍ර:**<br>විදේශ රැකියා ප්‍රවර්ධන සහ වෙළඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය<br>මුදල් අමාත්‍යාංශය<br>කාන්තා සහ ළමා සංවර්ධන, පෙර පාසල්, ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය |

## ලබාගත් තොරතුරුවල සාරාංශය

6.1

තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර ලෙස විදේශ රැකියා ප්‍රවර්ධන සහ වෙළඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2018, 2019 සහ 2020 වසරවල ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 6 ට අදාළ වන ව්‍යාපෘති පහක් පිළිබඳව තොරතුරු ලබා දෙන ලදි.

1. පවුල් පසුබිම් වාර්තා නිකුත් කිරීම
2. 'ශ්‍රමික සුරැකුම. වැඩසටහන ක්‍රියාත්මක කිරීම
3. පවුල් සංවර්ධන සැලසුම් සහ රැකවරණ සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
4. දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
5. ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් දැනුවත් කිරීම

ඉහත ව්‍යාපෘති සඳහා භෞතික ප්‍රගතිය මෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් වෙන්ව දක්වන ලද දත්ත ද සපයන ලදි.

| වැඩසටහන | 2018 | | 2019 | | 2020 | |
|---|---|---|---|---|---|---|
| | පි | කා | පි | කා | පි | කා |
| පවුල් පසුබිම් වාර්තා නිකුත් කිරීම(පප්සෘ) ප්‍රතිලාභීන් සංඛ්‍යාව | - | 30,654 | - | 33,064 | - | 7,337 |
| ශ්‍රමික සුරැකුම සඳහා ලියාපදිංචිය ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 4,412 | 21,244 | 5,435 | 20,799 | 3,142 | 6,827 |

## ලැබුණු තොරතුරු පිළිබඳ අදහස්

මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ඇගයීමේදී එහි ප්‍රගතියට දායක වන එක් ප්‍රතිපත්තිමය/ ව්‍යවස්ථාදායකමය/ නියාමනික වෙනසක් පැවතීම අවම වශයෙන් දුර්වල ප්‍රගතියක් ලෙස හෝ තක්සේරු කරන ලදි. ඊට අමතර වශයෙන් සිදු කරන ලද ඕනෑම වෙනසක් ශක්තිමත් ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදි.

6.1

විදේශ රැකියා ප්‍රවර්ධන සහ වෙළඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය මගින් ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 6 ට අදාළව සිදු කරන ලද ව්‍යාපෘති පිළිබඳ තොරතුරු සපයනු ලැබේ. කෙසේ වෙතත්, ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 6 වෙත සෘජුවම අදාළ වන්නේ කාන්තා සංක්‍රමණිකයන් පමණක් අරමුණු කරගත් පවුල් පසුබිම් වාර්තා නිකුත් කිරීම(පප්සෘ) යන ව්‍යාපෘතිය පමණි මෙම ව්‍යාපෘතිය 2018, 2019, සහ 2020 පුරා නොකඩවා සිදු කර ඇති අතර අමතර ව්‍යාපෘති හෝ ක්‍රියාකාරී සැලසුම් සපයා නොමැත.

පවුල් පසුබිම් වාර්තා නිකුත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ ලැබූ කාන්තාවන්ගේ සංඛ්‍යාව 2020 දී සියයට 78 කින් අඩු වී ඇති බව ද සැලකිල්ලට ගැනීම වැදගත්ය.

| වැඩසටහන | 2018 | | 2019 | | 2020 | |
|---|---|---|---|---|---|---|
| | පි | කා | පි | කා | පි | කා |
| පවුල් සංවර්ධන සැලසුම්(පසප) සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 957 | 5,597 | 1,250 | 5,887 | 639 | 1,805 |
| රැකවරණ සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම දරුවන් සංඛ්‍යාව | 74 | 761 | 62 | 1,005 | 53 | 303 |
| දැනුවත් කිරීමේ වැඩසටහන් වැඩසටහන් ගණන | 5,519 | | 6,903 | | 2,215 | |
| ආරක්ෂිත සංක්‍රමණය, පඹ, මත්ද්‍රව්‍ය පිළිබඳ දැනුවත් කිරීම යනාදිය වැඩසටහන් ගණන | 932 | | - | | - | |
| ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් දැනුවත් කිරීම වියදම් | 3,529,727 | | 3,401,125 | | මෙම වසර සඳහා ප්‍රතිපාදන නොලැබිණි | |

විදේශ රැකියා ප්‍රවර්ධන සහ වෙළඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය විසින් මීට අමතරව සිදු කර ඇති ව්‍යාපෘති හෝ ජාතික ප්‍රතිපත්ති කිසිවක් පිළිබඳව තොරතුරු ලබා දී නොමැති බැවින් ද මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකයට සම්බන්ධ භෞතික හෝ මූල්‍ය ප්‍රගතිය පිළිබඳ කිසිදු තොරතුරක් මුදල් අමාත්‍යාංශය සහ කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් සපයා නොමැති බැවින් ද මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය **කිසිදු ප්‍රගතියක් නොමැති දර්ශකයක්** ලෙස වර්ගීකරණය කර ඇත.

විදේශ රැකියා ප්‍රවර්ධන සහ වෙළඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඉහත සඳහන් ව්‍යාපෘතිවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා යොදා ගත් අභ්‍යන්තර ක්‍රියාමාර්ග ද ලැයිස්තුගත කර තිබිණ.

1. පුද්ගල සංවර්ධන නිලධාරියාගේ මාසික ප්‍රගති වාර්තා
2. සාරාංශ ප්‍රගති වාර්තා සකස් කිරීම
3. ප්‍රාදේශීය සංවර්ධන නිලධාරීන් විසින් සිදු කෙරෙන පවුල් බැහැදැකීම්
4. ප්‍රගති සමාලෝචන රැස්වීම්
5. දිස්ත්‍රික් සංවර්ධන නිලධාරීන් සහ අමාත්‍යාංශ නිලධාරීන් විසින් පවුල් සංවර්ධන සැලසුම් සහ රැකවරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම

| ප්‍රධාන කාර්ය සාධන දර්ශක 7: ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හරහා ලබාගත්, තීරණ ගැනීමේ තනතුරු හොබවන කාන්තාවන්ගේ සංඛ්‍යාව ඉහළ යාම | | |
|---|---|---|
| **ප්‍රගතියේ වර්ගීකරණය** | **තොරතුරු අනාවරණය කර නොමැත** | **මූලාශ්‍ර:**<br>රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය<br>මුදල් අමාත්‍යාංශය<br>කාන්තා සහ ළමා සංවර්ධන, පෙර පාසල්, ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය |

## ලබාගත් තොරතුරුවල සාරාංශය

7.1

තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර ලෙස රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් තම අමාත්‍යාංශය වෙත මූලාශ්‍ර හතකින් ඉදිරිපත් වූ තොරතුරු මත පදනම්ව 2018, 2019 සහ 2020 වසර තුළ බඳවා ගන්නා ලද නිලධාරිනියන්ගේ සංඛ්‍යාව පිළිබඳ තොරතුරු සපයන ලදි.

| සේවා මණ්ඩලය | නිලධාරිනියන්ගේ සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | 31.12.2018 දිනට | 31.12.2019 දිනට | 31.12.2020 දිනට |
| ශ්‍රී ලංකා පරිපාලන සේවය | වාර්ෂික පදනමින් ඔවුන් සතුව තොරතුරු නොමැති නමුත් 2021.09.30 වන විට පරිපාලන සේවයේ සිටි නිලධාරිනියන්ගේ සංඛ්‍යාව 1,439 කි. | | |
| ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 337 | 344 | 345 |
| ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 208 | 217 | 263 |
| ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවය | අ/නො | අ/නො | 31 |
| ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය | 2020.12.31 දිනට ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයට ඇතුළත්ව සිටි නිලධාරිනියන්ගේ සංඛ්‍යාව 918කි | | |

## ලැබුණු තොරතුරු පිළිබඳ අදහස්

මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ඇගයීමේදී, ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හරහා තීරණ ගැනීමේ තනතුරුවලට පත් වූ කාන්තාවන්ගේ සංඛ්‍යාවේ වාර්ෂික වර්ධනය සියයට 0 සිට සියයට 10 අතර පැවතීම දුර්වල ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදි. සියයට 10 ට වැඩි වර්ධනයක් ශක්තිමත් ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදී.

7.1

සේවාවන් හතක් තුළ සේවයේ නියැලෙන කාන්තා නිලධාරිනියන්ගේ සංඛ්‍යාව සම්බන්ධයෙන් රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරුවල එම බඳවාගැනීම් සිදු කරන ලද්දේ 'තීරණ ගැනීමේ තනතුරු' උදෙසා ද යන්න සඳහන් නොකර ඇති අතර මෙම සේවාවන් සඳහා පොදුවේ බඳවා ගන්නා ලද කාන්තාවන්ගේ සංඛ්‍යාව පමණක් එහි දක්වා තිබේ. එමෙන්ම, මෙම බඳවා ගැනීම්, ප්‍රතිපත්තිමය මැදිහත්වීම්වල ප්‍රතිඵලයක් ලෙස සිදු වූවක් ද යන කරුණ ද පැහැදිලි නැත.

7.2

මුදල් අමාත්‍යාංශය විසින් ලබා දුන් ප්‍රතිචාරයෙහි සටහන්ව තිබූ බඳවා ගැනීම් තීරණ ගැනීමේ තනතුරු සඳහා සිදු කරන ලද බවට දක්වා තිබුණ ද එම අමාත්‍යාංශය විසින්

| සේවා මණ්ඩලය | නිලධාරිනියන්ගේ සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | 31.12.2018 දිනට | 31.12.2019 දිනට | 31.12.2020 දිනට |
| ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 716 | 877 | 858 |
| ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය "(බෂකඹ) (ෂ සහ ෂෂ පන්ති) | 130 | 151 | 150 |

එපමණක් නොව, අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ඇති ඒකාබද්ධ සේවාවන්ට අයත් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය සඳහාත් දීපව්‍යාප්ත සේවාවන් සඳහාත් බඳවාගැනීම් සිදු කිරීමේදී ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වය වෙතම අමාත්‍යාංශය විසින් සමඅවස්ථා සලසා දෙන බව ද වැඩිදුරටත් එම ප්‍රතිචාරයේ සඳහන් විය.

7.2

තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර ලෙස රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් 2018 වසර තුළ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 7 ආශ්‍රිතව සිදුකරන ලද ක්‍රියාකාරකම්වලට අදාළව ඉදිරිපත් කරන ලද තොරතුරු මුදල් අමාත්‍යාංශය විසින් සපයන ලදි. රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් "2018 අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා වූ මාර්ගෝපදේශය" යටතේ මෙම තොරතුරු ඉදිරිපත් කර තිබිණි ඒවා නම්:

| දීපව්‍යාප්ත සේවා | නිලධාරිනියන්ගේ සංඛ්‍යාව | පිරිමි නිලධාරීන්ගේ සංඛ්‍යාව | නිලධාරිනියන්ගේ ප්‍රතිශතය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා පරිපාලන සේවය | 1,235 | 1,181 | 51.11 |
| ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය | 396 | 376 | 51.29 |
| ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 878 | 834 | 51.28 |
| ශ්‍රී ලංකා විද්‍යාත්මක සහ වාස්තු විද්‍යාත්මක සේවය | 251 | 195 | 56.28 |
| ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 342 | 901 | 27.51 |

ලබා දෙන ලද තොරතුරුවල ඒ බවක් පෙනෙන්නට නොතිබේ. මීට අමතරව, ලබාදුන් තොරතුරු 2018 වසරට පමණක් අදාළ වූ බැවින් ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ඇගයීම අසීරු විය.

මෙම තොරතුරු '2018 අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ. යන මාතෘකාව යටතේ දක්වා ඇති බැවින් මෙම ඉලක්කයන් ප්‍රධාන කාර්ය සාධන දර්ශක සාක්ෂාත් කර ගැනීම සඳහා භාවිතා කරන ලද්දේ ද නැතහොත් එමගින් දක්වා ඇත්තේ 2018 සඳහා බඳවා ගත් නිලධාරීන්ගේ සංඛ්‍යාව ද යන කරුණ පැහැදිලි නැත.

7.3

කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් සපයනු ලබන තොරතුරු මගින් රාජ්‍ය අමාත්‍යාංශය තුළ ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හරහා ලබා ගත් තීරණ ගැනීමේ තනතුරුවල සිටින කාන්තාවන්ගේ සංඛ්‍යාව හෝ 2018 සහ 2019 වසරවල මෙම වැඩසටහන් සඳහා දරන ලද මුළු වියදම් පිළිබඳ වෙනම විස්තරයක් හෝ සපයා නැත.

මීට අමතරව, කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සහ මුදල් අමාත්‍යාංශය වෙතින් ලැබුණු ප්‍රතිචාර, පෙර වසරේ (2021) ඇගයීම සිදු කිරීමේදී ලැබුණු ප්‍රතිචාරයන් හා සර්වසම විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2020 වසර තුළ ප්‍රගතිය ඇගයීම සඳහා නව තොරතුරු කිසිවක් ලැබී නොමැත.

එනිසාවෙන්, මේ හා සම්බන්ධව ලබා ගත හැකි වූ තොරතුරු ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය ඇගයීමේලා ප්‍රමාණවත් නොවන අතර අසම්පූර්ණ ද වේ. එබැවින්, මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය **තොරතුරු අනාවරණය කර නොමැති දර්ශකයක්** ලෙස වර්ගීකරණය කර ඇත.

7.3

තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් කාන්තා සහ ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ප්‍රකාශ කරන ලද්දේ 2018/2019 වසර සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 7 සාක්ෂාත් කරගැනීම පිණිස රාජ්‍ය අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කළ බවයි. තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් මුදල් අමාත්‍යාංශය විසින් මෙම තොරතුරු ද ලබා දී ඇත. එම ව්‍යාපෘති නම්:

1. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

2. පළාත් අයවැය සඳහා හඳුන්වා දී ඇති සියයට 25 කෝටාව ක්‍රියාත්මක කිරීම

2018/2019 කාලය තුළ මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 4.04ක මුදලක් වැය වී ඇති බව ද ප්‍රතිචාරයේ සඳහන් විය.

| ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 8: ස්ත්‍රී පුරුෂභාවය අනුව හිතකර රැකියා පරිසරයක් සහ දිවා සුරැකුම් පහසුකම් ආදිය වැඩිදියුණු කිරීම සඳහා පියවර ගෙන ඇති ආයතන සංඛ්‍යාව | | |
|---|---|---|
| **ප්‍රගතියේ වර්ගීකරණය** | **තොරතුරු අනාවරණය කර නොමැත** | **මූලාශ්‍ර:**<br>මුදල් අමාත්‍යාංශය<br>කාන්තා සහ ළමා සංවර්ධන, පෙර පාසල්, ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය |

## ලබාගත් තොරතුරුවල සාරාංශය

8.1

තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් මුදල් අමාත්‍යාංශය විසින් ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයෙන් ලද තොරතුරු සපයන ලද අතර ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 8 සම්බන්ධයෙන් 2018 දී පවත්වන ලද වැඩසටහන් පිළිබඳ විස්තර ඊට ඇතුළත් කර තිබිණ.

| ප්‍රධාන කාර්ය සාධන දර්ශකය | වැඩසටහන | භෞතික ප්‍රගතිය | මූල්‍යමය ප්‍රගතිය |
|---|---|---|---|
| ස්ත්‍රී පුරුෂ සමාජභාවයට හිතකර වන රැකියා පරිසරයක් සහ දිවා සුරැකුම් පහසුකම් වැඩි දියුණු කිරීමට පියවර ගනු ලැබූ ආයතන ගණන | දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ සේවා වනිතා ඒකක පිහිටුවීම, අලුත්වැඩියා කටයුතු සිදු කිරීම, පුස්තකාල පහසුකම් හා ක්‍රීඩා පහසුකම් සැපයීම | සියයට 100 | දෙපාර්තමේන්තුව වෙත දැනට ලැබී ඇති ප්‍රතිපාදන යොදා ගනිමින් කටයුතු සිදු කර ඇත |

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් සම්බන්ධයෙන් එම අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු ද මුදල් අමාත්‍යාංශය විසින් සපයන ලදී.

| | |
|---|---|
| **දරුවන් සංඛ්‍යාව** | 26 |
| **දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ දරුවන් සිටින කාන්තා සේවා නියුක්තිකයින් සංඛ්‍යාව** | 7 |
| **වාර්ෂික වියදම (රු)** | 2,066,000 |

8.2

තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් කාන්තා සහ ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රකාශ කරන ලද්දේ 2018/2019 වසර තුළ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 8 සාක්ෂාත් කරගැනීම පිණිස ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක

## ලැබුණු තොරතුරු පිළිබඳ අදහස්

මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ඇගයීමේදී, ස්ත්‍රී පුරුෂභාවයට හිතකර සේවා පරිසරයන් හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීමට පියවර ගෙන ඇති ආයතන සංඛ්‍යාවේ වාර්ෂික වර්ධනය සියයට 0 සිට සියයට 10 අතර පැවතීම දුර්වල ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදි. සියයට 10 ට වැඩි වර්ධනයක් ශක්තිමත් ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදි.

8.1

2018, 2019, හෝ 2020 වසරවල ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පිළිබඳ විස්තරාත්මක තොරතුරු මුදල් අමාත්‍යාංශය විසින් සපයා නැත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු සඳහා ද ඊට අදාළ කාල සීමාව සඳහන් කර නොමැත.

8.2

කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙතින් ලැබුණු තොරතුරුවල 2018, 2019 හෝ 2020 තුළ සිදු කළ වැඩසටහන්වල ප්‍රගතිය පිළිබඳ විස්තරයක් ඇතුළත්ව නොතිබිණි මීට අමතරව, සියලුම ව්‍යාපෘතිවල සමස්ත මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තරයක් අමාත්‍යාංශය විසින් ලබා දී නොමැත.

කළ බවයි. තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් මුදල් අමාත්‍යාංශය විසින් ද මෙම තොරතුරු ලබා දී ඇත. එම ව්‍යාපෘති වන්නේ:

1. අමාත්‍යාංශ මට්ටමින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සඳහා මුලපුරන වැඩසටහන් ස්ථාපිත කිරීම

2. දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉදිකිරීම සහ සංවර්ධනය කිරීම

2018/2019 වර්ෂයේදී මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 92.882ක මුදලක් වැය වී ඇති බව ද ප්‍රතිචාරයේ සඳහන් විය.

මීට අමතරව, කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සහ මුදල් අමාත්‍යාංශය වෙතින් ලැබුණු ප්‍රතිචාර, පෙර වසරේ (2021) ඇගයීම සිදු කිරීමේදී ලැබුණු ප්‍රතිචාරයන් හා සර්වසම විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2020 වසර තුළ ප්‍රගතිය ඇගයීම සඳහා නව තොරතුරු කිසිවක් ලැබී නොමැත.

කරුණු එසේ හෙයින්, මේ සඳහා ලබා ගන්නා ලද තොරතුරු, ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය ඇගයීමේලා ප්‍රමාණවත් නොවන අතර අසම්පූර්ණ ද වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවයට හිතකර සේවා පරිසරයන් සහ  දිවා සුරැකුම් මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීමට පියවර ගෙන ඇති ආයතන සංඛ්‍යාව කාලයත් සමඟ වෙනස් වී ඇත් ද යන්න එම තොරතුරු හරහා නිශ්චය කළ නොහැක.

එබැවින්, මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය **තොරතුරු අනාවරණය කර නොමැති දර්ශකයක්** ලෙස වර්ගීකරණය කර ඇත.

| ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 9: ආපදා අවස්ථාවල දී මුදවා ගැනීම, සහන සැලසීම, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණය යන පියවරයන්හිදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අවධානය යොමු කිරීම සහතික වීම සඳහා ස්ථාපනය කර ඇති සහ ඵලදායි ලෙස ක්‍රියාවට නංවා ඇති ප්‍රතිපත්තීන් සහ මාර්ගෝපදේශ සංඛ්‍යාව | | |
|---|---|---|
| **ප්‍රගතියේ වර්ගීකරණය** | **තොරතුරු අනාවරණය කර නොමැත** | **මූලාශ්‍ර:**<br>මුදල් අමාත්‍යාංශය<br>කාන්තා සහ ළමා සංවර්ධන, පෙර පාසල්, ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය<br>රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය |

## ලබාගත් තොරතුරුවල සාරාංශය

9.3

තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන්, රාජ්‍ය ආරක්ෂක සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය විසින් ආපදා කළමනාකරණයේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය ආශ්‍රිත ගැටළු විසඳීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති පිළිබඳ තොරතුරු සපයන ලදි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය ආශ්‍රිත ගැටළුවලට විසඳුම් ලබා දිය හැකි, අමාත්‍යාංශය විසින් අනුගමනය කරන දැනට පවතින ප්‍රතිපත්ති සහ රාමුවලට අයත් සංරචක තුනක් මෙම තොරතුරුවලට ඇතුළත් කර තිබිණ.

- ආපදා කළමනාකරණ ප්‍රතිපත්ති රාමුව -2013
- 2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනත
- “සෞභාග්‍යයේ දැක්ම” (ජනාධිපති ප්‍රතිපත්ති ප්‍රකාශනය)

“ආපදා කළමනාකරණය තුළ එවැනි තනි ප්‍රතිපත්ති නොමැති” බව ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 9 ක්‍රියාත්මක කිරීම සඳහා වන ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ ඉල්ලා සිටීම සම්බන්ධයෙන් කරුණු දැක්වීම සඳහා අමාත්‍යාංශය විසින් ලබා දුන් ප්‍රතිචාරයේ පැහැදිලිව සඳහන් කර ඇත.

## ලැබුණු තොරතුරු පිළිබඳ අදහස්

මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ඇගයීමේදී, එහි ප්‍රගතියට දායක වන එක් ප්‍රතිපත්තිමය/ ව්‍යවස්ථාදායක/ නියාමනික වෙනසක් අවම වශයෙන් දුර්වල ප්‍රගතියක් හෝ වන බවට තක්සේරු කරන ලදි. මීට අමතරව හඳුන්වා දී ඇති ඕනෑම වෙනසක් ශක්තිමත් ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදි.

9.3

අභ්‍යන්තර ආරක්ෂාව සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ ලැයිස්තුවක් එම අමාත්‍යාංශය විසින් සපයා ඇතත්, ආපදා කළමනාකරණයේදී එම ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටළු විසඳීමට දායක වනුයේ වක්‍රාකාරයෙනි. මීට අමතරව, රාජ්‍ය අමාත්‍යාංශය විසින් සපයන ලද ප්‍රතිචාරය තුළ මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන ලද කාලසීමාව පිළිබඳ තොරතුරු අඩංගු නොවූ අතර, එනිසා 2018, 2019 සහ 2020 සඳහා මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකයේ ප්‍රගතිය ඇගයීම අසීරු වේ.

සෘජුව ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 9 සාක්ෂාත් කරගැනීම අරමුණු කර ගත් කිසිදු ප්‍රතිපත්තියක් හෝ මාර්ගෝපදේශයක් ක්‍රියාත්මක කර නැති බව රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය ආමාත්‍යාංශය විසින් ලබා දෙන ලද ප්‍රතිචාරයෙන් පැහැදිලි විය.

අධීක්ෂණ අමාත්‍යාංශ ලෙස මුදල් අමාත්‍යාංශය සහ කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකයේ ප්‍රගතියට අදාළ කිසිදු තොරතුරක් ලබා නොදෙන ලදි.

කරුණු එසේ හෙයින්, මේ සඳහා ලබා ගන්නා ලද තොරතුරු, ප්‍රධාන කාර්ය සාධන දර්ශකයේ ප්‍රගතිය ඇගයීමේලා ප්‍රමාණවත් නොවන අතර අසම්පූර්ණ ද වේ. ආපදා කළමනාකරණයේදී මතු වන ස්ත්‍රී පුරුෂ සමාජභාවය ආශ්‍රිත ගැටළුවලට විසඳුම් ලබා දීමට ස්ථාපනය කර ඇති ප්‍රතිත්පති සහ මාර්ගෝපදේශ ගණන කාලයත් සමඟ වෙනස් වී ඇත් ද යන්න එම තොරතුරු හරහා නිශ්චය කළ නොහැක.

එබැවින්, මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය **තොරතුරු අනාවරණය කර නොමැති දර්ශකයක්** ලෙස වර්ගීකරණය කර ඇත.

| **ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 10: කාන්තාවන් හා ළමුන් සම්බන්ධයෙන් වන ගැටළු සංවේදී සහ ඵලදායි අයුරින් හැසිරවීම සඳහා පුහුණු කර ඇති, පොලිස් ස්ථාන තුළ පිහිටි කාන්තා හා ළමා කාර්යාංශ සංඛ්‍යාව** | | |
|---|---|---|
| **ප්‍රගතියේ වර්ගීකරණය** | **තොරතුරු අනාවරණය කර නොමැත** | **මූලාශ්‍ර:**<br>කාන්තා සහ ළමා සංවර්ධන, පෙර පාසල්, ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය<br>මුදල් අමාත්‍යාංශය<br>මහජන ආරක්ෂක අමාත්‍යාංශය<br>ශ්‍රී ලංකා පොලීසිය |

## ලබාගත් තොරතුරුවල සාරාංශය

10.1

තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් කාන්තා සහ ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රකාශ කරන ලද්දේ 2018/2019 වසරවල ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 10 සාක්ෂාත් කරගැනීම පිණිස ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කළ බවයි. තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් මුදල් අමාත්‍යාංශය විසින් ද මෙම තොරතුරු ලබා දී ඇත. එම ව්‍යාපෘති නම්:

1. පොලිස්, ළමා සහ කාන්තා කාර්යාංශය පිහිටුවීම
2. ළමා සහ කාන්තා සංවර්ධන ඒකක පිහිටුවීම

2018/2019 හිදී මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු. මිලියන 38.12ක මුදලක් වැය වූ බව ද එම ප්‍රතිචාරයේ සඳහන් විය.

කාර්ය සාධන දර්ශකය 10 සම්බන්ධයෙන් ක්‍රියාවට නංවන ලද ව්‍යාපෘති පිළිබඳ විස්තර, කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ අන්තර්ජාල අඩවිය තුළින් ලබා ගත හැක විය. එම තොරතුරු 2019 සහ 2020 වසරවල ප්‍රගති වාර්තාවලට ඇතුළත් කර තිබූ අතර අමාත්‍යාංශ අන්තර්ජාල අඩවිය ඔස්සේ මාර්ගගතව ඒ වෙත පිවිසීමට හැකි විය. එම ව්‍යාපෘති නම්:

| | **භෞතික ප්‍රගතිය** | | **මූල්‍ය ප්‍රගතිය (රු. මි)** | |
|---|---|---|---|---|
| | **2019** | **2020** | **2019** | **2020** |
| **කාන්තා සහ ළමා සංවර්ධන ඒකක පිහිටුවීම** | සියයට 100 | - | 3.709 | - |
| **ළමා හා කාන්තා අපයෝජන වැළැක්වීම සඳහා පොලිස් කාර්යාංශ පිහිටුවීම** | සියයට 95 | සියයට 60 | 19.21 | 7.286 |

## ලැබුණු තොරතුරු පිළිබඳ අදහස්

මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශක ඇගයීමේදී, පොලිස් ස්ථානවල ස්ථාපිත කාන්තා සහ ළමා කාර්යාංශ ඒකකවල වාර්ෂික වර්ධනය සියයට 0 සිට සියයට 10 අතර පැවතීම දුර්වල ප්‍රගතියක් ලෙසට තක්සේරු කරන ලදි. සියයට 10 ට වැඩි වර්ධනයක් ශක්තිමත් ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදි.

10.1

පොලිස් ස්ථානවල ස්ථාපනය කරන ලද කාන්තා හා ළමා කාර්යාංශ ඒකක සංඛ්‍යාව සහ 2018 සහ 2019 වසරවල මෙම වැඩසටහන් සඳහා දරන ලද මුළු වියදම පිළිබඳ විස්තරයක් කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ලබා නොදෙන ලදි.

මීට අමතරව, කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙතින් මෙවර ලැබුණු ප්‍රතිචාරය ද මෙම ඇගයීම මීට පෙර වසර (2021) සඳහා සිදු කිරීමේදී ලැබුණු ප්‍රතිචාරය හා සර්වසම විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2020 වසර තුළ ප්‍රගතිය ඇගයීම වෙනුවෙන් නව තොරතුරු කිසිවක් ලැබී නැත.

ළමා සහ කාන්තා අපයෝජනය තුරන් කිරීම සඳහා දිවයින පුරා ස්ථාපනය කර ඇති පොලිස් කාර්යාංශ සංඛ්‍යාව පිළිබඳ විස්තරාත්මක තොරතුරු

10.3

මහජන ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කරන ලද තොරතුරු ඉල්ලීම හරහා කිසිදු තොරතුරක් ලැබී නැත. මහජන ආරක්ෂාව පිළිබඳ අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා පොලීසිය වෙත යොමු කරන ලද තොරතුරු ලබාගැනීමේ ඉල්ලීම, ශ්‍රී ලංකා පොලීසිය විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5 (1) (උ) (ඌ) යටතේ ප්‍රතික්ෂේප කරන ලදි.

කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ අන්තර්ජාල අඩවියේ පළ කර ඇති 2019 සහ 2020 ප්‍රගති වාර්තා තුළ අඩංගු මාර්ගගතව පිවිසිය හැකි තොරතුරුවලට ඇතුළත් කර නොමැත. 2019 සහ 2020 වසරවල පිහිටුවන ලද ළමා සහ කාන්තා කාර්යාංශ ගණන මෙහිදී වාර්තා කර ඇති භෞතික ප්‍රගතිය තුළ දක්වා නොමැත.

කරුණු එසේ හෙයින්, මේ සඳහා ලබා ගන්නා ලද තොරතුරු, ප්‍රධාන කාර්ය සාධන දර්ශකයේ ප්‍රගතිය ඇගයීමේලා ප්‍රමාණවත් නොවන අතර අසම්පූර්ණ ද වේ. 2019 සහ 2020 අතර කාලය තුළ පොලිස් ස්ථානවල ස්ථාපනය කරන ලද කාන්තා සහ ළමා කාර්යාංශ සංඛ්‍යාව එමගින් ලබා දී නොමැත.

එබැවින්, මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය **තොරතුරු අනාවරණය කර නොමැති දර්ශකයක්** ලෙස වර්ගීකරණය කර ඇත.

;

| ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 11: සංශෝධනය කර ඇති, පනවා ඇති සහ/හෝ ක්‍රියාවට නංවා ඇති, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බනධයෙන් සිදු වන වෙනස් කොට සැලකීම් සඳහා අදාළ වන නීති, ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි සංඛ්‍යාව | | |
|---|---|---|
| **ප්‍රගතියේ වර්ගීකරණය** | **තොරතුරු අනාවරණය කර නොමැත** | **මූලාශ්‍ර:**<br>කාන්තා සහ ළමා සංවර්ධන, පෙර පාසල්, ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය<br>මුදල් අමාත්‍යාංශය<br>අධිකරණ අමාත්‍යාංශය |

## ලබාගත් තොරතුරුවල සාරාංශය

11.1

තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් කාන්තා සහ ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රකාශ කරන ලද්දේ 2018/2019 තුළ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 11 සාක්ෂාත් කරගැනීම පිණිස ව්‍යාපෘති 17 ක් ක්‍රියාත්මක කළ බවයි. තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් මුදල් අමාත්‍යාංශය විසින් ද මෙම තොරතුරු ලබා දී ඇත. එම ව්‍යාපෘති නම්:

1. වැන්දඹුවන් සහ ගෘහණියන් සඳහා ක්‍රියාකාරී සැලැස්ම
2. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ක්‍රියාකාරකම් සහ අයවැයකරණය පිළිබඳ අත්පොත
3. කාන්තා නිවාස නඩත්තු කිරීම සඳහා මාර්ගෝපදේශ
4. අඩු වයස් විවාහය සහ ගැබ්ගැනීම් අඩු කිරීම පිළිබඳ මාර්ගෝපදේශයක් සකස් කිරීම
5. මුල් ළමාවිය ආරක්ෂාව සහ සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය
6. ජාතික ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය සකස් කිරීම
7. ශ්‍රී ලංකාවේ ළමා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා මාර්ගෝපදේශ සහ චර්යාධර්ම සංග්‍රහය
8. සාමාන්‍ය ළමා ආරක්ෂණ පාඨමාලාව සඳහා පුහුණුකරුගේ මාර්ගෝපදේශය
9. හදිසි ආපදාවලදී මනෝ සමාජීය ප්‍රථමාධාර ලබා දීම පිළිබඳ අත්පොත
10. ශ්‍රී ලංකාවේ ළමා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික මාර්ගෝපදේශය
11. ජාතික විකල්ප සත්කාර ප්‍රතිපත්තිය
12. වයස් කාණ්ඩ සඳහා අත්පොත
13. කාන්තා කොමිෂන් සභාව පිහිටුවීම සඳහා පනත් කෙටුම්පත් සකස් කිරීම
14. ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනතේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම

## ලැබුණු තොරතුරු පිළිබඳ අදහස්

මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ඇගයීමේදී, එහි ප්‍රගතියට දායක වන එක් ප්‍රතිපත්තිමය/ ව්‍යවස්ථාදායක/ නියාමනික වෙනසක් අවම වශයෙන් දුර්වල ප්‍රගතියක් හෝ වන බවට තක්සේරු කරන ලදි. මීට අමතරව හඳුන්වා දී ඇති ඕනෑම වෙනසක් ශක්තිමත් ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදි.

11.1

2018 සහ 2019 වසරවල රාජ්‍ය අමාත්‍යාංශය තුළ සංශෝධනය කර ඇති, බලාත්මක කරන ලද සහ/හෝ ක්‍රියාත්මක කරන ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගනිමින් වෙනස් කොට සැලකීම ආශ්‍රිත නීති, ප්‍රතිපත්ති, සහ ක්‍රියා පටිපාටි සංඛ්‍යාව සහ මෙම වැඩසටහන් සඳහා දරන ලද මුළු වියදම පිළිබඳ විස්තරයක් කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් සපයන ලද තොරතුරුවලට ඇතුළත් කර නොතිබිණි

මීට අමතරව, කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙතින් මෙවර ලැබුණු ප්‍රතිචාරය ද මෙම ඇගයීම මීට පෙර වසර (2021) සඳහා සිදු කිරීමේදී ලැබුණු ප්‍රතිචාරය හා සර්වසම විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2020 වසර තුළ ප්‍රගතිය ඇගයීම වෙනුවෙන් නව තොරතුරු කිසිවක් ලැබී නැත.

15. උප්පැන්න සහතිකයේ 6 වැනි තීරුව සංශෝධනය කිරීම

16. කාන්තා ප්‍රතිරූපය පිළිබඳ මාධ්‍ය ප්‍රතිපත්ති සැකසීම.

17. ප්‍රතිපත්ති පත්‍රිකා සකස් කිරීම

2018/2019 වර්ෂයේදී මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 12.3ක මුදලක් වැය වී ඇති බව ද ප්‍රතිචාරයේ සඳහන් විය.

11.2

මුදල් අමාත්‍යාංශය වෙත ගොනු කරන ලද තොරතුරු ලබා ගැනීමේ ඉල්ලීම හරහා කිසිදු තොරතුරක් ලැබී නැත.

11.3

අධිකරණ අමාත්‍යාංශය වෙත ගොනු කරන ලද තොරතුරු ලබා ගැනීමේ ඉල්ලීම හරහා කිසිදු ප්‍රතිචාරයක් ලැබී නැත.

එබැවින්, 2019 සහ 2020 අතර සංශෝධිත, පනවන ලද සහ/හෝ ක්‍රියාත්මක කරන ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගනිමින් වෙනස් කොට සැලකීමේ නීති, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සංඛ්‍යාව සපයා නොමැති බැවින්, ප්‍රධාන කාර්ය සාධන දර්ශකයේ ප්‍රගතිය ඇගයීමේලා මෙලෙස ලබා ගත් තොරතුරු ප්‍රමාණවත් නොවන අතර අසම්පූර්ණ ද වේ. එබැවින්, මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය **තොරතුරු අනාවරණය කර නොමැති දර්ශකයක්** ලෙස වර්ගීකරණය කර ඇත.

| ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 12: ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට විසඳුම් ලබා දීම සඳහා වූ බහු ආංශික ජාතික ක්‍රියාකාරී සලැස්ම අනුපූරණය කිරීම සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය | | |
|---|---|---|
| **ප්‍රගතියේ වර්ගීකරණය** | **තොරතුරු අනාවරණය කර නොමැත** | **මූලාශ්‍ර:**<br>මුදල් අමාත්‍යාංශය<br>කාන්තා සහ ළමා සංවර්ධන, පෙර පාසල්, ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය |

## ලබාගත් තොරතුරුවල සාරාංශය

12.1

තොරතුරු දැනගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන්, රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් සපයන ලද, මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකයට අදාළ වන බවට තහවුරු කරන ලද තොරතුරු, මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලදි. "ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වන ප්‍රතිපත්ති රාමුව සහ ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි" අඩංගු ඇතැම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් අමාත්‍යාංශය සඳහා සකසන ලද 2019 වාර්ෂික මෙහෙයුම් සැලැස්ම පිළිබඳ විස්තර ද මෙම තොරතුරුවලට ඇතුළත් කර තිබිණි මෙම ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශයක් සහ එම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් කර ඇති මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ. 2019 දී එය ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 10 ක මුළු මුදලක් වෙන් කරනු ලැබී ය.

| ප්‍රධාන ක්‍රියාකාරකම | කාල රාමුව | අයවැය (රු.) |
|---|---|---|
| සහන සහ පුනරුත්ථාපනය පිළිබඳ නිශ්චිත පියවර ද ඇතුළත් වන පරිදි ආපදා කළමනාකරණයේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහතික කිරීම සඳහා පවතින යාන්ත්‍රණයන් සමාලෝචනය කිරීම | 2019 අග | මිලියන 0.5 |
| ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා ගම් මට්ටමින් ආපදා කළමනාකරණ අනුකමිටු ශක්තිමත් කිරීම | 2019 ජන- මාර් | මිලියන 1.5 |
| ගලවා ගැනීමේ මෙහෙයුම්වලදී ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙන් ළමුන් සහ නව යොවුන් වියේ දරුවන් ආරක්ෂා කිරීම සඳහා යාන්ත්‍රණ සකස් කිරීම සහ අදාළ බලධාරීන්ට වගකීම පැවරීම | 2019 ජන- මැයි | මිලියන 1.5 |
| පොලිසිය, පරිවාස, සෞඛ්‍ය යනාදි සිවිල් ආරක්ෂක ආයතන සඳහා අඛණ්ඩ සේවා සැලැස්මක් සකස් කිරීම | 2019 ජන- ජූනි | මිලියන 2.5 |
| ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙන් දිවි ගලවා ගත් අය සහ අවදානම් කණ්ඩායම් වෙත ප්‍රජනක සෞඛ්‍ය සේවා සැපයීම | 2019 ජන- ජූනි | මිලියන 4.0 |

## ලැබුණු තොරතුරු පිළිබඳ අදහස්

මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ඇගයීමේදී, වෙන් කරන ලද ප්‍රත්පිදනවල වාර්ෂික වර්ධනය සියයට 0 සිට සියයට 10 අතර පැවතීම දුර්වල ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදි. සියයට 10 ට වැඩි වර්ධනයක් ශක්තිමත් ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදි.

12.1

2018 සඳහා හෝ 2020 සඳහා හෝ රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් වෙන් කරන ලද ප්‍රතිපාදන පිළිබඳ වැඩිදුර තොරතුරු මුදල් අමාත්‍යාංශය විසින් ලබා දී නොමැත.

12.2

කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙතින් ලැබුණු තොරතුරුවල 2018, 2019 හෝ 2020 තුළ මෙම වැඩසටහන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන පිළිබඳව වෙන් වෙන් වශයෙන් විස්තරයක් ඇතුළත්ව නොතිබිණි

මීට අමතරව, මුදල් අමාත්‍යාංශය සහ කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙතින් මෙවර ලැබුණු ප්‍රතිචාරයන් ද මෙම ඇගයීම මීට පෙර වසර (2021) සඳහා සිදු කිරීමේදී ලැබුණු ප්‍රතිචාරයන් හා සර්වසම විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2020 වසර තුළ

12.2

තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් කාන්තා සහ ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ප්‍රකාශ කරන ලද්දේ 2018/2019 සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 12 සාක්ෂාත් කරගැනීම පිණිස ව්‍යාපෘති 25ක් ක්‍රියාත්මක කළ බවයි. තොරතුරු ලබාගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් මුදල් අමාත්‍යාංශය විසින් ද මෙම තොරතුරු ලබා දී ඇත. එම ව්‍යාපෘති නම්:

1. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් වූ ප්‍රචණ්ඩත්වය අවම කිරීමේ වැඩසටහන
2. ළමා අපයෝජන අවම කිරීම සඳහා ඒකාබද්ධ කලාපීය ළමා ආරක්ෂණ ක්‍රියාකාරී සැලැස්ම
3. ළමා ලිංගික සූරාකෑම පිටුදැකීම සම්බන්ධයෙන් දැනුවත් කිරීම
4. ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ අදාළ සේවාවන් සඳහා ප්‍රතිචාර දැක්වීම සහ එම සේවාවන් අතර වඩා හොඳ සම්බන්ධීකරණයක් ගොඩනැඟීම වෙනුවෙන් පවත්නා යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා වැඩසටහන
5. කාන්තා රැකවරණ නිවාස නඩත්තු කිරීම සඳහා වූ චර්යා ධර්ම පද්ධතිය
6. ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ ව්‍යාපෘති
7. පාසල් විෂයමාලාවට පුරවැසිභාවය සංවර්ධනය කිරීම සහ ලිංගික අධ්‍යාපනය ආශ්‍රිත මාතෘකා ඇතුළත් කිරීම
8. පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීම හා ශක්තිමත් කිරීම
9. "ජන පවුර" ළමා ආරක්ෂණ වැඩසටහන
10. වතුකරයට සම්බන්ධ ළමුන්ට සහ ප්‍රජාවට ආරක්ෂාව සැලසීම
11. වෙරළ කලාපය ආශ්‍රිත මනෝ සමාජීය මැදිහත්වීම
12. අඩු වයස් ගැබ් ගැනීම් වැළැක්වීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
13. ගුරුවරුන් පුහුණු කිරීම
14. විදුහල්පතිවරුන් දැනුවත් කිරීම
15. පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම
16. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිකයන් සහ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම
17. පශ්චාත් උපාධි ආයතනයේ වෛද්‍යවරුන් සඳහා පුහුණුව
18. ළමා නිවාස කළමනාකරණ අධිකාරිය සහ කාර්ය මණ්ඩල පුහුණුව
19. ළමුන්ට එරෙහි සයිබර් අපරාධවලට එරෙහිව සටන් කිරීම සඳහා IEC ප්‍රකාශන සකස් කිරීම

ප්‍රගතිය ඇගයීම වෙනුවෙන් නව තොරතුරු කිසිවක් ලැබී නැත.

කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ අන්තර්ජාල අඩවියේ පළ කර ඇති 2020 ප්‍රගති වාර්තාව තුළින් මාර්ගගතව ලබා ගත හැකි තොරතුරු ඔස්සේ මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකයට සම්බන්ධ "ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම පසු විපරම් කිරීම" නම් ව්‍යාපෘතියට අදාළ මූල්‍ය ඉලක්කය පමණක් ලබා දී තිබිණි

එබැවින්, මෙම ව්‍යාපෘති සඳහා කාලයත් සමග ප්‍රතිපාදන වෙනස් වී ඇති ආකාරය තීරණය කළ නොහැකි බැවින්, එම ලබාගත් තොරතුරු ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 12 හි ප්‍රගතිය ඇගයීමේලා ප්‍රමාණවත් නොවන අතර අසම්පූර්ණ ද වේ.

එබැවින්, මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශකය **තොරතුරු අනාවරණය කර නොමැති දර්ශකයක්** ලෙස වර්ගීකරණය කර ඇත.

20. ළමා ශ්‍රමයට එරෙහි ජාතික දිනය සැමරීම

21. ගැහැණු දරුවාගේ ජාත්‍යන්තර දිනය සැමරීම

22. විශේෂ විමර්ශන නඩු අධීක්ෂණය සහ අධිකරණ කටයුතු

23. වීඩියෝ සාක්ෂි පටිගත කිරීම යටතේ වින්දිත දරුවන්ට පහසුකම් සැලසීම

24. වීඩියෝ සාක්ෂි පටිගත කිරීම යටතේ නඩත්තු කිරීම සහ අනෙකුත් ක්‍රියාකාරකම්

25. අන්තර්ජාල නිරීක්ෂණ යටතේ විමර්ශන සිදු කිරීම

2018/2019 කාලය තුළ මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 32.91ක මුදලක් වැය වී ඇති බව ද ප්‍රතිචාරයේ සඳහන් විය.

කාර්ය සාධන දර්ශකය 12 සම්බන්ධයෙන් ක්‍රියාවට නංවන ලද ව්‍යාපෘති පිළිබඳ විස්තර, කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ අන්තර්ජාල අඩවිය තුළින් ලබා ගත හැක විය. එම තොරතුරු 2019 සහ 2020 වසරවල ප්‍රගති වාර්තාවලට ඇතුළත් කර තිබූ අතර අමාත්‍යාංශ අන්තර්ජාල අඩවිය ඔස්සේ මාර්ගගතව ඒ වෙත පිවිසීමට හැකි විය.

2020 සඳහා වන ප්‍රගති වාර්තාව ඔස්සේ අනාවරණය කර තිබූ පරිදි "ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම පසු විපරම් කිරීමේ" ව්‍යාපෘතිය වෙනුවෙන් එම වසර සඳහා රු. මිලියන 0.08 ක් වෙන් කර ඇත.

## ඇමුණුම 3

ජාතික අයවැය දෙපාර්තමේන්තුව
தேசிய வரவு செலவுத்திட்ட திணைக்களம்
**DEPARTMENT OF NATIONAL BUDGET**

මහා භාණ්ඩාගාරය, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව
பொதுத்திறைசேரி, நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு, கொழும்பு 01, இலங்கை
General Treasury, Ministry of Finance and Mass Media, Colombo 01, Sri Lanka
**Web Site:** www.treasury.gov.lk **e-mail:** budget@nbd.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No. BD/CBP/4/1/2-2018 — ඔබේ අංකය / உமது இல. / Your No. — දිනය / திகதி. / Date 31.07.2017

All Secretaries to Ministries
Chief Secretaries of Provincial Councils
Heads of Departments
Chairmen of Corporations and Statutory Boards

**Addendum (II) to the Budget Call – 2018**
**Guidelines for the Preparation of 2018 Budget Estimates**

This is further to the National Budget Circular no 2/2017 dated 25.07.2017 on "guideline and directions for the preparation of Annual Budget Estimates". In this addendum, it is expected to give further direction in mainstreaming the three new policy strategies accepted by the government.

1. Sustainable Development Goals
2. Gender Response Budgeting
3. Empower Differently able People

**(1.) Sustainable Development Goals**

1.1 Sri Lanka as a member state of the United Nations, is a signatory to the adaption of 2030 Agenda for Sustainable Development, which comprises of 17 Goals and 169 Targets and 244 indicators. The Sustainable Development Goals (SDGs) aim to end poverty, hunger and inequality, protect environment, improve access to health and education, build peace, justice and strong institutions etc. Achievement of these Sustainable Development Goal (SDG) targets should directly be linked with budgeting, i.e. allocation of resources for identified projects and programmes. Therefore, it is expected to align SDGs with the national development strategy from 2018. A select Committee of Parliament on the United Nations 2030 Agenda for Sustainable Development has also been set up to facilitate and monitor the achievement of the goals and targets.

1.2 Therefore, the spending agencies are directed for mainstreaming the SDG goals within the current and future development activities and aligning with the annual budget. The main objective of this process is to identify and localize the global agenda of SDG, which particularly relevant to the spending agency and focus on development strategies that directly support to achieving the targets of such SDGs.

1

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 0094-11-2484665, 0094-11-2484639 (Fax)
කාර්යාලය / அலுவலகம் / Office: 0094-11-2484669, 0094-11-2484853
ෆැක්ස් අංකය / தொலைநகல் இல / Fax No.: 0094-11-2484807

1.3 The Ministry of Sustainable Development and Wildlife will facilitate respective Ministries in achieving the SDG targets and supervision of the 2030 Agenda. The Department of National Planning will ensure the integration of SDGs and targets into the National Development Framework and the line ministries are responsible to incorporate those when designing the development programs and projects.

1.4 The Department of Census and Statistics is also involved in supporting the implementation of SDGs to ensure that SDG are achieved at the end of 2030. In localizing the SDG indicators which relates to respective Ministries/ Departments and other Institutions may refer the "Status of Sustainable Development Goals Indicators in Sri lanka: 2017" published by the Department of Census and Statistics.

**(2.) Gender Response Budgeting**

2.1 The SDG goal 5 is to achieve gender equality and empower all women and girls. Since, the women and girls represent more than half of the total population in Sri Lanka, gender equality to be ensured when allocating resources wherever possible. Accordingly, the KPIs developed by the Ministry of Women and Child Affairs is in annexure 1 for consideration by the Ministries when preparing the budget estimates and indicate the KPIs that is expected to be achieved in 2018.

2.2 As per the approval of the Cabinet of Ministers on 07.06.2016 the Plan of Action to address sexual and gender based violence in Sri Lanka to be implemented under the medium term budgetary framework from 2017-2019. Main objective of this action plan is "violence free life for women and children". As this plan covers multi sectoral implementation, the secretaries of relevant line ministries are required to take necessary actions to adhere to the plan.

**(3.) Empower Differently able People**

3.1 Mainstreaming differently able people would be another major area that is also to be addressed in 2018 Budget. The Cabinet of Ministers has already directed to implement the "Sri Lanka National Action Plan for Disability" which has been prepared based on the National Policy on Disability and designed for implementation of 7 thematic areas namely, Empowerment, Health and Rehabilitation, Education, Work and Employment, Mainstreaming and Enabling Environment, Data and Research and Social Institutional Cohesion. In line with the Government Policy and the Action Plan all spending agencies are required to identify focus areas and relevant activities on empowering the differently able community and mobilizing them as an equally useful segment of the society.

(4) As the 2018 budget will be formulated based on the Performance Based Budgeting, you are kindly requested to consider the above when requesting resources for achieving measurable outputs / outcomes.

(5) If you need any clarifications on the above, please contact the relevant subject officer of the Department of National Budget.

K.D.S. Ruwanchandra
Director General

Copies to:

I. Secretary to the President
II. Secretary to the Prime Minister
III. Secretary to the Cabinet of Ministers
IV. Auditor General

Annexure 01

## KPIs to Achieve Gender Equality & Empower All Women & Girls

1) Increased % of Women Participation in Labour Force.

2) Increased number of female headed Households that have built houses through financial assistance programs.

3) Number of Public Institutions that have maintain Gender Disaggregated Data System.

4) Increased % of females who obtain NVQ certification and number enter in to employment in technical vocational field.

5) Number of female entrepreneurs engage in sustainable enterprises utilizing SME loans /subsidies.

6) Number of national policies and projects aimed at employing the female migrant returnees and potential migrant female.

7) Increased number of females in decision making positions attained through policy interventions.

8) Number of Institutions that have taken measures to improve gender friendly working environment and day care facilities etc.

9) Number of policies and guidelines are in placed and effectively implemented to ensure gender concerns are addressed in rescue, relief, rehabilitation and reconstruction stages of disasters.

10) Number of Women and Children Bureau units of police stations are capacitated to handle women and children issues in a sensitive and effective manner.

11) Number of gender discriminatory laws, policies and procedures that are amended, enacted and / or implemented.

12) Amount of allocation made to complement Multi Sectoral National Action Plan to address Sexual and Gender Based Violence.

## ඇමුණුම 4

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය
திறன்கள் அபிவிருத்தி, தொழிற் கல்வி, ஆராய்ச்சி மற்றும் புத்தாக்க இராஜாங்க அமைச்சு
State Ministry of Skills Development, Vocational Education, Research & Innovation

| | | | |
|---|---|---|---|
| මගේ යොමුව / எனது இல. / My Ref. | MSVRI/ADM/04/03/Info.act/2021 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | |
| දිනය / திகதி / Date | 2021.01.19 | | |

ලියාපදිංචි අංක: MSVRI/ADM/04/03/Info.act/2021 – 97, 98

වෙරිටේ රිසර්ච් ( ප්‍රයිවට ) ලිමිටඩ්
නො. 5ඒ, පිටත පොලිස් උද්‍යාන මාවත,
කොළඹ 05.

**<u>2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත අනුව තොරතුරු ලබාදීම</u>**

ඔබ විසින් යොමු කරන ලද 2021.10.18, 2021.11.08 දිනැති තොරතුරු ලබා ගැනීමේ අයදුම්පත්‍ර මඟින් විමසීම් කර ඇති කරුණු සම්බන්ධයෙන් අදාල අංශ වෙතින් තොරතුරු කැඳවීම් කර ඇති බැවින් ඊට අදාලව අප වෙත පිළිතුරු ලද වහාම ඔබ වෙත පනතේ විධිවිධාන ප්‍රකාරව පිළිතුරු යොමු කිරීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

**ජී.එස්. කන්නන්ගර**
තොරතුරු නිලධාරි / අධ්‍යක්ෂ (ආංශික සංවර්ධන)
ලේකම් වෙනුවට

නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන අංශය
திறன்கள் அபிவிருத்தி மற்றும் தொழிற் கல்வி பிரிவு
Skills Development & Vocational Education Division
354/2, "නිපුණතා පියස" ඇල්විටිගල මාවත, කොළඹ 05
354/2, "நிபுணதா பியச" எல்விட்டிகல மாவத்தை, கொழும்பு 05
354/2, "Nipunatha Piyasa", Elvitigala Mawatha Colombo 05
කාර්යාලය / அலுவலகம் / Office
(+9411)2136500
(+9411)2597804
info@skillsmin.gov.lk
www.skillsmin.gov.lk

පර්යේෂණ හා නව නිපැයුම් අංශය
ஆராய்ச்சி மற்றும் புத்தாக்க பிரிவு
Research & Innovation Division

ඇමුණුම 5

ජාතික අයවැය දෙපාර්තමේන්තුව
தேசிய வரவு செலவுத்திட்ட திணைக்களம்
DEPARTMENT OF NATIONAL BUDGET

මුදල් අමාත්‍යාංශය நிதி அமைச்சு Ministry of Finance

මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව பொதுத்திறைசேரி, கொழும்பு 01, இலங்கை General Treasury, Colombo 01, Sri Lanka

මගේ අංකය / எனது இல. / My No. BD/ADM/01/04/01/2021
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி. / Date 16/11/2021

Veritae Research (Pvt) Ltd
No. 5A, Police Park Place, (Off Police Park Avenue)
Colombo 05

**Application to receive information under the Right to Information Act No. 12 of 2016**

This refers to your Right to Information Application dated 18/10/2021 and the forwarding letter sent by the Ministry of Finance on 27/10/2021.

Accordingly, the details are submitted herewith for the information requested no. 5. (1) to 5. (7) of the above letter.

i. No. 1, 3, 4, 5, 6 and 7 – As per the Budget Circular 2/2019 Gender disaggregated data to be maintained by each Ministry and those information to be submitted to the Ministry of Women and Child Affairs. Therefore, such information to be obtained from the State Ministry of Women and Child development, Pre-School & Primary Education, School Infrastructure & Education Services.

ii. No. 2 – Details attached

G.M.J.K. Gunawardhana
Information Officer- RTI
Additional Director General

Copy: Addl. Secretary / Information Officer,
Ministry of Finance

## ඇමුණුම 6

කම්කරු දෙපාර්තමේන්තුව
தொழில்திணைக்களம்
DEPARTMENT OF LABOUR
සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය
திட்டமிடல், ஆராய்ச்சி,பயிற்சி மற்றும் பிரசுரிப்புகள் பிரிவு
Planning, Research, Training and Publication Division

මගේ අංකය / எனது இலக்க / My Number } PRT/04/08/2021 (II වෙළුම)
ඔබේ අංකය / உமது இலக்கம் / Your Number } ML/ES/04/තොර.දැන.-1
දිනය / திகதி / Date } 2021.11.03

True Copy

03 NOV 2021

ලේකම්
කම්කරු අමාත්‍යාංශය

**2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ සඳහන් පරිදි තොරතුරු ඉල්ලා සිටීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ සමාංක හා 2021.10.22 දිනැති ලිපිය හා බැදේ.

02. ශ්‍රම බලකායෙහි කාන්තා දායකත්වය වර්ධනය කිරීමෙහිලා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ මූලික අරමුණු හා අභිප්‍රායන්ගෙන් බැහැර වූවක් මෙන්ම විෂය පරයෙන් ඔබ්බෙන් වූ කරුණකි. නමුත්, පෞද්ගලික අංශයේ සේවයේ නියුතු කාන්තාවන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය හා සුභසාධනය උදෙසා කම්කරු දෙපාර්තමේන්තුවේ කාන්තා හා ළමා කටයුතු අංශය විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර, එම වැඩසටහන් තුළින් ශ්‍රම බලකායෙහි කාන්තා දායකත්වය වර්ධනය කිරීමෙහිලා වක්‍රාකාර දායකත්වයක් සැපයේ.

03. ඒ අනුව, 2018, 2019 හා 2020 වර්ෂ තුළ ශ්‍රම බලකාය සඳහා කාන්තා දායකත්වයේ ප්‍රතිශතය සහ ශ්‍රම බලකාය වෙත දායකත්වය සපයන කාන්තා සේවිකාවන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය හා සුභසාධනය උදෙසා කම්කරු දෙපාර්තමේන්තුව විසින් 2018, 2019 සහ 2020 වර්ෂයන් තුළ දී සිදු කරන ලද විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ විශේෂ පරීක්ෂණ සම්බන්ධයෙන් තොරතුරු ඇමුණුම 01 මගින් ඉදිරි කටයුතු සඳහා මේ සමඟ කාරුණිකව ඉදිරිපත් කරමි.

බී කේ ප්‍රභාත් චන්ද්‍රකීර්ති
කම්කරු කොමසාරිස් ජනරාල්

ඒ.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති
කම්කරු කොමසාරිස් ජනරාල්
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05

International Year for the elimination of Child Labour 2021
"Let's continue to fight against child labour"

10 වන මහල, "මෙහෙවර පියස" ගොඩනැගිල්ල, කොළඹ 05.
10ஆம் தளம், "மெஹெவர பியெச" கட்டிடம், கொழும்பு 05.
10th Floor, "MehewaraPiyesa" Building, Colombo 05.

දුරකථන } 011-2582647 ෆැක්ස් } 011-2504208 ඊ-මේල් } prtdivisiondol@gmail.com වෙබ් අඩවිය } www.labourdept.gov.lk

# පරිච්ඡේදාන්ත සටහන්

1 ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අන්තර්ජාල අඩවියග 'ඕවර්විව් ඔෆ් ජෙන්ඩර්-රෙස්පොන්සිව් බජට් ඉනිෂියටිව්ස්රැ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය ආශ්‍රිත ක්‍රියාකාරකම් පිළිබඳ දළ විශ්ලේෂණය [Overview of Gender-responsive Budget Initiatives]' https://www.ilo.org/wcmsp5/groups/public/—-dgreports/—-gender/documents/publication/wcms_111403.pdf. (අවසන් වරට පිවිසීමඃ 2022 පෙබරවාරි 25)

2 එක්සත් ජාතීන්ගේ කාන්තා අන්තර්ජාල අඩවිය. 'ගයිඩ්ඃ ෆො ජෙන්ඩර්-රෙස්පොන්ව් බජටින් ෆැසිලිටේටර්ස්/ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය ක්‍රියාත්මක කරන්නන් සඳහා මාර්ගෝපදේශය [Guide( For Gender-Responsive Budgeting Facilitators]' ^2016&. https://www2.unwomen.org/-/media/field%20office%20africa/attachments/publications/2016/03/guide%20bsg%20-%20anglais%20-%20final.pdf (අවසන් වරට පිවිසීමඃ 2022 පෙබරවාරි 25)

3 ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අන්තර්ජාල අඩවියග 'ඕවර්විව් ඔෆ් ජෙන්ඩර්-රෙස්පොන්සිව් බජට් ඉනිෂියටිව්ස්රැ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය ආශ්‍රිත ක්‍රියාකාරකම් පිළිබඳ දළ විශ්ලේෂණය [Overview of Gender-responsive Budget Initiatives]' https://www.ilo.org/wcmsp5/groups/public/—-dgreports/—-gender/documents/publication/wcms_111403.pdf. (අවසන් වරට පිවිසීමඃ 2022 පෙබරවාරි 25)

4 ස්ටොට්ස්කි. 'යූසිං ෆිස්කල් පොලිසි ඇන්ඩ් පබ්ලික් ෆයිනෑන්ෂල් මැනේජ්මන්ට් ටු ප්‍රමෝට් ජෙන්ඩර් ඊක්වොලිටි: ඉන්ටර්නැෂනල් පර්ස්පෙක්ටිව්ස්/ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය උපයෝගී කරගැනීම: ගෝලීය අදහස්. [Using Fiscal Policy and Public Financial Management to Promote Gender Equality: International Perspectives]' (2020). https://www.internationallawyersproject.org/post/using-fiscal-policy-and-public-financial-management-to-promote-gender-equality (අවසන් වරට පිවිසීම 2022 පෙබරවාරි 25)

5 වත්මන් කාන්තා සහ ළමා සංවර්ධන පෙර පාසල් ප්‍රාථමික අධ්‍යාපන පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය

6 එක්සත් ජාතීන්ගේ අන්තර්ජාල අඩවිය තිරසර සංවර්ධන ඉලක්ක" 5 වන ඉලක්කයඃ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සාක්ෂාත් කිරීම සහ සියලුම කාන්තාවන් සහ ගැහැණු දරුවන් සවිබල ගැන්වීමග https://sdgs.un.org/goals/goal5 (අවසන් වරට පිවිසීම 2022 මාර්තු 1)

7 පළමු වර්ෂය සඳහා කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමුකරන ලද තොරතුරු දැනගැනීමේ ඉල්ලීමකට ලැබුණු ප්‍රතිචාරයකට අනුව 2018/2019 වසර සඳහා මුළු වියදම.

8 කාන්තා හා ළමා කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේ අන්තර්ජාල අඩවියේ ඇති ප්‍රගති වාර්තාවන් තුළ 209 සහ 2020 සඳහා ලබා දී ඇති මූල්‍ය ප්‍රතිපාදන එකතු කිරීමෙන් මුළු වියදම ගණනය කර ඇතග දෙවන වසරේදී තොරතුරු ලබා ගැනීමේ ඉල්ලීමට ප්‍රතිචාර ලෙස ලැබුණු තොරතුරු තුළ වෙන් වෙන් වශයෙන් ප්‍රතිපාදන දක්වා නොතිබීම මීට හේතුවයි. http://www.childwomenmin.gov.lk/action-plans/ministry-action-plans/progress-2017 (අවසන් වරට පිවිසීම 2022 අප්‍රේල් 2)

9 සීමාවන් පිළිබඳ විස්තර සඳහා ඇගයීමේ ක්‍රමවේදය බලන්න

10 මේ පිළිබඳ වැඩි විස්තර සඳහා ඇමුණුම  බලන්න.

11 කාන්තා සහ ළමා සංවර්ධන" පෙර පාසල්" ප්‍රාථමික අධ්‍යාපනය පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය

12 නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපනය, පර්යේෂණ සහ නව නිපැයුම් අමාත්‍යාංශය විසින් තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ එවන ලද ප්‍රතිචාරය සඳහා ඇමුණුම 4 බලන්න

13 මුදල් අමාත්‍යාංශය වෙතින් ලැබුණු ප්‍රතිචාරය සඳහා ඇමුණුම 5 බලන්න

14 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත තුළ මෙසේ සඳහන් වේ: "මේ පනතේ 5 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව පොදු අධිකාරියක සන්තකයේ" භාරයේ හෝ පාලනයේ ඇති තොරතුරුවලට ප්‍රවේශ වීමේ අයිතිවාසිකම් සෑම පුරවැසියෙකුටම තිබිය යුතු යග"

15 වෙරිටේ රිසර්ච්. අ රැෂනවල් මෙතඩ් ෆො කැබිනට් ෆෝමේෂන් ඉන් ශ්‍රී ලංකාඃ අ වයිට් පේපර්/ ශ්‍රී ලංකාව තුළ කැබිනට් පත්වීම් ලබා දීම වෙනුවෙන් තාර්කික ක්‍රමවේදයක් : ධවල පත්‍රිකාවකි [A Rational Method for Cabinet Formation in Sri Lanka: A White Paper] ^wf.daia;= 2020&" https://www.veriteresearch.org/publication/cabinet-white-paper-sri-lanka

16 කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේ අන්තර්ජාල අඩවිය" 'ජෙන්ඩර් බජටින් ෆො ෆියුචර් බජට් ප්ලෑනිං/අනාගත අයවැය සැලසුම්කරණය සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය [Gender Budgeting for Future Budget Planning]' http://www.childwomenmin.gov.lk/storage/app/media/cir%20sgbv%20-compressed.pdf (අවසන් වරට පිවිසීම 2022 අප්‍රේල් 7)

17 PublicFinance.lk අන්තර්ජාල අඩවිය 'බජට් ප්‍රොමිසස්ඃ බියොන්ඩ් පාලිමන්ට්" 2018 එන්ඩ් ඉයර් ඇසස්මන්ට්/ අයවැය පොරොන්දුඃ පාර්ලිමේන්තුවෙන් එහා" 2018 වසර අවසාන ඇගයීම [Budget Promises: Beyond Parliament, 2018 End Year Assessment]' https://dashboards.publicfinance.lk/budget-promises/wp-content/uploads/2021/10/Budget-Promises-2018-End-Year-English-1.pdf (අවසන් වරට පිවිසීම (just for consistency) 2022 අප්‍රේල් 7)

18 2020 තුළ රජයේ සැලසුම් සහ අයවැය ක්‍රියාකාරකම් කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇතැම් අඩපණ වන්නට ඇති බව සැලකිල්ලට ගත යුතු වැදගත් කරුණකි. මෙය ප්‍රධාන කාර්ය සාධන දර්ශකයේ ප්‍රගතිය කෙරෙහි බලපාන ලද කරුණක් විය හැක.

19 තොරතුරු ලබාගැනීමේ ඉල්ලීම සඳහා කම්කරු අමාත්‍යාංශය වෙතින් ලැබුණු ප්‍රතිචාරය සඳහා ඇමුණුම 6 බලන්න

ISBN: 978-624-5114-26-7

A | No. 5A, Police Park Place, Colombo 5
T | +94 11-2055544
E | reception@veriteresearch.org
W| www.veriteresearch.org